
dinamina.lk

@dinaminanews

# දිනමිණ

The Dinamina

1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත




ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ බිනර අව පෑළවිය ලත් බුධ දින | කාණ්ඩය 111 පත්‍රය 221 පිටු 32 මිල රු.30 web: www.dinamina.lk ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | වර්ෂ 2020ක් වූ සැප්තැම්බර් මස 02 වැනිදා බදාදා

## රට වෙනුවෙන් මා කාර්යබහුලයි

### ජනපතිගෙන් කාරුණික ඉල්ලීමක්

ජාතික වගකීම් සපුරාලීම සඳහා කාලය වැය කිරීමේදී උත්සව, ත්‍යාග ප්‍රදාන මෙන්ම විවාහ මංගල්‍ය හා සාද වැනි පෞද්ගලික අවස්ථාවන්ට සහභාගි වීමට කාලය නැති නිසා එවැනි අවස්ථා සඳහා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ආරාධනා නොකරන්නැයි සියලු දෙනාගෙන් කාරුණික ඉල්ලීමක් කෙරේ.

ජනතා යහපත උදෙසා රජයේ සංවර්ධන ව්‍යාපෘති කඩිනම් කිරීමට සහ බිම් මට්ටමේ ජනතා ගැටලු විසඳීමට ජනාධිපතිවරයා සිය දෛනික නිල කාර්යයන්ට අමතරව ප්‍රමුඛත්වය දී තිබේ. ජනාධිපතිවරයා සිය කාලය තමාගේ කාලය පූර්ණ වශයෙන් ජනතාවගේම අභිවෘද්ධිය පිණිස කැප කිරීමත්, ජනාධිපති කාර්යාලය දියත් කරන ක්‍රියාදාමයන් මෙහෙයවීමට නායකත්වය සැපයීමත් නිසා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සහභාගිත්වය අපේක්ෂා කරන පාර්ශ්වයන්ගෙන් මේ ඉල්ලීම කරන බව ජනාධිපති මාධ්‍ය අංශය අවධාරණය කරයි.

### පෞද්ගලික උත්සවවලට ආරාධනා කරන්න එපා



## රේගුවේ ඇස වසා

# කෝටි ගණනක වාහන ගෙන්වූ ජාවාරමක් හෙළි වෙයි

### සැක දෙදෙනෙක් අත්අඩංගුවට | ප්‍රධානියා අල්ලන්න මෙහෙයුම්

සුභාෂිණී සේනානායක

රේගුවට ගෙවිය යුතු තීරු බදු නොගෙවා වාහන කොටස් ගෙන්වන මුවාවෙන් රුපියල් කෝටි ගණනක් වටිනා වාහන ගෙන්වීමේ මහා පරිමාණ ජාවාරමක් පැලියගොඩ අපරාධ කොට්ඨාසය විසින් ඊයේ (01) අනාවරණය කරගෙන තිබේ.

පොලීසියට ලැබුණු තොරතුරක් මත සිදු කළ වැටලීමකදී සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන ඇති අතර, වාහන අංගණයේ තිබී වාහන කිහිපයක්ද පොලිස් බාරයට ගෙන ඇත.

මේ ජවාරම පිටුපස සිටින මහ මොළකරු අත්අඩංගුවට ගැනීමට පරීක්ෂණ ආරම්භ කර ඇති අතර, සිද්ධිය සම්බන්ධයෙන් තිනිගම චන්ද්‍රන සහ වාහන බට් කළ බව කියන උඩුගම්පොළ දයාසිරි ලයනල් යන පුද්ගලයන් දෙදෙනා ඊයේ (01) පොලිස් බාරයට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් තිනිගම චන්ද්‍රන නැමැත්තා රඳවා ගෙන ප්‍රශ්න කිරීමට අධිකරණයෙන් අවසර ලබා ගත්තා බවත් අනෙක් සැකකරු අධිකරණයට ඉදිරිපත් කරන බවත් පොලිස් අපරාධ කොට්ඨාසය පවසයි. පිට 02

# විගණන කොමිසම සුදු අලියෙක්

# අවුරුදු 5ට කෝටි 232ක් ගිලලා

### බොරැල්ලේ කාර්යාලයේ නඩත්තුවට මසකට මිලියන 40ක්

යහපාලන ආණ්ඩුවෙන් ස්ථාපිත කළ ජාතික විගණන කොමිසම මෙතෙක් ක්‍රියාත්මක වී නැතත් එය නඩත්තු කිරීම සඳහා පසුගිය වසර 05කට ආසන්න කාලය තුළ රුපියල් කෝටි 232ක් වියදම් කර ඇතැයි වාර්තා වේ.

බොරැල්ලේ පිහිටි ජාතික විගණන කොමිසමේ කාර්යාලය ආරම්භ කර ඇත්තේ 2015 වර්ෂයේ වන අතර, එය නඩත්තු කිරීම සඳහා මාසිකව රුපියල් මිලියන 40ක පමණ මුදලක් වියදම් වන බව කියනු ලැබේ.

මේ කාර්යාලය මෙතෙක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත්තේ ජාතික විගණන සේවාව තවමත් රට තුළ ක්‍රියාත්මක නොවීම නිසා බවත් විගණන පනත සම්මත වී මාස තුනක් ඇතුළත විගණන සේවාව පිහිටු වන බව කියා සිටියත් මේ වන තුරුත් එය කළ නොහැකි වී ඇතැයි විගණන සේවා නිලධාරීන්ගේ සංගමයේ ප්‍රධාන ලේකම් ඩබ්ලිව්. ජේ. සී. තිසේරා මහතා පැවසීය. පිට 02

## රනිල්ගෙන් පසු එජාප නායකත්වයට කරු පත් විය යුතුයි

### එක්සත් වෘත්තීයවේදීන්ගේ සංගමයේ සභාපති

ශිරෝමි අබයසිංහ සහ මැද කොළඹ සමූහ ආරියරත්න ගනේගොඩ

පිට 02

## රට පැන්න අපරාධකරුවන් අල්ලන්න රතු නිවේදන

මහින්ද අලුත්ගෙදර

විදේශ රටවල සැඟවී සිටින සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයන් ඇතුළු මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් 14 දෙනකු අත්අඩංගුවට ගැනීමට අදාළ රතු නිවේදන නිකුත් කර තිබෙන බව පොලීසිය අවධාරණය කරයි. පිට 02

## 20 වැනි සංශෝධනය නීතිපතිට යවයි



### 19යේ කරුණු 2ක් හැර සියල්ල සංශෝධනයට නියමිතයි

රෝෂන් තුෂාර

ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය, ප්‍රජාතන්ත්‍රවාදය හා ඒකීයත්වය සුරකින විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ මතය ඉදිරිපත් වූ වහාම කැබිනට් අනුමැතිය ලබාගන්නා බව අධිකරණ ඇමැති ජනාධිපති නීතිඥ අලි සබ්රි මහතා ඊයේ (01) පැවසීය. පිට 02

## සමගි ජන බලවේගයට නායකත්ව මණ්ඩලයක් පත් කරන්න



පිට 02

## යහපාලන ආණ්ඩුවේ ප්‍රබලයන්ගේ මත්පැන් ගුදමකට මුද්‍රා තබයි

සුභාෂිණී සේනානායක

යහපාලන රජයට සම්බන්ධ ප්‍රබල දේශපාලනඥයන් කිහිප දෙනකුගේ මැදිහත් වීමෙන් මෙරටට ගෙන්වන ලැදැයි සැක කෙරෙන මත්පැන් තොගයක් අඩංගු ගුදමකට රේගු දෙපාර්තමේන්තුව විසින් ඊයේ (01) මුද්‍රා තබා ඇත. මේ ගුදමේ තැන්පත් කර ඇති බව කියන ආනයනික මත්පැන් තොගයක් ප්‍රතිඅපනයන කිරීම සඳහා වත්තල ප්‍රදේශයේ ඇති බව කියන තවත් ගුදමකට රැගෙන යමින් තිබියදී ලද තොරතුරක් මත මේ මුද්‍රා තැබීම සිදු කළ බව රේගුව පවසයි. පිට 02

## මන්ත්‍රීවරයකුගේ කෑම වේලක වියදමේ හරි තොරතුරු ලබන සතියේ මැතිසබයට

ස්වර්ණා විජේකෝන්

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ කෑම වේලක් සඳහා වැය වන මුදල සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ලබන සතියේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත වේ. පිට 02

## උද්භිද උද්‍යාන සංවර්ධනයට ලක්ෂ 720ක්

මහින්ද අලුත්ගෙදර

සංචාරක ආකර්ෂණය තව දුරටත් ඉහළ නංවමින් ශ්‍රී ලංකාවේ පිහිටි උද්භිද උද්‍යාන සංවර්ධනය සඳහා රුපියල් ලක්ෂ 720ක මුදලක් වෙන් කිරීමට රජය තීරණය කරයි. පිට 02

## ඇමැති සාකච්ඡා පල දරයි

## චීන මැදිරි සහිත දුම්රිය සතියක් යන තුරු ධාවනයට එකඟතාව

නිමල් රාජපක්ෂ

තාක්ෂණික වශයෙන් පැන නගින යාන්ත්‍රික ගැටලු පිළිබඳ වගකීම පදනම් කරගෙන චීන මැදිරි සහිත දුම්රිය ධාවනයෙන් පෙරේද (31) මධ්‍ය රාත්‍රියේ සිට ඉවත් වූ ලොකොමෝටිව් ඔපරේටිං ඉංජිනියරින් රියැදුරු සංගමයේ නිලධාරීන් ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ මහතාගේ ඉල්ලීම මත ඊයේ (01) දහවල් සිට යළි දුම්රිය ධාවනයට එකඟ වී තිබේ. පිට 02

## එජාපයේ චූදිතයන්ට සජිත් පිලේ ඉඩක් නෑලු

ශිවන්ති ප්‍රනාන්දු

එක්සත් ජාතික පක්ෂය සමග සන්ධානගත වී ක්‍රියා කිරීමට පසුබෑමක් නොමැති වුවද විවිධ චෝදනාවලට ලක් වී එම පක්ෂයේ සාමාජිකත්වය දරමින් කටයුතු කරන කිසිවකුත් සමගි ජන බලවේගය හා සම්බන්ධ කර නොගැනීමට එම පක්ෂයේ විධායක සභාව තීන්දු කර ඇත.

එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයන් සම්බන්ධ කර ගැනීම පිළිබඳ ඊයේ (01) දිනමිණ කළ විමසීමකදී සමගි ජන බලවේගයේ අභ්‍යන්තර ප්‍රකාශකයකු මේ බව අනාවරණ කළේය. පිට 02

## සුළු වැරදි කළ 444ක් නිදහස ලබති

බුද්ධිකා ඉඹුලාන

සුළු වැරදි සම්බන්ධව බන්ධනාගාරගත කර සිට ජනාධිපති පොදු සමාව හිමි වූ සිරකරුවන් 444 දෙනාම ඊයේ (1) ඔවුන් රඳවා සිටි බන්ධනාගාරවලින් නිදහස ලබා පිටව ගිය බව බන්ධනාගාර මූලස්ථානය කියයි. පිට 02

## රේඩියෝ ගුරුවරයා

### ශිෂ්‍යත්ව පෙරහුරු ප්‍රශ්න පත්‍රය (1-පත්‍රය) අද දිනමිණ සමග

### වරකාගේ සිතුවම




## පොලිස් කතට අයුතු බලපෑම් කළ IP ගේ වැඩ තහනම්

රක්ෂණ ශ්‍රියන්ත

පාණදුර දකුණ පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරියේ නියැළුණු පොලිස් පරීක්ෂකවරයකු පොලිස් කාන්තාවකට අයුතු බලපෑම් කිරීම හේතුවෙන් ඔහුගේ සේවය අත්හිටුවා තිබේ. පිට 02

## ෆෙටෝ ත්‍රස්තයන් 16ක් තවමත් මෙරටින් ගිහින් නෑ

### යහපාලන සමයේ 158ක් ඇවිත්

### ජනපති කොමිසම හමුවේ හෙළි වෙයි

සුභාෂිණී සේනානායක

තුර්කියේ ත්‍රස්ත සංවිධානයක් වන ෆෙටෝ සංවිධානයට සම්බන්ධ මෙරටට පැමිණි සංචාරකයන් 16 දෙනකුගෙන් යුත් පිරිසක් මේ වනවිටත් රටින් පිටව ගොස් නැති බව පෙරේද (31) පාස්කු දින ප්‍රහාරය පිළිබඳ සොයා බැලීම පත් කළ ජනාධිපති කොමිසමේදී හෙළි විය. පිට 02

## 6 සිට 13 තෙක් ශ්‍රේණි ඉගැන්වීම් කටයුතු අද සිට සුපුරුදු පරිදි

සිතාරා සේනානි

සියලු පාසල්වල 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සිසුන්ට අද (02) සිට සතියේ දින පහම සාමාන්‍ය පරිදි පාසල් විවෘත කෙරෙන බවත් පෙරවරු 7. 30 සිට පස්වරු 1. 30 එම පන්ති පැවැත්වෙන බවත් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහන් කරයි. එසේම පළමු ශ්‍රේණියේ සිට පස්වැනි ශ්‍රේණිය තෙක් සිසුන්ට පාසල් යළි විවෘත වන්නේ සැප්තැම්බර් 8 සඳුද බව ද, අධ්‍යාපන අමාත්‍යාංශය ප්‍රකාශ කරයි. පිට 02

දිනමිණ The Dinamina 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත 2 මුල් පිටුව

# පන්දහසේ නෝට්ටු 200ක් සමග සැක 2ක් වීරකැටිය පොලිස් දැලේ

**රක්ෂණ ශ්‍රියන්ත සහ බලන්ගොඩ විශේෂ**

ව්‍යාජ රුපියල් 5000 නෝට්ටු 200ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනකු වීරකැටිය පොලිස් වසමේ අගුණුකොළ මාර්ගයේ හුන්නකුඹුර හන්දියේදී පෙරේද (31) තංගල්ල කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් පිරිසක් කළ වැටලීමකදී අත්අඩංගුවට ගෙන තිබේ.

වීරකැටිය අගුණුකොළ මාර්ගයේ හුන්නකුඹුර හංදියේදී ව්‍යාජ මුදල් රුපියල් 5000 නෝට්ටු 200ක් සන්තකයේ තබාගෙන යතුරුපැදියකින් ගමන් කරමින් සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

පසුව එම සැකකරුගෙන් කළ ප්‍රශ්න කිරීම්වලදී මෙම ව්‍යාජ මුදල් මුද්‍රණය කර ඇති ස්ථානය වටලා තවත් සැකකරුවකු ව්‍යාජ මුදල් මුද්‍රණය කිරීමට යොද ගත් පරිගණක යන්ත්‍රයක් හා ප්‍රින්ටරයක් සමග අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරුවන් දෙදෙනා වැඩිදුර විමර්ශන කටයුතු සඳහා වීරකැටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

සැකකරුවන් වයස අවුරුදු 27ක් හා 39ක් වන උඩයාල, හතුරුවෙල ප්‍රදේශයේ පදිංචිකරුවන් බව පොලීසිය පවසයි. සැකකරුවන් ඊයේ (1) වලස්මුල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි. වීරකැටිය පොලීසිය වැඩිදුර විමර්ශන පවත්වයි.

# නාවික හමුදාව උතුරු - දකුණු වෙරළ තීර පවිත්‍ර කරයි





**රක්ෂණ ශ්‍රියන්ත**

නාවික හමුදාව සංවිධාන කළ තවත් වෙරළ පිරිසුදු කිරීමේ වැඩසටහන් කිහිපයක් උතුරු සහ දකුණු නාවික විධානයන් කේන්ද්‍ර කරගනිමින් පසුගිය සතියේ ක්‍රියාත්මක කෙරිණි.

උතුරු නාවික විධානය මගින් නීලක්කාඩු කල්මුණේ තුඩුව, මාන්කුම්බාන්, ඔත්තප්පනෙයි, කඩෙයිකාඩු, පෙරුමුකාඩු සම්බිලිතුරේ, සහ කංකසන්තුර වරාය ආශ්‍රිත වෙරළ තීරයන් හා දකුණු නාවික විධානය මගින් ගාල්ල කොටුව, තංගල්ල ගොයම්බොක්ක සහ හම්බන්තොට ධීවර වරාය ආශ්‍රිත වෙරළ තීරයන්හි විසිරී තිබූ ප්ලාස්ටික්, පොලිතින් ඇතුළු අපද්‍රව්‍ය රැසක් ඉවත් කිරීමට කටයුතු කෙරිණි.

පවතින කොවිඩ් 19 අවදානම් තත්ත්වය හේතුවෙන් සෞඛ්‍ය අංශ මගින් ලබාදී ඇති උපදෙස් අනුගමනය කරමින් මෙම වැඩසටහන් පැවැත්වීමට නාවික හමුදාව කටයුතු කළ අතර, මෙම වැඩසටහන් සඳහා උතුරු සහ දකුණු නාවික විධානයන්හි නාවිකයන් විශාල ප්‍රමාණයක් සහභාගී වූහ.

රට වටා වෙරළ තීරය පිරිසුදුව පවත්වා ගැනීම වෙනුවෙන් මෙවැනි පරිසර හිතකාමී වැඩසටහන් ඉදිරියේදී ද ක්‍රියාත්මක කිරීමට නාවික හමුදාව කටයුතු කෙරේ.

# කළුතර බන්ධනාගාරයට ජංගම දුරකතනයක් විසි කළ කාන්තාවක ඇතුළු 3ක් අත්අඩංගුවට

**කළුතර මධ්‍යම සමූහ**

කළුතර බන්ධනාගාරයේ තාප්පයට උඩින් පෙරේද (31) ජංගම දූරකථනයක් විසි කළ සිද්ධියකට සැකපිට කාන්තාවක් ඇතුළු තිදෙනකු උතුරු කළුතර පොලීසිය අත්අඩංගුවට ගෙන තිබේ.

කළුතර බන්ධනාගාරයේ මත්කුඩු ළඟ තබා ගැනීමේ සිද්ධියකට අදාළව රඳවා සිටින සැකකරුවකුට මෙම ජංගම දූරකථනය විසි කර ඇති බව අනාවරණය වී තිබේ.

යතුරුපැදියකින් පැමිණ බන්ධනාගාරය තුළට ජංගම දූරකථනය විසි කළ බව කියන සැකකරුවන් දෙදෙනකු පළමුව අත්අඩංගුවට ගෙන ඇති අතර, ඉන් එක් අයකු බන්ධනාගාර රැඳවූවාගේ සොයුරකු බව අනාවරණය වී ඇත.

මෙම රැඳවූවා පානදුර අළුබෝමුල්ල ප්‍රදේශයේ පදිංචි හමුදා සෙබළෙකු වන අතර ඔහුට ලබාදීම සඳහා ජංගම දූරකථනය එවූ බව කියන ඔහුගේ බිරිය ද ඊයේ (1) පොලීසිය අත්අඩංගුවට ගෙන තිබේ.

# ප්‍රේක්ෂා නාට්‍ය උලෙළින් අද ටවර් රඟහලේදී 'මීඩියා' එල්ෆින්ස්ටන්හිදී 'UNTOUCHED'

**උපාලි කරුණාරත්න**

ටවර් හෝල් රඟහල පදනම ඉදිරිපත් කරන ප්‍රේක්ෂා නාට්‍ය උළෙලින් අද (2) මරදාන ටවර් රඟහලේදී ආචාර්ය සමන් සොයිසා අධ්‍යක්ෂණය කළ ' මීඩියා ' නාට්‍යය සවස 3.30ට හා 6.30ට වේදිකා ගත කෙරේ. තරිඳු අබේසිංහගේ සංගීතයෙන් ටවර් නාට්‍ය හා රංග කලා පාසලේ විද්‍යාර්ථීන්ගේ රංගනයෙන් මෙම නාට්‍යය රඟ දැක්වේ. එමෙන්ම මරදාන එල්ෆින්ස්ටන් රඟහලේදී සුජීව පතිනිසේකරගේ 'UNTOUCHED' නාට්‍යය සවස 3.30ට හා 6.30ට වේදිකා ගත කෙරේ. චින්දක වීරසිංහගේ සංගීතයෙන් මෙම නාට්‍යය හැඩගැන් වී ඇත.

# රටටම වියළි කාලගුණයක් ජලය අරපිරිමැස්මෙන් භාවිත කරන්න

## ජල සම්පාදන මණ්ඩලය කියයි

**ස්වර්ණා විජේකෝන්**

දිවයිනටම බලපෑ ඇති වියළි කාලගුණ තත්ත්වය හේතුවෙන් අරපිරිමැස්මෙන් ජලය භාවිත කරන ලෙසට ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය ජනතාවට දැනුම් දෙයි.

පවතින වියළි කාලගුණික තත්ත්වය තුළ ඇතැම් ප්‍රදේශවලට ජල සැපයුම සීමා කිරීමට පවා සිදුවන බව ද ජල සම්පාදන මණ්ඩලය සඳහන් කරයි.

පානීය ජලය ලබා ගන්නා ප්‍රධාන ජලාශ හා ජල මූලාශ සිඳී යමින් පැවතීම මීට හේතුව බවද ජල සම්පාදන මණ්ඩලය පවසයි.

කෙසේ වෙතත් උස් බිම් ප්‍රදේශවල ජීවත්වන ජනතාවට අඩු පීඩනයක් යටතේ ජලය සැපයෙන බව එම මණ්ඩලය වැඩි දුරටත් සඳහන් කරයි.

## ඇ නැ ත්ත

උතුරු කරෙන් මැතිසබයට පැමිණි විගී
ජාතිවාදයේ ඉණිමඟ උඩට නගී
ප්‍රභාකරන් වෙනුවෙන් ඔහු කරන ඉගී
රටටම පිළිලයක් බව ඇත සැමට හැඟී

දිවුරුම් දෙමින් නොකරන බව අයුතු වැඩ
ඇති කර බේද මැතිසබයේ නඟන හඬ
සංහිඳියාවටයි වැදුණේ ගහන මඩ
මේ වැනි දේට තව දුර දිය යුතුද ඉඩ?

**රටේමුල්ලේ මුදන්නායක**

## ගම්මිරිස්

ජන්දෙට කලියෙන් ඉඳලම එක දිගටම අර්බුදේය
නායකයා අරය මෙයා දවසින් දවසට ඇසේය
උණුහුම ටික ටික මැකුණම කෝක වුණත් ඇල් මැරේය
සිරිකොත මුල් පුටුවෙ හබෙත් කුකුල් කරමලේ වගේය

**ගැස්මන් හෝනා**

# රැකියාවකට ඕස්ට්‍රේලියා යවන බව කියා ලක්ෂ 20ක් වංචා කරලා

## දකුණු කළුතර පොලීසියෙන් පරීක්ෂණ

**කළුතර මධ්‍යම සමූහ**

විදේශ රැකියාවකට ඕස්ට්‍රේලියාවට යවන බව පවසා රුපියල් ලක්ෂ 20ක මුදලක් වංචා කළ බව කියන පුද්ගලයකු පිළිබඳ දකුණු කළුතර පොලීසිය පරීක්ෂණ පවත්වයි.

සමරකෝන් දුක්ගන්නාරාළලාගේ කසුන් චතුරංග සමරකෝන් යන අය කළ පැමිණිල්ලකට අනුව පරීක්ෂණ ආරම්භ කර තිබේ. තමා අවස්ථා දෙකකදී මෙම මුදල බැංකු ගිණුමකට බැර කළ බව ඔහු පොලීසියට ප්‍රකාශ කර ඇත. දකුණු කළුතර පොලීසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

# මැදපෙරදිග සිර වී සිටි 640ක් මව් බිමට එති

**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ් 19 හෙවත් නව කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය හේතුවෙන් ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකිව මැදපෙරදිග රටවල් කිහිපයක සිටි ශ්‍රී ලාංකිකයන් 640 දෙනකු යළි මෙරටට ගෙන්වාගෙන තිබේ.

කටාර්, කුවේට් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍ය යන රටවල සිටි පිරිසක් මෙලෙස මෙරටට පැමිණි බව ගුවන් තොටුපළ ආරංචිමාර්ග පවසයි. එම පිරිසෙන් 293 දෙනකු කුවේටයේ සිට පැමිණ තිබෙන අතර, කුඩා දරුවන් තිදෙනකු ද ඒ අතර වෙති.

288 දෙනෙකු එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිට සහ කටාර් රාජ්‍යයේ සිට 59 දෙනකු මෙරටට පැමිණි ඇති බව ගුවන් තොටුපළ ආරංචිමාර්ග පවසයි.

## ශ්‍රීකාන්තගේ ශ්‍රී දූපත



• රත්නපුරේ පාර්ලිමේන්තු අසුනක් වෙනුවෙන් කාසිය වාසිය බලන්නත් වෙයි කියන්නෙ බං !

• ගිහියො පැවිද්දො දෙගොල්ලොම ආසනේට මරා ගන්න හැටියට ඕකෙ කාසි - වාසි නැති වෙන්න බෑනෙ සර් !



දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

වර්ෂ 2020ක් වූ සැප්තැම්බර් මස 02 වැනිදා බදාදා

# ස්ථාවර ආර්ථික විසඳුමක්

ජීවන වියදම යනු ශක්‍රයාගේ පුත්‍රයා වූ වයිමාටත් විසඳිය නොහැකි උභතෝකෝටියක් යැයි කියනු ලැබේ. වයිමා මානව ආර්ථික කටයුතු කෙරෙහි සංවේදී වන දෙවියකු නම්: වහාම මහ පොළොවට සපැමිණ ආර්ථික ක්‍රියාවලිය හැසිරවිය යුතුය. එතුමා මහ පොළොවට පය ගසන බවක් හෝ ආර්ථික මැවීම් කරන බවක් හෝ දැකගන්නට නැත. එහි අර්ථය වන්නේ ශක්‍රයාට හෝ වයිමාට හෝ අපේ ආර්ථිකය සම්බන්ධයෙන් කළ හැකි දෙයක් නැති බවය. ආර්ථිකයේ හොඳ - නරක තීන්දු වන්නේ පාලකයන් ගනු ලබන තීරණ මතය. රටක් ගොඩනැඟීමට යන නායකයකුට ඍජු ප්‍රතිපත්තියක් සේම ආර්ථිකය පිළිබඳ සාර්ථක දැක්මක් ද තිබිය යුතු යැයි පඬිවරයකු කියා තිබේ.

ජනාධිපතිවරයා ජීවන වියදම් කමිටුව රැස්කොට වැදගත් සාකච්ඡාවක් පැවැත්වීය. එහිදී සාකච්ඡා වී ඇත්තේ ජීවන වියදම අඩු කිරීම සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග ගැනය. ජනාධිපතිවරයා මෙහිදී අවධාරණය කළ කාරණයක් වන්නේ ග්‍රාමීය ආර්ථික සංවර්ධනය සඳහා ගනු ලැබූ කිසිදු පියවරක් වෙනස් නොකොට ජීවන වියදම පහත හෙළීමට පියවර ගත යුතු බවය. ආනයන සීමා කිරීමට ආණ්ඩුව පියවර ගෙන තිබේ. එහි ඉලක්ක දෙකක් ඇත. පළමු ඉලක්කය දේශීය කෘෂිකර්මය දියුණු කිරීමය. දෙවන ඉලක්කය වන්නේ දේශීය ගොවියාගේ ආදායම ඉහළ නැංවීමය. දිළිඳු පවුල් වෙතින් තෝරා ගත් ලක්ෂයකට රජයේ රැකියා ලබා දීම ද අද සිට ආරම්භ වේ. මේ කිසිවක් අතරමග නවතින්නේ නැත.

ආර්ථිකයේ නිත්‍යතාව අධ්‍යයන කළ යුතු යැයි යන සටන් පාඨය එන්නේ 1980 ගණන්වල සිටය. යම් ආර්ථික ක්‍රමවේදයක් දීර්ඝ කාලයක් තුළ පවත්වාගෙන නොගියහොත් එහි සැබෑ ප්‍රතිලාභ හඳුනා ගන්නට ලැබෙන්නේ නැත. ශ්‍රී ලංකාව වැනි රටවල ඇත්තේ ආර්ථික නිත්‍යතාව නොව: ආර්ථික අනිත්‍යතාවය. ඇතැම් තාවකාලික ගැටලු විසඳීම සඳහා හදිසියේ ආර්ථික ප්‍රතිපත්ති වෙනස් කිරීම ආර්ථික විකෘතියකට පාර කපයි. කිසියම් භාණ්ඩයක මිල ඉහළ ගිය හොත් වහාම එය ආනයනය කිරීමට පියවර ගැනීම අපේ ආණ්ඩුවල ක්‍රමය වෙයි. එහෙත් දියුණු රටවල් එබඳු පියවර ගන්නේ නැත. අමෙරිකාව, ඉන්දියාව, එංගලන්තය පවා ආනයන සීමා පවත්වාගෙන යයි.

කහ කුඩු පිළිබඳ ආන්දෝලනයක් රට තුළ පවතී. කහ ආනයනයට සීමා පනවා ඇති බැවින් කහ හිඟයක් මතුවී තිබේ. කූට වෙළෙඳුන් කහ සඟවා තබාගෙන වැඩි මිලට අලෙවි කරන බව ද දැක ගත හැකිය. එහෙත් දේශීය පරිභෝජනයට අවශ්‍ය තරම් කහ නිෂ්පාදනය කිරීමේ හැකියාව ශ්‍රී ලංකාවට ඇත. කහ ආනයනය නිසා මිල පහළ ගිය අතර ගොවියා දුර්මුඛ වී කහ වැවිල්ල අඩාළ විය. එහෙත් මේ වන විට වගාව ආරම්භ වී ඇත. නැවත කහ ආනයනය කළ හොත් යළිත් වගාව අඩාල වීමට ඉඩ ඇත. කළ යුත්තේ දේශීය කහවලින් වෙළෙඳ පොළ ශක්තිමත් කිරීමය.

ඇතැම් තීරණ මඟින් ආර්ථික ගැටලු තාවකාලික ලෙස යටපත් කළ හැකිය. යටපත් කිරීම සාර්ථක ක්‍රමවේදයක් නොවේ. මේ මොහොතේ කහ ආනයනය කොට ගැටලුවට තාවකාලික විසඳුමක් ලබාදිය හැකිය. එහෙත් ඒ මඟින් ජාතික ආර්ථිකය දියුණු වන්නේ නැත. දේශීය ගොවියාගේ අතට මුදල් ලැබෙන්නේ නැත. කහ පිළිබඳ ගැටලුවට ස්ථාවර විසඳුමක් ලැබෙන්නේ ද නැත. ආර්ථික තීන්දු ගත යුත්තේ ඒ මඟින් ඇති විය හැකි දිගුකාලීන ප්‍රතිඵලය ද සැලකිල්ලට ගනිමින්ය. විවෘත ආර්ථිකය තුළ සීමා කිරීම් නැතැ'යි කීම අමූලික බොරුවකි. නව ලිබරල්වාදී ආර්ථිකයන් සහිත යුරෝපීය රාජ්‍යයන් හැම එකක්ම පාහේ ආනයන සීමාවන් පවත්වාගෙන යන ආකාරය දැක ගත හැකිය.

ජීවන වියදම් ගැටලුවට අදාළ තවත් විසඳුමක් වන්නේ ප්‍රාදේශීය හා කුඩා වෙළෙඳපොළවල් කෙරෙහි විශ්වාසය තබා කටයුතු කිරීමය. මෙය ඉතා සාර්ථක ක්‍රමවේදයක් ලෙස පවතී. ප්‍රාදේශීය සම්පත්වලින් ප්‍රාදේශීය වුවමනාවන් සපුරා ගැනීම ආර්ථික වශයෙන් බුද්ධිමත් ක්‍රියාවක් බව විශේෂඥයන් පෙන්වා දී තිබේ. ප්‍රාදේශීය වෙළෙඳ පොළ හා රට පුරා ඇති ආර්ථික මධ්‍යස්ථාන තවදුරටත් ශක්තිමත් කිරීම කෙරෙහි රජයේ අවධානය යොමු වී ඇත. එය ඉතා වැදගත් ප්‍රායෝගික වැඩපිළිවෙළකි. එක අතෙකින් ගොවියාගේ අත - මිට සරු කිරීමටත් තව අතෙකින් ජීවන වියදම පහත හෙළීමටත් එය යොදාගත හැකිය. අති විශාල වෙළෙඳ සංකීර්ණ යනු වියදම් බහුල වෙළෙඳ පොළ ක්‍රමයකි. එය දිළිඳු ප්‍රජාවට ඔරොත්තු නොදෙන තරම්ය.

මානව වර්ගයාගේ වුවමනා සපිරීමට මහ පොළොවට හැකියාව ඇති බව ද එහෙත් හැම මිනිසකුගේම ගිජු බව සපුරාලීමට මහ පොළොව සමත් නැති බව ද ගාන්ධිතුමා කියා ඇත. මෙහි ආර්ථික විද්‍යාවක් තිබේ. එය වටහා ගත යුතුය. ජනාධිපතිවරයා එය හොඳින්ම වටහාගෙන ඇති බව පෙනෙයි. ජේ. ආර්. ජයවර්ධන මහතා හඳුන්වා දුන් විවෘත ආර්ථිකය ගමන් කළේ මහා පරිමාණ ජේත්තුකාර ආර්ථිකයක් වෙතය. එයින් දුප්පතා වඩාත් දුප්පත් වෙයි. පොහොසතා වඩා පොහොසත් වෙයි. සැමට සාධාරණය ඉටු කිරීම සඳහා ඒ ක්‍රමය වෙනස් කළ යුතුය. බහුතරයකගේ අතට මුදල් ලැබෙන හා දේශීය භාණ්ඩ හා සේවාවලින් වෙළෙඳපොළ පිරීයන ආර්ථිකයක් අපට අවශ්‍ය වේ.

මේ ක්‍රමය දිගටම පවත්වා ගැනීමෙන් දිළිඳුකම තුරන් කළ හැකිය. ජීවන වියදම පහතට ගෙනයා හැකිය. තාවකාලික ආර්ථික විසඳුම් වෙනුවට ස්ථාවර ආර්ථික විසඳුම් කෙරෙහි ජනාධිපතිවරයාගේ අවධානය යොමු වී තිබීම ඉතා වටී.

### දිල්රුගෙ සීපද

පළාතෙන් පළාතට වෙනස් කරමින් පාට
බෙදා ඇත වටේ කුඩු, සාක්ෂිත් ඇත ඊට
කොයි කාට වුණත් කුඩු ඇබ්බැහිය වූ දාට
ජීවිතේ සම වෙන්නෙ අමාවක මහ රෑට



# ළමයි එනවා ඉස්කෝලෙ ලෑස්ති ද?



මහාචාර්ය
කපිල පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යංශය



> විදුහල්පතිවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ මව්පියන් ඇතුළු සෑම දෙනාගේම වගකීම වන්නේ කොරෝනා වසංගතයෙන් ආරක්ෂා වන ආකාරයෙන් කටයුතු කිරීමය. මේ වන විට කිසිදු ගැටලුවක් ඒ සම්බන්ධයෙන් උද්ගත වී නොමැති අතර නැවත එවැනි තත්ත්වයක් උද්ගත වුව හොත් සෞඛ්‍ය අංශයන්ගේ නිර්දේශ සහ උපදෙස් මත කටයුතු කරන බවට අධ්‍යාපන අමාත්‍යංශය සහතික වෙයි.

දරුවන්ගේ හෙට දවස සුරක්ෂිත කිරීම සඳහා රටක් වශයෙන් මෙන්ම රජයක් සහ මව්පියන් වශයෙන් ද දරුවන්ට දිය හැකි හොඳම දායාදය වන්නේ හොඳ අධ්‍යාපනයක් දීමයි. රජයෙන් විය යුතු යුතුකම අකුරට ඉටු කරමින් දැයේ දරුවන්ට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා නොමිලේ පොත්පත් දෙමින් අරඹූ අධ්‍යාපන ක්‍රමය වර්තමානය වන විට නොමිලේ දිවා ආහාර සහ නිල ඇඳුම් සහ නව තාක්ෂණය ද සලසා දෙමින් විධිමත් ක්‍රමවේදයකට අවතීර්ණ වී තිබේ. නමුත් ලෝකය පුරා ව්‍යාප්ත වුණ නව කොවිඩ්-19 වසංගත තත්ත්වය මාර්තු මාසය අග වන විට ශ්‍රී ලංකාවේ ද ව්‍යාප්ත වූ බැවින් රජයේ පළමු යුතුකම වූ රටේ දරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා එවකට අධ්‍යාපන ඇමැතිවරයා විසින් ඍජු තීරණයක් ගෙන දිවයිනේ සියල් පාසල් දින නියමයක් නොමැතිව වසා දමන ලදී.

## ■ ප්‍රඥාගෝචර තීරණ

එහෙත් රටේ වාසනාවට පහළ වූ ජනාධිපතිවරයා විසින් සෞඛ්‍ය අංශ සහ ත්‍රිවිධ හමුදාව මෙන්ම රජයේ බුද්ධි සේවය ද යොදා ගනිමින් ජනාධිපති කාර්ය සාධක බළකායක් ද ස්ථාපිත කරමින් දැවැන්ත කාර්යභාරයක් සිදු කොට මෙම කොවිඩ්-19 වසංගතය ලංකාවෙන් තුරන් කිරීම සඳහා කරන ලද දැවැන්ත වැඩපිළිවෙළ හේතුවෙන් මෙම වසංගතය මේ වන විට 95%ක් පමණ ලංකාවෙන් තුරන් වී ඇතැයි කිව හැකිය. වරාය සහ ගුවන් තොටුපොළ වසා දමා විදේශිකයන්ගේ පැමිණීම වළකාලමින් රට සුරක්ෂිත කරමින් නිරෝධායන ක්‍රමවේදය හරහා රටේ සෞඛ්‍ය සම්පන්න බව ශක්තිමත් කරන ලදී. එමෙන්ම සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශයන් ද රටේ ජනතාව විසින් අකුරටම පිළිපැදිණි.

'ලොක් ඩවුන්' කරන ලද රට පියවරෙන් පියවරට විවෘත කරමින් නීති රෙගුලාසි පනවමින් රට නැවත ගොඩනැඟීම සඳහා රජය විසින් දරන ලද වැඩපිළිවෙළ ඉතා සාර්ථක විය. කොරෝනා ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා කරන ලද පළමු පියවර වශයෙන් රජයේ සහ සියලුම පෞද්ගලික පාසල්, පිරිවෙන් සහ විශ්වවිද්‍යාල වසා දැමුව ද නැවත විවෘත කිරීමේ දී එය අවසාන පියවර විය. එය ප්‍රඥාගෝචර තීරණයකි. දිස්ත්‍රික්ක වශයෙන් රට විවෘත වෙමින් රජයේ ආයතන, බැංකු සහ පෞද්ගලික ආයතන විවෘත වෙමින් සෞඛ්‍ය මාර්ගෝපදේශයන් ජනතාව විසින් අකුරටම පිළිපදිනවා දැයි සොයා බලමින් සුරක්ෂිත කොට ගත් රට දැයේ දරුවන්ගේ අධ්‍යාපනය නංවාලීම සඳහා පාසල් පද්ධති සහ විශ්වවිද්‍යාල පද්ධතිය ද පියවර කිහිපයක් යටතේ විවෘත විය.

එහෙත් ඉන් කිසිදු හානියක් දරුවන්ට හෝ සමාජයට සිදු නොවූ බැවින් සැප්තැම්බර් 02 සහ 08 වන ද සිට කොටස් දෙකකින් යුතුව රජයේ සහ පෞද්ගලික අංශවල සියලු පාසල් ද පිරිවෙන් ද සම්පූර්ණයෙන් විවෘත කිරීමට රජය තීරණය කර තිබේ. එමෙන්ම අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාගයන්ට ද දින නියම විය. එය රජයක් විසින් කළ යුතුම ක්‍රියාවක් වන්නේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීමට ඉඩ නොතැබිය යුතු හෙයිනි.

## ■ ආරක්ෂාකාරී ක්‍රම

වර්තමානයේ කොරෝනා රෝගය සමාජයේ පැතිරීම සම්පූර්ණයෙන්ම නැවතී ඇති හෙයින් සෞඛ්‍ය අංශයේ ද අනුදැනුම මත රජයේ සියලු පාසල්වල සියලුම ශ්‍රේණි මෙලෙස පෙර පරිදිම ආරම්භ කිරීමට සැලසුම් කර තිබේ. රජයට විරුද්ධ වෘත්තීය සමිති විසින් පාසල් ආරම්භ කිරීමට එරෙහිව විරෝධතාවය පළ කරමින් රට ඉදිරියට යෑම වළක්වාලීමට කටයුතු කළ ද පාසල් වසා දමා තිබීම දිගටම කළ නොහැකිය. අධ්‍යාපන අමාත්‍යංශය විසින් මෙම තීරණය ගෙන ඇත්තේ සද්භාවයෙනි. දිවයිනේ මුළු පාසල් ප්‍රමාණය 10,161ක් වන අතර ඉන් වැඩි ප්‍රමාණයක් ඇත්තේ ළමයින් 200ට වැඩි පාසල් ය. දරුවන්ට කිසියම් හෝ අසනීපයක් ඇත්නම් ඔවුන් සාමාන්‍යයෙන් මව්පියන් විසින් නිවෙසින් එළියට දමන්නේ නැත. සියලු පාසල්වල අත් සේදීම සඳහා පහසුකම් සලසා ඇති නමුත් ශරීර උෂ්ණත්වය මැන බැලීම සඳහා පහසුකම සෑම පාසලකටම සලසා දී නැත. නමුත් දිවයිනේ බොහෝ පාසල් සංඛ්‍යාවක ශරීර උෂ්ණත්වය මැන බැලීම ක්‍රියාත්මක වුව ද එය ඉතා වියදම් අධික වන අතර ඇතැම් පාසල්වල මෙය නිසියාකාරව සිදු නොවේ. එහෙත් කළ යුතු අනෙකුත් ආරක්ෂණ ක්‍රම වේද සියලු පාසල්වල අනුගමනය කරනු ලබයි.

විදුහල්පතිවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ මවුපියන් ඇතුළු සෑම දෙනාගේම වගකීම වන්නේ කොරෝනා වසංගතයෙන් ආරක්ෂා වන ආකාරයෙන් කටයුතු කිරීමය. මේ වන විට කිසිදු ගැටලුවක් ඒ සම්බන්ධයෙන් උද්ගත වී නොමැති අතර නැවත එවැනි තත්ත්වයක් උද්ගත වුව හොත් සෞඛ්‍ය අංශයන්ගේ නිර්දේශ සහ උපදෙස් මත කටයුතු කරන බවට අධ්‍යාපන අමාත්‍යංශය සහතික වෙයි.

## ■ සාර්ථක ප්‍රතිඵල

විශ්වවිද්‍යාල ද ආරම්භ කරන ලද්දේ ද අදියර කිහිපයක් යටතේ ය. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ කරන ලද පරීක්ෂණ සියල්ල ද අතිශයින් සාර්ථක විය. දරුවන් මීටරය දුර තබා ගැනීම කළ නොහැකිය. ඔවුන් එක ළඟ සිටිනු දක්නට ලැබුණ ද ඉන් අනිසි විපාකයක් මෙතෙක් වාර්තා වූයේ නැත. පාසල්වල එක් ශ්‍රේණියක දරුවන් 20ක් පමණ රඳවා ගනිමින් දුරස්ථභාවය තබා ගනිමින් ආරම්භ කරන ලද වැඩපිළිවෙළ ඉතා සාර්ථක වී ඇති හෙයින් නැවත පාසල් සහ විශ්වවිද්‍යාල පෙර තිබූ ආකාරයට ආරම්භ කිරීමට යෑම පිළිබඳව මව්පියන් කිසිදු බියක් ඇති කර ගත යුතු නැත. මේ අවස්ථාවේ බිය ගැන කථා කළ යුතු ද නැත. එතරම් විශ්වාසයක් රට තුළ ඇති වී තිබේ. එහෙත් මින් අදහස් කරනුයේ රට සියයට සියයක් යථා තත්ත්වයට පත් වී ඇති බව නොවේ. මුඛ ආවරණ පැළඳීම, අත් සේදීම සහ නහය කට නොඇල්ලීම සෞඛ්‍ය පුරුද්දක් බවට පත් කර ගැනීම රෝගය පැරදවීමට සෑමදෙනා අනුගමනය කළ යුතු සෞඛ්‍ය ක්‍රමවේදයකි. අප කොරෝනා පරදවමින් රට සමඟ මෙන්ම ලෝකය සමඟ ද ඉදිරියට යා යුතුය.

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග පැවැත්වීම පිළබඳව ද කිසිදු බියක් ඇති කර ගත යුතු නොවන්නේ විභාග පැවැත්වීමේ දී දුරස්ථභාවය පවත්වා ගැනීම මෙතෙක් කර ගෙන ආ වැඩපිළිවෙළක් වූ බැවිනි. විභාග නොපවත්වා දිගටම තබා ගැනීමෙන් දරුවන්ගේ කාලය නිකරුණේ අපතේ යයි. නිසි වයසේ නිසි විභාගයන්ට පෙනී සිට උසස් අධ්‍යාපනය හමාර කර රැකියාවක් සොයා ගනිමින් දරුවන් විසින් ඔවුන්ගේ අනාගතය සරි කර ගත යුතුය. රට සෑම දිනම වසා ගෙන සිටිය නොහැකිය. එය කෙතෙක් කාලයක් දැයි තීරණය කිරීම උගහටය. රජයේ බුද්ධි අංශ විසින් සමාජය පිළිබඳ හොඳ විපරමකින් සිටින බව පැහැදිලිය. රෝගීන්ගේ ආශ්‍රිතයන් හඹා ගොස් කරනු ලබන නිරෝධායන ක්‍රම වේදය තවමත් ක්‍රියාත්මක වේ. වර්තමානයේ දරුවන් නිවෙසෙහි තබා ගැනීම ද මේ දිනවල මවුපියන්ට ඇති උග්‍ර ගැටලුවකි.

## ■ ක්‍රීඩා කටයුතු ඇරඹේ

පාසල් සියල්ල සැප්තැම්බර් 02 සහ 08 දින පෙර පරිදි පෙර තිබූ වේලාවටම එනම් උදෑසන 7.30 සිට 1.30 දක්වා පැවැත්වීම ආරම්භ කළ පසු දරුවන්ගේ ක්‍රීඩා කටයුතු ද ආරම්භ කිරීමට ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතා තීරණය කර තිබේ. එය දරුවන්ට සතුටුදායක පුවතක් වන බව නිසැකය.

දරුවන්ගේ ක්‍රීඩා කෞශල්‍යය පසුගිය මාස කිහිපය පුරාවම ඇන හිට තිබිණි. පාසල් මට්ටමින්, දිස්ත්‍රික්ක මට්ටමින් සහ සමස්ත ලංකා මට්ටමින් පවත්වනු ලබන තරගවලට සහභාගි වීමට ද පාසල් දරුවන්ට අවස්ථාවක් නොලැබිණි. ඒ සියල්ල මාස කිහිපයකටම ආපස්සට තල්ලු විණි. දැන් එළැඹ ඇත්තේ යළි දරුවන් සමග නැඟිටීමටය.

කොරෝනා වසංගතය හේතුවෙන් අප්‍රේල් පාසල් නිවාඩුවට පෙර පැවැත්වීමට තිබූ පාසල් වාර විභාග ද පැවැත්වීමට නොහැකි විය. ඉන්පසු එළැඹි ඊළඟ වාරයේ පාසල් විෂය නිර්දේශය අධ්‍යයන කටයුතු ද දරුවන්ට අතපසු විණි. නව තාක්ෂණ ක්‍රම වේද (ඔන් ලයින්) ඔස්සේ සෑම ශ්‍රේණියකම දරුවන්ට සිය නිවෙසේ දී විෂය කරුණු ඉගැන්වීමට සෑම ගුරුවරයෙක් සහ ගුරුවරියක්ම කටයුතු කළ ද මෙම නව තාක්ෂණය ඔස්සේ ඉගෙන ගැනීමට යම් හෙයකින් නොහැකි වූ දරුවන් පිළිබඳ නව පාසල් වාරයේ දී සොයා බැලීමට අධ්‍යාපන අමාත්‍යංශය කටයුතු සිදු කරමින් පවතී. මේ සියල්ල අදියරෙන් අදියර නිම කිරීමට අධ්‍යාපන අමාත්‍යංශය බලාපොරොත්තු වේ.

අදාළ පාසල් වාරයට නියමිත විෂය නිර්දේශය ආවරණය කිරීමෙන් පසු සිසු දරුවන්ගේ වාර විභාග ද ඉදිරියේ දී පැවැත්වීමට කටයුතු කෙරෙනු ඇත.


පසුගිය දින කිහිපයේ 10, 11, 12 සහ 13 ශ්‍රේණි මෙන්ම 5 ශ්‍රේණිය ආරම්භ කළ ද පාසල නිම වූයේ 3.30ට සහ 4.30ට වශයෙනි. නමුත් දරුවන්ට සිදු වූ අපහසුතා හේතුවෙන් සහ අධ්‍යාපන අමාත්‍යංශයට ලැබුණු පැමිණිලි මත එම ශ්‍රේණිවල දරුවන්ට ද ලබන 02 වැනිදා සිට සවස 1.30ට පාසල නිම වනු ඇත. තවද, එම කාලය තුළ පාසල් තුළ පැවති ආපනශාලා වසා තැබුණු අතර දරුවන් සිය නිවෙස්වලින් ආහාර ගෙන ආ යුතු විය. නමුත් ඉදිරියේ දී එම ආපණශාලා සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම වේද ඔස්සේ නැවත විවෘත කෙරෙනු ඇත.

## ■ විෂබීජහරණය

කිසියම් පාසලක සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙළ තුළ එනම් අත් සේදීම සඳහා සවි කර ඇති ජල කරාම ක්‍රියා නොකෙරේ නම් හෝ අත් සේදුම්කාරක අඩුපාඩුවක් හෝ වෙන යම් ගැටලුවක් පැන නඟින්නේ නම් හෝ කිසියම් අඩුපාඩුවක් පවතින්නේ නම් වහාම අධ්‍යාපන දෙපාර්තමේන්තුවට දන්වා එම ගැටලු නිරාකරණය කර ගත හැකිය. එමෙන්ම පාසල් විෂබීජහරණය කිරීම ද සතියකට වතාවක් හෝ සිදු කිරීමට අධ්‍යාපන අමාත්‍යංශ විසින් කිසියම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ඇත. එදිනෙදා දරුවන් පාසලට පැමිණීමේ දී අනිවාර්යයෙන්ම මුඛ ආවරණ පලඳවා පැමිණිය යුතු අතර පාසලේ දී සෞඛ්‍ය ආරක්ෂිතව සිටිය යුතු අන්දම මවුපියන් විසින් විශේෂයෙන් කුඩා දරුවන්ට අවබෝධ කර පාසලට එවිය යුතුය. දරුවන්ගේ අනාගතය පිළිබඳව සිතා රජය විසින් අනුගමනය කරනු ලබන වැඩපිළිවෙළට සහාය දෙමින් දරුවන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම මවුපියන්ගේ ද යුතුකම වන්නේ ය.

නැවත පාසල් කාලය ආරම්භ වීම පිළිබඳ මාපියන් අනිසි බියක් තබා ගත යුතු නොවේ. ශ්‍රී ලංකාවෙන් කොරෝනා රෝගය තුරන් කිරීමට මෙම රජය සහ බලධාරීන් ක්‍රියා කළ ආකාරය ලෝකයේම පැසසුමට ලක්ව තිබේ. එබැවින් රටේ ජීවනාලිය වන ළමා පරපුරේ අනාගතය සුරක්ෂිත බව රකින්නට පාසල් විවෘත වන මේ මොහොතේ සිසු බලධාරීන් කැප වන බව සහතිකය.

**චතුමී පිටිපන**





## ඇමැතිවරුන් - රාජ්‍ය ඇමැතිවරුන් සමඟ එක්ව

# රට ඉදිරියට ගෙන යෑම දිස්ත්‍රික් කමිටු සභාපතිවරුන්ට පැවරෙන සුවිශාල වගකීමක්

### ජනපති කියයි



**සියලු මාර්ග ඉදිරි සිව් වසරේදී ප්‍රතිසංස්කරණයට**

**තම දිස්ත්‍රික්කයේ ජනතාව එදිනෙදා මුහුණ දෙන ගැටලු සොයා බලන්න**

**දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති ධුරවලට තරුණ මන්ත්‍රිවරුන් පත් කළේ ඔවුන්ගේ මුළු කාලයම ඊට වැය කිරීමටයි**

**පානීය සහ වාරි ජල අවශ්‍යතා, වාරිමාර්ග ප්‍රතිසංස්කරණය, වන අලි ගම් වැදීම, අධ්‍යාපන සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අඩු පාඩු කඩිනමින් විසඳීම රජයේ ප්‍රමුඛ අරමුණයි**

**නුවන් කොඩිකාර**

අමාත්‍යවරුන් හා රාජ්‍ය අමාත්‍යවරුන් සමඟ එක්ව රාජ්‍ය යන්ත්‍රණය කාර්යක්ෂමව යොදා ගනිමින් රට ඉදිරියට ගෙන යෑම දිස්ත්‍රික් කමිටු සභාපතිවරුන්ට පැවරෙන විශාල වගකීමක් යැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පැවසීය.

රටේ සියලු මාර්ග ඉදිරි සිව් වසරේදී ප්‍රතිසංස්කරණය කරන බවද ජනාධිපතිවරයා මෙහිදී ප්‍රකාශ කළේය.

දිස්ත්‍රික්ක රැසක ජනතාව මුහුණ දී සිටින ගැටලුවලට විසඳුම් දෙමින් ජාතික ආර්ථිකය ගොඩනැඟීමට සක්‍රීයව දායක වන්නැයි ද හෙතෙම ඉල්ලීමක් කළේය.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන්ගේ කාර්ය භාරය සහ වගකීම පිළිබඳ දැනුවත් කිරීමට ජනාධිපති කාර්යාලයේ පෙරේදා (31) පැවති සාකච්ඡාවේදී ජනාධිපතිවරයා මෙම අදහස් පළ කළේය.

දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති ධුර සඳහා අමාත්‍යවරුන් නොවන තරුණ මන්ත්‍රීවරුන් පත් කළේ ඔවුන්ගේ මුළු කාලයම ඒ සඳහා වැය කිරීමට බවද හෙතෙම පෙන්වා දුන්නේය.

බොහෝ දිස්ත්‍රික්කවලට පොදු සහ ඒවාට පමණක් විශේෂිත වූ ප්‍රශ්න රජය හඳුනාගෙන තිබෙන බවත් පානීය සහ වාරි ජල අවශ්‍යතා, වාරිමාර්ග ප්‍රතිසංස්කරණය, වන අලි ගම්වැදීම, අධ්‍යාපන සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අඩු පාඩු කඩිනමින් විසඳීම රජයේ ප්‍රමුඛ අරමුණ බවත් ජනාධිපති රාජපක්ෂ මහතා කියා සිටියේය.

එය ඉටු කරගැනීම පිණිස අමාත්‍යවරුන්ට හා රාජ්‍ය අමාත්‍යවරුන්ට පත්වීම් දෙන අවස්ථාවේදීම දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපතිවරුන් පත් කළ බව පැවසූ ජනාධිපතිවරයා සියලු දිස්ත්‍රික්කවල තත්ත්වය සමාලෝචනයටත්, පවතින ගැටලුවලට එවලෙහිම විසඳුම් දීමේ වැඩපිළිවෙළක් සැකසීමටත් පියවර ගන්නා බව පැවැසීය.



## ඇනහිට ඇති සංවර්ධන වැඩ අවසන් කිරීමට ඉදිරි අය-වැයෙන් මුදල් වෙන් කරනවා

### පුනර්ජීවනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂ

2015 දක්වා රජය ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන් කිහිපයක වැඩ නතර වී තිබුණත්, ඉදිරි අය වැයෙන් මුදල් වෙන් කර ඇනහිට ඇති ඉදිකිරීම් සියල්ලෙහි වැඩ අවසන් කළ යුතු බව ආර්ථික පුනර්ජීවනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බළකායේ ප්‍රධානී බැසිල් රාජපක්ෂ මහතා පැවැසීය.

ඒ, බී, සී, ඩී ලෙස වර්ග කර ඇති සියලු මාර්ග ජනාධිපතිවරයාගේ ධුර කාලය අවසන් වීමට පෙර කාපට් අතුරා සංවර්ධනය කිරීමට සැලැසුම් කර ඇතැයිද බැසිල් රාජපක්ෂ මහතා සඳහන් කළේය.

අමාත්‍යාංශවල රාජකාරීවලට සහ නිලධාරීන් සමඟ සම්බන්ධ වී ක්‍රියා කර දේශපාලනඥයා කෙරෙහි ජනතාව තුළ ඇති විශ්වාසය තහවුරු කළ යුතු යැයි ජනාධිපතිවරයා කමිටු සභාපතිවරුන්ට පැවැසීය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා අපේක්ෂා කරන සහය දෙමින් රට සංවර්ධනයට උපරිමයෙන් කැපවන බවට දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපතිවරු සහතික වූහ.

ජනාධිපති ලේකම්, ආචාර්ය පී.බී. ජයසුන්දර, මුදල් ලේකම් එස්.ආර්. ආටිගල සහ ආරක්ෂක ලේකම් විශ්‍රාමික මේජර් ජෙනරාල් කමල් ගුණරත්න යන මහත්වරුන් ද සාකච්ඡාවට එක්ව සිටියහ.

## බේරේ වැව ඉදිරිපිට ඉදිකෙරෙන
# අල්ටයර් සංකීර්ණය ජනපති නිරීක්ෂණය කරයි







බේරේ වැව ඉදිරිපිට ඉදිකෙරමින් පවතින අල්ටයර් (Altair) නේවාසික සහ වාණිජ ගොඩනැගිල්ල පෙරේදා (31) ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නිරීක්ෂණයට ලක් විය.

බේරේ වැවට යාබද අක්කර දෙක හමාරක භූමි ප්‍රදේශයක ඉදිකෙරෙන මෙම ගොඩනැගිල්ලේ වැඩ 2012 වසරේ දී ඇරඹුණු අතර, එහි බිම් මහල වර්ග අඩි 40,000කි.

අධි සුඛෝපබෝගී නිවාස 404ක් සහ ඉහළ ප්‍රමිතියේ සාප්පු සංකීර්ණයක් ඊට අයත් වන අතර කුළුනු දෙකකින් යුත් අල්ටයර් සංකීර්ණයෙහි එකක් මහල් 68 කින් සහ අනෙක මහල් 63කින් සමන්විත වේ.

ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි මෙම ව්‍යාපෘතියට අමෙරිකානු අඩොලර් මිලියන 250ක් ආයෝජනය කෙරේ. මෙහි ඉදිකිරීම් නාගරික සංවර්ධන අධිකාරිය මගින් අධීක්ෂණය කරන අතර, එය වැඩ අවසන් වන විට කොළඹ පිහිටි උසම ගොඩනැගිලි අතරට එක් වේ.

ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් 98%ක් පමණ දැනට අවසන්ව තිබෙන අතර ඉතිරි වැඩ ලබන ජනවාරි වන විට නිම වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා, නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති හර්ෂාන් ද සිල්වා, ව්‍යාපෘති භාර අධ්‍යක්ෂ ප්‍රදීප් මොරායස් යන මහත්වරු නිරීක්ෂණ චාරිකාවට එක්ව සිටියහ.



## බෝගම්බරින් වැලිකඩට ආ රැඳවූ කතගේ ජල බෝතල් මූඩියේ සිම් පත් දෙකක්

**බුද්ධිකා ඉඹුලාන**

බෝගම්බර බන්ධනාගාරයේ සිට වැලිකඩ බන්ධනාගාරයේ කාන්තා අංශයට මාරු කර එවූ රැඳවූ කාන්තාවක රැගෙන ආ ජල බෝතලයක මූඩියේ සූක්ෂ්ම ලෙස සඟවා තිබූ සිම් කාඩ්පත් දෙකක් සොයා ගැනීමට පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරීන් සමත් වී තිබේ.

පෙරේද (31) එම බන්ධනාගාරයේ පිවිසුම් දොරටුවේ රාජකාරියේ නිරතව සිටි මේ පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරීන් විසින්, එම කාන්තාව රැගෙන ආ බෑගය පරීක්ෂා කිරීමේදී මේ සිම්කාඩ් පත් හමුවී ඇත.

එම සිම් කාඩ්පත් දෙක වැඩි දුර විමර්ශන සඳහා පොලිස් විශේෂ කාර්ය බළකාය මගින් බන්ධනාගාර බුද්ධි ඒකකය වෙත භාරදී ඇති බව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් තුෂාර උපුල්දෙණිය මහතා දිනමිණට කීය.

මේ අතර බෝල දෙකක සූක්ෂම ලෙස සඟවා හෙරොයින් ග්‍රෑම් 5ක් කළුතර බන්ධනාගාරයේ තාප්පයෙන් විසි කළ පුද්ගලයන් දෙදෙනකු එම බන්ධනාගාර නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

එම පුද්ගලයන් විසින් ජංගම දුරකතනයක් ද බන්ධනාගාරය තුළට විසි කර ඇති අතර, වැඩි දුර විමර්ශන සඳහා මත්ද්‍රව්‍ය සහ ජංගම දුරකතනය සමඟ සැකකරුවන් කළුතර උතුර පොලීසියට භාරදී ඇත.



# හරිත නගර නිර්මාණය ජනාධිපතිවරයාගේ මූලික පරමාර්ථයයි

## පරිසර ඇමැති මහින්ද අමරවීර

**අමෝදා ජයමහ**

රට සංවර්ධනය කරා යන මුවාවෙන් කොන්ක්‍රීට් ගම්මාන බිහි කිරීම නොව හරිත නගර නිර්මාණය ජනාධිපතිවරයාගේ මූලික පරමාර්ථය වන බව පරිසර ඇමැති මහින්ද අමරවීර මහතා පැවසුවේ ය.

ජනාධිපතිවරයාගේ සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළ මූලික කර ගනිමින් ඉදිරි සංවර්ධන වැඩ කටයුතු සිදු කරන විට හැකිතාක් දුරට පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් කටයුතු කරන බව පරිසර ඔහු පැවසුවේ ය.

මේ වනතෙක් පත් වූ කිසිඳු රජයක් විසින් රට තුළ සංවර්ධන කටයුතු සිදු කරන විට පරිසරය පිළිබඳ විශේෂ අවධානයක් යොමු නො කළ බවත් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සංවර්ධන වැඩපිළිවෙළ ඊට හාත්පස වෙනස් මුහුණුවරක් ගන්නා බව ද ඇමැතිවරයා කියා සිටියේ ය.

කිසියම් වූ සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේ දී යම් ගස් ප්‍රමාණයක් කපා දැමීමට සිදු වන්නේ ද ඒ ගස් ප්‍රමාණය මෙන් දෙගුණයක් ගස් සිටු වීම අනිවාර්යය කරුණක් වන බව ද ඇමැතිවරයා පැවසී ය.

සංවර්ධන කටයුතු සඳහා කපා දමන ගස් වෙනුවට ඉහළ වටිනාකමකින් යුත් ශාක රෝපණයට කටයුතු කරන බව හා වන ගහණය සියයට තිස්දෙකක් දක්වා වැඩි කිරීමට අපේක්ෂා කරන බව ද මහින්ද අමරවීර මහතා කී ය.

එමෙන්ම සංවර්ධන කටයුතු සැලසුම් කිරීමේ දී තිබෙන ශාක මෙන්ම වන ජීවීන්ට හට ද හානියක් නො වන අයුරින් කටයුතු කිරීමට ද ජනාධිපතිවරයා උපදෙස් ලබා දී ඇති බව ද ඇමැතිවරයා වැඩිදුරටත් අවධාරණය කරනු ලැබී ය.

## වෙළෙඳපොළේ කෘත්‍රිම කහ වැඩි වෙලා

**මානෙල් පුෂ්ප කුමාරි**

වෙළෙඳපොළේ කහ හිඟයක් පවතින මොහොතේ කෘත්‍රිම කහ වෙළෙඳපොළට වැඩි වශයෙන් නිකුත්වීම කෙරෙහි දැඩි අවධානයකින් සිටින ලෙස පාරිභෝගික සේවා අධිකාරිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

ආහාර පිසීමේදී කහ අත්‍යවශ්‍ය ද්‍රව්‍යයක් වන බැවින් හිඟය දඩමීමා කරගෙන ව්‍යාජ වෙළෙඳුන් මුදල් ඉපයීමට ඒ අවස්ථාව යොදා ගෙන ඇති බවත් සඳහන් වේ.

තිරිඟු පිටි සහ සහල් පිටිවලට කහ වර්ණය යෙදීම සඳහා සිරුරට අහිත කර ඩයි වර්ග යොදා ගනිමින් කහ නිෂ්පාදන ක්‍රියාවලියෙහි යෙදෙන බවත් දැක්වේ.

පසුගිය කාල සීමාව තුළ මේ සිද්ධිය සම්බන්ධයෙන් වැටලීම් 120ක් සිදු කර ඇති අතර, ඉන් සාම්පල් 40ක් ලබාගෙන ඒවා පරීක්ෂා කිරීමට යොමු කර ඇති අතර, ඉන් සාම්පල් 19ක්ම කෘත්‍රිම කහ බවට අනාවරණය වී ඇත.

## මත්කුඩු ජාවාරම් කළ ‘ටයියා’ සහ බිරිය අත්අඩංගුවට

**මාපාකඩවැව සමූහ එච්. එම්. රංජිත් කරුණාවීර**

මහියංගණ, සමගිපුර ප්‍රදේශයේ කලක පටන් හෙරොයින් මත්කුඩු ජාවාරමේ නිරතව සිටි ‘ටයියා’ නම් නම ගිය මත්කුඩු ජාවාරම්කරු හා ඔහුගේ බිරිය මත්කුඩු ග්‍රෑම් 03යි මිලිග්‍රෑම් 500ක් සමඟ පෙරේද (31) සවස අත්අඩංගුවට ගත් බව මහියංගණ පොලීසිය පවසයි.

අත්අඩංගුවට ගත් ටයියා මීට පෙර මත්කුඩු සමඟ අත්අඩංගුවට පත්ව, බදුල්ල මහාධිකරණයෙන් ඇප පිට නිදහස්ව නැවතත් මත්කුඩු ජාවාරමේ නිරතව සිටි අයකු බව මහියංගණ පොලීසිය කියයි.

හෙරොයින් අලෙවියෙන් උපයා ගත්තා යැයි සැක කෙරෙන මුදල් රුපියල් 13,000 (දහතුන් දහසක්) විදෙස් ගමන් බලපත්‍ර 02ක්, ජංගම දුරකථන 03ක් හා හෙරොයින් මත්කුඩු ටයියා නම් සැකකරුගේ සන්තකයේ ග්‍රෑම් 02යි මිලිග්‍රෑම් 200ක්, ඔහුගේ බිරිය සන්තකයේ තිබී ග්‍රෑම් 01යි මිලිග්‍රෑම් 300ක් තිබී පොලිස් අත්අඩංගුවට පත් වූ අතර, අත්අඩංගුවට ගත් සැකකරුවන් හා නඩු භාණ්ඩ මහියංගණ මහේස්ත්‍රාත් අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

මහියංගණය සහකාර පොලිස් අධිකාරි ලක්දස් අබේගුණසේකර මහතාගේ මග පෙන්වීමෙන් මහියංගණ පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ඒස්. ජේ. ඒ. ආර්. එල්. සේනාධීර මහතා, මහියංගණ පොලිසියේ අපරාධ අංශයේ ස්ථානාධිපති උ. පො. ප. ඩබ්ලිව්. එම්. රසික දසන්ත වීරකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් පොලිස් සැරයන් 47144 කිත්සිරි, 66024 ජයසේකර, 37434 බණ්ඩාර, 37039 ප්‍රියන්ත, 10931 තිලක්, කාන්තා පොලිස් සැරයන් 4277 ශ්‍රීමතී, පොලිස් කොස්තාපල් 71610 දනුක, 70397 අනුරාධ යන පොලිස් නිලධාරීහු විසින් මේ වැටලීම සිදු කරනු ලැබීය.

## දේශීය මී පැණි නිෂ්පාදකයන් දිරි ගැන්වීමට වැඩපිළිවෙළක්

**චන්දිමා කරුණාරත්න**

දේශීය මී පැණි නිෂ්පාදකයන් දිරි ගැන්වීමට නිපුණතා සංවර්ධන අරමුදලෙන් විශේෂ වැඩපිළිවෙළක් දියත් කෙරේ.

මී මැසි ජනපදයක අභ්‍යන්තර ක්‍රියාකාරීත්වය, ජනපදයක මී වද බැඳී ඇති ආකාරය, මී පැණි නිෂ්පාදනය සිදු කරන ආකාරය, ඔවුන් භාවිතා කරන උපකරණ , ප්‍රධාන ගැටලු ලෙස යන්ත්‍ර මිලදී ගැනීමේ අවශ්‍යතාවය, නිසි ප්‍රමිතියකට පෙට්ටි සැකසීමේ අශ්‍යතාවය, නිවැරදි වෘත්තිය පුහුණුව ලබා ගැනීමේ අවශ්‍යතාවය ආදිය හඳුනා ගෙන ඇති අතර එබැවින් එම ගැටලුවලට විසඳුම් ලබාදී ඔවුන්ව දිරිමත් කර දේශීය මී පැණි නිෂ්පාදනය ඉහළ නැංවීමට නිපුණතා සංවර්ධන අරමුදලහි අරමුණයි.

මේ වන විට ශ්‍රී ලංකාව පුරා සක්‍රියව පවතින මී මැසි ජනපද විසින් දේශීය අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය තරම් ප්‍රමාණවත් මී පැණි නිෂ්පාදනය සිදු වනවාද යන්න පිළිබඳ මෙහිදී අවධානය යොමු වී තිබේ. එමෙන්ම තත්ත්වයෙන් උසස් මී පැණි නිෂ්පාදනයේදී දේශීය ව්‍යවසායකයන් මුහුණදෙන ගැටලු සහ ඔවුන් සතුව පවතින නව තාක්ෂණික දැනුමේ අඩුපාඩු සොයා බැලීම පිළිබඳත් අවධානය යොමුවී ඇත. ශ්‍රී ලංකාවේ වාර්ෂික මී පැණි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 25කට සීමා වී ඇත. දේශීය වශයෙන් මී පැණි නිෂ්පාදනයේ සීඝ්‍ර වර්ධනයක් ඇති කරලීමට මී පැණි නිෂ්පාදන ව්‍යාපාරය ස්වයං රැකියාවක් ලෙස ඉහළ නංවා අමතර ආදායම් මාර්ග බිහිකිරීමටත් එමඟින් මී පැණි සඳහා වැයවන විදේශ විනිමය ඉතිරි කරගැනීමටත්, මී මැසි පාලනය ආශ්‍රිත අනෙකුත් නිෂ්පාදන සඳහා ඉහළ ඉල්ලුමක්ද ඇති කළ හැක.

සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර ව්‍යවසායකයන් දිරිගැන්වීමේ වැඩපිළිවෙළක් සකස් කර ඇති අතර එහි පළමු අදියර ගම්පහ දිස්ත්‍රික්කයේ මී පැණි නිෂ්පාදකයන් මුල් කරගනිමින් සංවිධානය කර තිබූ අතර මී මැසි ජනපද ඇති කිරීම, දේශීය මී පැණි නිෂ්පාදකයන් දිරි ගැන්වීම, නිෂ්පාදනයේදී පවතින ගැටලු සහගත තත්වයන් නිරාකරණය කරමින් තත්වයෙන් ඉතා උසස් මී පැණි නිෂ්පාදනය සඳහා නව තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වාදීම යන අරමුණු මුල් කර ගනිමින් ව්‍යවසායකයන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසහනක් පසුගියද අමාත්‍යංශ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

එහිදී නව තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතය , මී පැණි නිෂ්පාදන වෙළෙඳපොළ තවදුරටත් ප්‍රසාරණය කිරීමට බිස්නස් ඇප් එකක් නිර්මාණය කිරීමටත් ඒ හරහා නව රැකියා අවස්ථා බිහි කිරීම පිළිබඳවත් අවධානය යොමුවිණි.ඒ අනුව දේශීය මී පැණි නිෂ්පාදකයාගේ වෘත්තිය අභිමානය ඇති කිරීමට ගත් වැදගත් පියවරක් වශයෙන් නිපුණතා සංවර්ධන අරමුදල මගින් නිසි වෘත්තිය පුහුණු පාඨමාලාවක් හඳුන්වා දී ඒ සඳහා ජාතික වෘත්තිය සුදුසුකම් පළමු සහ දෙවන මට්ටමේ (NVQ Level 1 / Level 2) වෘත්තිය සහතිකයක් ලබාදීමට ද යෝජිතය.

## ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 69 වන සංවත්සරය අද

**ස්වර්ණා විජේකෝන්**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 69 වන සංවත්සරය අදට (02) යෙදී තිබේ. සර්ව ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් ආගමානුකූලව හා චාම් ලෙස මෙවර සංවත්සරය පැවැත්වීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තීරණය කර ඇත.

ඒ අනුව අද (02) පස්වරු 6.00 ට බෙල්ලන්විල රාජමහා විහාරයේදී බෝධිපූජා පින්කමක් පවත්වමින් පක්ෂයේ නිර්මාතෘවරුන් සහ පක්ෂයේ සාමාජිකයින් ලෙස මියගිය සාමාජික සාමාජිකාවන් සිහිකර පින් අනුමෝදන් කිරීමද අද සිදුවේ.

ඉස්ලාම් ආගමික වතාවත් දවටගහ ජුම්මා මස්ජිඩ් පල්ලියේදී සිදුකිරීට නියමිත වේ. එමෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘ එස් ඩබ්ලිව් ආර් ඩී බණ්ඩාරනායක, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සියලු නායක නායිකාවන් සිහිපත් කිරීමද අද සිදුවේ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 69 වන සංවත්සරය පැවැත්වෙන ආගමික වතාවත් වෙනුවෙ න් පක්ෂයෙ සභාපති මෛත්‍රිපාල සිරිසේන, මහලේකම් දයාසිරි ජයසේකර, මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස මහතා ඇතුළු පිරිකි සහභාගී වීමට නියමිත වේ.

## මෙරටට ඊයේ පැමිණි ශ්‍රී ලාංකිකයන් 53 කට කොවිඩ්

**මහින්ද අලුත්ගෙදර**

ගතවූ පැය 24ක කාලයේ දී විදේශයන් හි සිට මෙරටට පැමිණි ශ්‍රී ලාංකිකයන් 53 දෙනෙකුට කොවිඩ් 19 හෙවත් නව කොරෝනා වෛරසය ආසාදනය වී ඇතැයි තහවුරු වී තිබේ.

ඒ අනුව කටාර් රාජ්‍යයේ සිට පැමිණි පුද්ගලයින් 53 දෙනෙකුට මෙලෙස කොවිඩ්-19 ආසාදිතයන් ලෙස හඳුනාගෙන තිබෙන අතර ඒ අනුව මෙරට සමස්ථ කොරෝනා ආසාදිතයන් ගණන 3,071 ක් දක්වා ඉහළ ගොස් ඇතැයි සෞඛ්‍ය අමාත්‍යාංශය පවසයි.

කෙසේ වුවද ඊයේ (01) තවත් කොවිඩ් -19 ආසාදිතයින් 11 දෙනෙක් පූර්ණ සුවය ලැබීමත් සමඟ මෙරට සුවය ලැබූ සමස්ත සංඛ්‍යාව 2,879 දක්වා ඉහළ ගොස් තිබේ.

අයි.ඩී.එච් රෝහලෙන් දෙදෙනෙක් ද, වැලිකන්ද රෝහලෙන් 5 දෙනෙක් ද, ඉරණවිල රෝහලෙන් තිදෙනෙක් සහ මිනුවන්ගොඩ රෝහලෙන් එක් අයෙක් ද මෙලෙස සුවය ලබා තිබේ. ආසාදිතයින් 180 දෙනෙකු මේ වනවිට වෛද්‍ය අධීක්ෂණය යටතේ රෝහල් කිහිපයක ප්‍රතිකාර ලබති.

කෙසේ වුවද ලෝකය පුරා කොවිඩ්-19 රෝගය ව්‍යාප්ත වීම හේතුවෙන් ශ්‍රී ලංකාව ද ඒ පිළිබඳ වැඩි අවධානයක් යොමුකළ යුතු බව වසංගත රෝග විද්‍යා අංශයේ ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා පෙන්වාදෙයි.

ඔස්ට්‍රේලියාව සහ නවසීලන්තය වැනි හොඳින් කොවිඩ් පාලනය කළ රටවල පවා නැවත වතාවක් කොවිඩ්-19 රෝගය වාර්තා වීම හේතුවෙන් ඔවුන්ගේ ප්‍රදේශවල සංචරණය සීමාකර තිබෙන බවද ගමන් බිමන් සීමාකොට, ඇඳිරි නීතිය පැනවීම දක්වා ගමන් කිරීමට ඔවුන්ට සිදුව තිබෙන බවද ඒ මහතා කියාසිටී.

අමෙරිකාව, බ්‍රසීලය සහ ඉන්දියාව වැනි රටවල්වල රෝගීන් ඉතාම විශාල ප්‍රමාණයක් වාර්තා වන අතර ඉන්දියාව තුළ මේ රෝගය ව්‍යාප්තිය ද ඉහළ ගොස් තිබේ. මේ තත්ත්වය යටතේ ලංකාව කුඩා දූපතක් වුවද ලෝකය පුරාම කොවිඩ්-19 රෝගය ව්‍යාප්තවීමත් සමඟ තවදුරටත් අපේ සෞඛ්‍ය පුරුදු අනුගමනය කළයුතු බවද පෙන්වාදෙයි.

## කිඹුලා ඇළ ගුණා ගේ කුඩු ගෝලයෝ 8ක් අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

සංවිධානාත්මක අපරාධකරුවෙකු වන කිඹුලා ඇළ ගුණා සහ ඔහුගේ සහෝදරයෙකු විසින් සපුගස්කන්ද වත්තල, තොටළඟ, මෝදර ප්‍රදේශවල මෙහෙයවූ හෙරොයින් ජාවාරමට සම්බන්ධ සැකකරුවන් 08 දෙනෙකු සපුගස්කන්ද පොලිසිය විසින් පෙරේද (31) අත්අඩංගුවට ගෙන තිබේ. අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩිදුර විමර්ශන වලදී හෙරොයින් ග්‍රෑම්ස් 70ක් , කඩු 02, මුදල් රුපියල් 20000ක් , ත්‍රිරෝද රථ 02ක් යහ යතුරු පැදි 02ක් පොලිස් භාරයට ගෙන තිබේ.

මෙම අත්අඩංගුවට ගත් වාහන හෙරොයින් ජාවාරමට යොදා ගත් ඒවාද යන්න පිළිබඳ පොලිසිය විසින් පුළුල් විමර්ශන සිදුකරයි.

සපුගස්කන්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරයි.

## බස්නාහිර පළාතෙන් දිනකදී සැකකරුවන් 400ක් අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

බස්නාහිර පළාත තුළ දිනක් තුළ සිදු කළ වැටලීම් වලින් විවිධ වැරදි වලට සම්බන්ධ සැකකරුවන් 400ක් සහ හෙරොයින් ගංජා ඇතුලු මත්ද්‍රව්‍ය විශාල තොගයක් අත්අඩංගුවට ගැනිමට පොලිසිය සමත්වී තිබේ.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ නියෝග හා උපදෙස් පරිදි පෙරේද (30) දින උදේ 6.00 සිට ඊයේ (31) දින උදේ 5.00 දක්වා කාලය තුළ විශේෂ වැටලීම් සිදුකර මෙම අත්අඩංගුවට ගැනීම් සිදු කර ඇත.

ඒ අනුව සැකකරුවන් 171ක් සමග හෙරොයින් ග්‍රෑම් 160 මිලි ග්‍රෑම් 758ක්, ගංජා ග්‍රෑම් 274 මිලි ග්‍රෑම් 377ක් සමග සැකකරුවන් 94ක්, නීති විරෝධි මත් පැන් බෝතල් 507 ක් සමග සැකකරුවන් 85ක්, ගෝඩා ලීටර් බැරල් 24ක් සමග සැකකරුවන් 10ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 518මිලි ග්‍රෑම් 517ක් සමග සැකකරුවන් 07ක් අත්අඩංගුවට ගෙන ඇති අතර ගංජා මිශ්‍ර මාවා, දුම් කුඩු, රා, නීති විරෝධි සිගරට්, ප්‍රසිද්ධ ස්ථානවල මත්පැන් පානය කිරීම සහ නීති විරෝධි සම්භාහන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සැකකරුවන් 33ක් අත්අඩංගුවට ගෙන තිබේ.෴

## පොලොන්නරුව දිස්ත්‍රික්කයේ වී මිල දී ගැනීමේ මධ්‍යස්ථාන 14ක් විවෘතයි

**ඇම්.පී. සරත් පොලොන්නරුව දිසා සමූහ**

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ වී අස්වනු නෙලීමත් සමඟ වී අලෙවි මණ්ඩලය ගොවීන්ගේ වී මිලදී ගැනීමේ කටයුතු ආරම්භ කර ඇතැයි වී අලෙවි මණ්ඩලයේ පොලොන්නරුව දිස්ත්‍රික් ප්‍රාදේශීය කළමණාකාර නිමල් ඒකනායක මහතා කීය. සෑම වර්ෂයකම වී කිලෝවක් රුපියල් 50කට ද නෙත වී කිලෝවක් රුපියල් 44කට මිල දී ගනු ඇත. මෙවර වී මෙට්‍රික් ටොන් 30000ක් මිලදී ගැනීමට මණ්ඩලය සූදානම් වී සිටිති. අක්කර 05 ගොවියකුගෙන් වී කිලෝ 5000ක් මිල දී ගන්නා අතර දැනට වී මිල දී ගැනීමේ මධ්‍යස්ථාන 14ක් විවෘත කර ඇතැයි වී අලෙවි මණ්ඩලයේ පොලොන්නරුව දිස්ත්‍රික් ප්‍රාදේශීය කළමණාකාර නිමල් ඒකනායක මහතා කීය.

## කොළඹ ඩී. ඇස්. සේනානායක විදුහලට බහුකාර්ය ගොඩනැගිල්ලක්

අඩ සියවසක සාඩම්බර අතීතයකට උරුමකම් කියන කොළඹ ඩී. ඇස්. සේනානායක විදුහල් මාතාවෙගේ වර්තමානයේ අඩුපාඩුවක්ව පවතින ආපනශාලාව සහ අ. පො. ස. උසස් පෙළ තාක්ෂණික විෂය ධාරාව සඳහා වෙන්වූ බහුකාර්ය ගොඩනැගිල්ලේ පළමු අදියර ලෙස පාසලේ දරුවන්ට ඉතා ඉක්මනින් අවශ්‍යව පවතින පන්ති කාමර සමූහයක් ඉදිවෙයි. මෙහි ඉදිකිරීම් සඳහා රු. මිලියන 21 ක් පමණ දැනට වැයවී ඇත.

## කරු ජයසූරියට එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකත්වය තිබේදැයි පරීක්ෂණයක් පවත්වන්න

### හිටපු එජාප පාර්ලිමේන්තු මන්ත්‍රී සන්දිත් සමරසිංහ

**රඹුක්කන විශේෂ - ඔස්වල්ඩ් ගොඩකුඹුර**

හිටපු කථානායක කරු ජයසූරිය මහතා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයකු නොවන බව තමා වගකීමෙන් යළි ප්‍රකාශ කරන බවත් එතුමා තවදුරටත් පක්ෂයේ සාමාජිකයකු යැයි ප්‍රකාශ කරන්නේ නම් ඒ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙස තමා පක්ෂයේ මහලේකම්ගෙන් ඉල්ලා බවත් යැයි කෑගලු දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සන්දිත් සමරසිංහ මහතා පැවසීය.

31ද පස්වරුවේ කෑගල්ල රන්දෙණියේ පිහිටි නිවෙසේදී මාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් සන්දිත් සමරසිංහ මහතා එම අදහස් ප්‍රකාශ කළේය. එහිදී තවදුරටත් කථා කළ ඒ මහතා මෙසේ ද කීය.

'හිටපු කථානායකතුමා සමඟ අපට ගැටුමක් නැහැ. අපි ගරු කරන පුද්ගලයෙක්. එතුමා 2015 මහ මැතිවරණයෙන් පසුව කථානායක ලෙස පත්වුවා. ඊට පසුව ව්‍යවස්ථාදායක සභාවේ සභාපති වුණා. ඒ සමගම එතුමා නිර්පාක්ෂික වූවා. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් පක්ෂ අරමුදලට රුපියල් පන්දහස බැගින් මාසිකව කපා ගත්තා. එතුමා කථානායක නිසා එම මුදල් කපාගත්තේ නැහැ. එතුමා මැතිවරණවලදී ස්වාධීන වුණා. ජනාධිපතිවරණය, 2020 මහමැතිවරණය වැනි අවස්ථාවලදීත් එලෙසම සිටියා. දේශපාලනය තුළ නිහඬව සිටින බව කීවා. ඒ අනුව තමයි එතුමා පක්ෂයේ කටයුතු කළේ නැහැ කියලා අපි කීවේ. කථානායකතුමන් පසුගිය 26ද ප්‍රකාශයක් කළා මැතිවරණයේදී තමාගේ බැණාටවත් උදව් කළේ නැහැ කියලා. එසේ තිබියදී එතුමාගේ මාධ්‍ය අංශය ප්‍රකාශයක් කරනවා එතුමා එක්සත් ජාතික පක්ෂයේ යාවජීව සාමාජිකයෙක් කියල. 2019 සාමාජික ටිකට්පත 2020ටත් වලංගුයි කියලා කියනවා. රුපියල් දහස බැගින් අය කරගෙන සාමාජික ප්‍රවර්ධන වැඩසටහන අපි 2020ට තවම පටන්ගෙන නැහැ. දින 53 ආණ්ඩුව පිහිටවූ අවස්ථාවේදී මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය රැකගැනීමට එදා කථානායක ලෙස එතුමා විශාල ශක්තියක් ලබාදුන්නා. ඒ වෙනුවෙන් එතුමාට රටේ බහුතරයගේ විශාල ගෞරවයක් හිමි වුණා. ඒත් කිසියම් පිරිසක් එතුමා අපහසුතායට පත් වන ආකාරයට පෙළඹීමක් සිදු කරන බව දක්නට තිබෙනවා. කෙසේ වෙතත් මේ ප්‍රකාශ කළ පරිදි එතුමාට පක්ෂ සාමාජිකත්වය තිබෙනවාද යන්න පිළිබඳව පරීක්ෂණයක් පවත්වන ලෙස පක්ෂයේ මහලේකම්තුමාගෙන් මම ඉල්ලා සිටිනවා.'

## මහවැලි කලාපයේ බදු ඉඩම්වල නිසි ඵල නැති නම් නැවත ගන්නවා

### රාජ්‍ය අමාත්‍ය සිරිපාල ගම්ලත්

**ඇම්.පී. සරත් - පොලොන්නරුව දිසා සමූහ**

මහවැලි කලාපවල ආයෝජකයන්ට බදු පදනම මත ලබාදී ඇති ඉඩම්වලින් අපේක්ෂිත අරමුණු ඉටු නොවන්නේ නම් එම ඉඩම් යළි මහවැලියට පවරා ගන්නා ලෙස මහවැලි කලාප ආශ්‍රිත ඇළ වේලි සහ ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය සිරිපාල ගම්ලත් මහතා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, ඉංජිනේරු සුසිල් එස්. පෙරේරා මහතාට උපදෙස් දුන්නේය. මේ සම්බන්ධයෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට, වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මහතාටද නිල වශයෙන් දැනුම් දෙන බවද සිරිපාල ගම්ලත් මහතා කීය. ඇතැම් ආයෝජකයන් මහවැලි අධිකාරියට සිය බදු මුදල ගෙවමින් ඉඩමේ බදු හිමිකම් දීර්ඝ කිරීම පමණක් සිදු කර තිබෙන අතර මේ දක්වා කිසිදු ව්‍යාපෘතියක් ආරම්භ කර නැත.

ඇතැම් ආයෝජකයන් ව්‍යාපෘති සඳහා ලබාගෙන ඇති ඉඩම් ප්‍රමාණයේ ව්‍යාපෘති ආරම්භ කර ඇත්තේ සමස්ත ඉඩමෙන් 10%ක් වැනි සුළු කොටසක පමණි. මහවැලි කලාපවල නිරීක්ෂණ සංචාරයකදී මහවැලි ඉඩම්වල සාර්ථක සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කළ ආයෝජකයන් සම්බන්ධයෙන්ද අමාත්‍යවරයාගේ අවධානය යොමු විය. වසර ගණනාවක් මෙලෙස ඉඩම්වලින් නිසි ප්‍රයෝජන නොගෙන තිබීම ගැටලුවක් බවත් ඉදිරියේදී ආයෝජකයන්ට මහවැලි කලාපවල ඉඩම් ලබාදීමේ නිසි විමර්ශනයකට ලක් කිරීමෙන් පසුව සිදු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, ඉංජිනේරු සුසිල් එස්. පෙරේරා මහතා මෙහිදී කියා සිටියේ නිසි ලෙස සංවර්ධන කටයුතු ආරම්භ නොකළ ආයෝජකයන්ගේ ඉඩම් නැවත මහවැලියට පවරා ගන්නා බවත්, එවැනි ඉඩම් කොටස් 120ක් දැනටමත් පවරාගෙන ඇති අතර කෘෂිකර්මාන්තය සඳහා හෙක්ටයාර් 15000ක් ආයෝජකයන්ට මෙන්ම ගොවි සංවිධානවලට ලබාදී ඇති බවත් ඒ මහතා කීය.

## යාල රක්ෂිතයෙන් කැපූ දැව තොගයක් සමඟ පුද්ගලයෝ දෙදෙනෙක් අත්අඩංගුවට

**ඒ.ටී. කහඳුගොඩ - වීරකැටිය සමූහ**

යාල වනරක්ෂිතයෙන් කපා ගත් අගිල් දැව තොගයක් අත් ට්‍රැක්ටර් දෙකකින් ප්‍රවාහනය කරමින් සිටි පුද්ගලයන් දෙදෙනකු 31ද දහවල් රන්මිණිතැන්න ඔසුවින්නේ දී අත්අඩංගුවට ගත් බව තිස්සමහාරාම පොලිසිය පවසයි.

අත්අඩංගුවට පත් සැකකරුවන්ගෙන් කළ ප්‍රශ්නකිරීම් වලින් පසු එක් සැකකරුවකුගේ නිවස පිටුපස කැලයේ සඟවා විකිණීමට සූදානම් කර තිබූ කියුබ් 06කින් යුත් තවත් අගිල් දැව තොගයක්ද සොයා ගැනීමට පොලිසියට හැකි වී තිබේ. මෙම සැකකරුවන් දෙදෙනා 01ද පෙරවරුවේ තිස්සමහාරාම මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි.

තිස්සමහාරාම පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක කේ.ඩී.කාරියවසම් මහතාගේ මෙහෙයවීම යටතේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති, උප පොලිස් පරික්ෂක නිමල් පොලිස් සැරයන් ක්‍රිෂාන්ත (39730), කොස්තාපල්වරුන් වන කෝනාර (69551) පුෂ්පකුමාර (68481) රූපසිංහ(76846) බණ්ඩාර (92779) සහ කොස්තාපල් රියදුරු දිසානායක (21355) යන නිලධාරීහු දැව තොගය සමග සැකකරුවන් අත්අඩංගුවට ගත්හ. සුවඳ විලවුන් සහ හඳුන්කූරු නිෂ්පාදනය කිරීම සඳහා මෙම අගිල් ශාකය යොදා ගන්නා බැවින් යාල රක්ෂිතයේ මහා පරිමාණයෙන් මෙම දැව සංහාරය සිදුවන බවද වාර්තා වේ.



# වවුනතිව් ප්‍රහාරයට අජන්තන් අල්ලා සහරාන්ට රට බිලි ගැනීමට සීඅයිඩීය පාර කැපූ හැටි

2019 වර්ෂයේ පාස්කු ඉරිදා (අප්‍රේල් 21) යනු මෙරට ඉතිහාස පොතේ කඳුළින් ලියැවුණු තවත් එක් දිනයකි. මේ ප්‍රහාරය වළක්වා ගැනීමට ඕනෑ තරම් ඉඩකඩ තිබිණි. දැනට පැවැත්වෙන පාස්කු ප්‍රහාරය ගැන විමසන කොමිසමට ඉදිරිපත් වන සාක්ෂිවලින් ඒ බව මනාව ඔප්පු වෙමින් පවතී.

එවකට යහපාලන රජය කර වූ ආරක්ෂාව භාරව සිටි ප්‍රධානියාගේ සිට ඉහළ බලධාරීන් සියල්ලක්ම පාහේ තමාට පැවරී ඇති කාර්ය භාරය හරි හැටි තේරුම් නොගැනීම ප්‍රහාරය වැළැක්වීමට නොහැකි වූ එක් කරුණකි. එසේම දුරකතන ඇමතුම් මගහැරීම ලැබුණ බුද්ධි තොරතුරු විහිළුවකට ගැනීම ආදිය ද මේ ප්‍රහාරය වළක්වා ගැනීමට තිබූ සියලු මං අහුරා දැම්මේය.

මෙම ප්‍රහාරයේ වගකීමේ වැඩි බරක් පැටවිය යුත්තේ එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (සී.අයි.ඩී.) අධ්‍යක්ෂව සිටි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ශානි අබේසේකරගේ හිස මත යැයි කිව හොත් ඔබ එය පිළිගන්නවාද? මෙය නියපොත්තෙන් කැඩීමට හැකිව තිබුණ සිද්ධියකි. එහෙත් එය පොරොවෙන් කැපීමට පවා නොහැකි තත්ත්වයකට ගෙනාවේ මෙරට අංක එකේ රහස් පරීක්ෂකයකු වූ ශානි, මෙන්ඩිස් ඇතුළු කල්ලිය විසිනි. ඒ ඔවුන් තවුහිද් ජමාත් සංවිධානයේ ප්‍රහාරවල විමර්ශන කරගෙන ගියේ වලහා හාවා කිරීමේ න්‍යායට අනුව වීම නිසාය.

## ■ වලහා හාවා කිරීමේ න්‍යාය

ලෝක පොලිස් සංචිතයේ අපරාධ විමර්ශනයෙහිලා සුවිශේෂ ඒකක බොහෝය. ඒ අතර සී.අයි.ඒ., ඉන්ටර් පෝල් වැනි ඒකක මුළු ලෝකයේම ප්‍රසිද්ධ වී ඇත්තේ අපරාධ විමර්ශනයේ අතිදක්ෂයන් ලෙසය. ඒ අතරට අප රටේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ද අයත් ය.

මේ ලෝක පොලිස් සංචිතයේ ප්‍රධානියාට සුවිශේෂී ඒකකවල දක්ෂතා උරගා බැලීමට අවශ්‍ය විය. ඔහු ඒ සඳහා යොදා ගත්තේ හාවෙකි. මෙම හාවා මහ කැලෑවකට මුදාහැරිය අතර ඒ එක් එක් ඒකකවලට ලබා දුන් ඉලක්කය වූයේ හාවා සොයාගෙන එන ලෙසය.

මුලින්ම යන්නේ සී.අයි.ඒ. කණ්ඩායමකි. නියමිත දින ගණන කැලෑව පීරුව ද ඔවුන්ට හාවා සොයා ගන්නට ලැබුණේ නැත. පරාජය බාරගත් ඔවුන් කැලෑවෙන් පිටතට පැමිණ හාවා සොයාගැනීමට නොහැකි වූ බව ප්‍රධානියාට පැවසුවේය.

ඊළඟට යන්නේ ඉන්ටර්පෝල් කණ්ඩායමකි. කැලෑව පීරා සෙව්වත් හාවා සොයා ගන්නට හැකි වූයේ නැත. ඔවුහු පරාජය බාරගෙන තරගයෙන් ඉවත් වූහ. ඊළඟට හාවා සොයා කැලෑ වැදුණේ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ සී.අයි.ඩී. යයි.

කෙලෙසක හෝ හාවා අල්ලාගෙන ලෝක පොලිසිය පරාජය කිරීමේ අධිෂ්ඨානයෙන් කැලෑවට බට මොවුන්ට ද හාවා සොයා ගන්නට හැකි වූයේ නැත. මොවුන් ඉදිරියට වලහෙක් පැමිණෙන්නේ ඔය අතරතුරය.

"අපි මූව අල්ලලා ගහලා කියමු. මම තමයි හාවා කියන්න කියලා."

ඒ ප්‍රධානියාගේ යෝජනාවය. එයට කණ්ඩායමේ සියල්ලෝම එකඟතාව පළ කළහ. වලහා අල්ලාගත් මොවුන් උඹ හාවා නේදැයි අසන්නට විය. "අපෝ නෑ මම වලහෙක්." එලෙස පැවසූ වලහාට අත් වූ ඉරණම බොහෝ ඛේදජනකය. ඌට හොඳ හැටි පහරදුන් මේ පිරිස "මම තමයි හාවා" කියා කියන ලෙසින් තර්ජනය කළේය.

තවදුරටත් ගුටිකෑමට නොහැකි වූ තැන තමා හාවා බව පිළිගැනීමට වලහා කැමැත්ත පළ කළේය. ඒ අනුව වලහා හාවා කර පෙන්වා ලෝක පොලිස් ලොක්කාගේ ගෞරවාදරයට පාත්‍රවීමට ඔවුන්ට හැකි විය. ගරු නම්බු නාම තානාන්තර, ඩබල් ප්‍රමෝෂන් ආදිය ද පිරිනැමුණු අතර හාවා වූ වලහාට හිමි වූයේ සදාකාලික දුක වේදනාව පමණි.

## ■ මේ න්‍යාය පාස්කු ප්‍රහාරයට උපමා වන අයුරු

දෙදහස් දහඅට වර්ෂයේ නොවැම්බර් මස තිස් වනදාට පහන් වූයේ මෙරට ජනතාව දැඩි භීතියකට පත් කරවන ආරංචියක් සමගය. එම ආරංචිය වූයේ මඩකලපුව පොලිස් කොට්ඨාසයට අයත් වවුනතිව් පොලිස් ස්ථානයට අනුබද්ධව ස්ථාපනය කර තිබූ මුරපොළේ රාත්‍රී රාජකාරියේ යෙදී සිටි කොස්තාපල්වරුන් දෙදෙනා මරා දමා ඇති බවය.

කොස්තාපල් (82162) නිරෝෂන් ඉන්දික ප්‍රසන්න උඩුගම සහ කොස්තාපල් (8624) ගනේෂ් දිනේෂ් මෙම මුරපොළේ රාජකාරි සඳහා පිටත්ව යන්නේ පෙර දින එනම් 29 වනදා සවස් යාමයේය. ආරක්ෂාව සඳහා මොවුන්ට ලබා දී තිබූ රිවෝල්වර දෙක ද ඝාතකයන් රැගෙන ගොස් තිබිණි.

දිනේෂ් මිය ගොස් ඇත්තේ හිසට එල්ල වූ වෙඩි පහරවලිනි. ඉන්දිකගේ ගෙල වෙන් වන තරමටම කපා දමා ඇත. ඔහු ඝාතනය වීමට පෙර සතුරා සමග පොර බදා ඇති බවක් ද පෙනෙන්නට තිබිණි.

ඇසූ දුටු සැණින් කාගේත් අදහස වූයේ මෙය යළි පිබිදෙන්නට දඟලන එල්.ටී.ටී.ඊ. සංවිධානයේ වැඩක් ලෙසය. ඊට මුල් වූ හේතු කිහිපයක් ද තිබිණි. ඉන් එකක් වූයේ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ මහ විරු දිනය යෙදී තිබුණේ මෙම ද්විත්ව ඝාතනයට දින තුනකට එනම් නොවැම්බර් මස 26 වනදාට වීමය. එල්.ටී.ටී.ඊ. නායක වේළුපිල්ලේ ප්‍රභාකරන්ගේ ජන්ම දිනයයි.

එදිනට මහ විරු දින උත්සව පැවැත්වීමට සෑම වර්ෂයකම එල්.ටී.ටී.ඊ. හිතවාදීන් ක්‍රියා කරද්දී රජය ඊට තහනම් නියෝග පැනවීය. ප්‍රභාකරන්ගේ මස්සිනා වන සිවාජිලිංගම් මේ තහනම නොතකා සෑම වර්ෂයකම සිහිකිරීමේ උත්සව පවත්වද්දී 2018 වර්ෂයේ එයට ඉඩක් ලැබුණේම නැත. ඒ අනුව කාගේත් අදහස වූයේ පහන් පත්තු කොට සැමරීමට නොහැකි වූ මහ විරු දිනය ලෙයින් සමරා ඇති බවකි.

මඩකලපුව කොට්ඨාසය බාර පොලිස් අධිකාරීවරයාගේ නියෝග හා උපදෙස්වලට අනුව වවුනතිව් පොලීසිය විමර්ශන ආරම්භ කළ නමුත් ඝාතන සිදුවී දින කිහිපයක් ගත වනතුරුත් ඔවුන්ට සැකකරුවන් ගැන අංශු මාත්‍රයක්වත් තොරතුරක් සොයා ගන්නට හැකි වූයේ නැත. සැක කටයුතු පුද්ගලයන් කිහිපදෙනකුම කැඳවා කටඋත්තර ලබා ගත් නමුත් මෙම ද්විත්ව ඝාතනය ගැන ඔවුන්ගෙන් කිසිම තොරතුරක් හෙළි කර ගන්නට නොහැකි විය.

මෙරට සිදුවන විසඳා ගැනීමට අපහසු පැටලිලි සහිත අපරාධ විමර්ශනය කිරීමට පොලිසිවල නිලධාරීන්ට එතරම් හැකියාවක් නැත. ඒ සඳහා උපන් හපන්කම් ඇති ෂර්ලොක් හෝම් පරපුරෙන් පැවත එන නිලධාරීන් සිටින්නේ සී.අයි.ඩී.යේය. ඒ අනුව වවුනතිව් පොලිස් නිලධාරීන් ඝාතනයේ විමර්ශන සී.අයි.ඩී.යට පැවරීමට බලධාරීහු කටයුතු කළහ. එවකට සී.අයි.ඩී.යේ අධ්‍යක්ෂවරයා වූයේ රට හෙල්ලූ අපරාධ රැසක් සාර්ථකව විසඳා පොලීසියේ සහ ත්‍රිවිධ හමුදාවේ නිලධාරීන් පෝලිමට සිරගෙටත් එතැනින් එහා එල්ලුම් ගසටත් යැවූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකරය.

## ■ ඝාතනවලට වගකිවයුත්තන් සෙවීමේ මෙහෙයුම

ශානිගේ විශ්වාසවන්ත මෙන්ම ළඟම ගෝලයා ද වූයේ එවකට සැරයන් (දැන් ඔහු උප පොලිස් පරීක්ෂකවරයෙකි.) මෙන්ඩිස්ය. ඒ අනුව වවුනතිව් පොලිස් මුරපොළේ ඝාතනවලට වගකිවයුත්තන් සෙවීමේ මෙහෙයුම බාර වූයේ මෙන්ඩිස්ටය. ඔහු කණ්ඩායමක් ද සමග මඩකළපුවට ගොස් විමර්ශන ඇරැඹීය.

අතිසාර්ථක විමර්ශනයක යෙදුණ සී.අයි.ඩී. කණ්ඩායම වවුනතිව් ප්‍රහාරයට වගකිව යුතු තිදෙනකු ගැන තොරතුරු සොයා ගත්තේය. ඔවුන් අතරින් දෙදෙනෙක් වව්නතිව් හිදී අත්අඩංගුවට ගත්ත ද ප්‍රධාන සැකකරු යැයි සැලකූ පුද්ගලයා ප්‍රදේශය හැර පලා ගොස් තිබිණි. ඔහු කිලිනොච්චියට ගොස් ඇති බව ද සී.අයි.ඩී.ය හෙළි කර ගත්තේය.

ඔහු වහාම අල්ලන ලෙස සී.අයි.ඩී.ය කළ දැනුම්දීමට අනුව කිලිනොච්චියේ සියලු පොලිස් ස්ථාන එක්ව ඔහු සොයන්නට විය. අවසානයේ ඔහු අල්ලා ගන්නා අතර, පසුව ඔහු මඩකලපුවට යැවිණි. ඔහු ද සිය භාරයට ගත්ත සී.අයි.ඩී. කණ්ඩායම මඩකළපුව කොට්ඨාසයේ පොලිස් නිලධාරීන්ට කළ නොහැකි වූ විමර්ශනය අතිසාර්ථක ලෙස අවසන් කොට රාළහාමිලා ඝාතනය කළ තිදෙනා ද රැගෙන මහ උජාරුවෙන් කොළඹට පැමිණියහ.

මේ තිදෙනා අතර සිටි අජන්තන් යන අය පුනරුත්ථාපනය වූ හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයෙකි. ඔහු ධීවර වෘත්තියේ යෙදෙමින් සිය දරු පවුල රැකගෙන ජීවත් වූවත් වවුනතිව් ප්‍රහාරයේ සැකය එක එල්ලේම එල්ල වූයේ ඔහු වෙතය. ප්‍රශ්න කිරීමෙන් අනතුරුව අනෙක් දෙදෙනා මුදාහළ නමුත් අජන්තන්ට එසේ ගැලවී යාමට ඉඩකඩ ලැබුණේ නැත.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අධිකරණයට ඉදිරිපත් කෙරුණු අජන්තන් රඳවා ප්‍රශ්න කිරීමට අවසර ලබාගන්නට සී.අයි.ඩී.ය කටයුතු කළේය. එම අවසරය ලැබුණු අතර, ඔහුගෙන් දිගින් දිගටම ප්‍රශ්න කෙරීය.

"පොලිස්කාරයො දෙන්න මැරුවේ උඹ නේද?" සී.අයි.ඩී. විමර්ශන නිලධාරීන් එලෙස ගුගුරද්දී "අනේ සර් මම මොකුත් දන්නෙ නෑ. මම පොලීසියේ මහත්තුරු මැරුවේ නෑ" ලෙසින් ඔහු පුන පුනා කී වදන් සී.අයි.ඩී. මහත්වරුන් දැඩිව ප්‍රතික්ෂේප කළේය.

කොපමණ ප්‍රශ්න කෙරුව ද, මොන තරම් වධ හිංසා කළ ද අජන්තන් පවසන්නේ මේ ප්‍රහාරය ගැන තමා කිසිවක් නොදන්නා බව ය. එහෙත් සී.අයි.ඩී.යේ අති දක්ෂ රහස් පරීක්ෂකයන්ගේ එකම අභිප්‍රාය වූයේ කොයි ක්‍රමයකින් හෝ මොහුගෙන් ඇත්ත වමාරවා ගන්නටය.



කොස්තාපල් ගනේෂ්

කොස්තාපල් නිරෝෂන්

මොහු අධිකරණයට ඉදිරිපත් කොට රක්ෂිත බන්ධනාගාරගත කිරීමට හෝ ඇප ලබාදීමට සී.අයි.ඩී.ය කටයුතු කළේ නැත. ඒ ඝාතනය කෙරුණ කොස්තාපල්වරුන් සතුව තිබූ රිවෝල්වර දෙකත්, ඝාතන සිදු කළ ගිනි අවිත් සොයා ගැනීමට අවශ්‍ය වූ නිසාය.

වවුනතිව් ද්විත්ව ඝාතනය සිදුවී හරියටම මාස හතරකුත් දින විසිතුනක් ගෙවී ගිය 2019 අප්‍රේල් මස 21 වන පාස්කු ඉරිදා උදේ මෙරට පල්ලි හතරක් ද සංචාරක හෝටල් තුනක් ද ඉලක්ක කොට මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර එල්ල විය.

## ■ ප්‍රහාරකයන්ගේ ගොදුරු

කොච්චිකඩේ සාන්ත අන්තෝනි දෙව්මැදුරත්, කටාන සාන්ත සෙබස්තියන් දෙව්මැදුරත්, මඩකලපුවේ සියොන් දේවස්ථානය ද මරාගෙන මැරෙන බෝම්බකරුවන් විසින් පුපුරුවා හැරියේය. ෂැන්ග්‍රිලා, කිංස්බරි සහ සිනමන් ග්‍රෑන්ඩ් යන හෝටල් ද ප්‍රහාරකයන්ගේ ගොදුරු බවට පත්විය. මෙම පිපිරීම්වලින් තුන්සියයකට අධික පුද්ගල සංඛ්‍යාවක් මිය ගියහ. ඔවුන් අතර විදෙස් ජාතිකයන් ද සිටීම මෙරට සංචාරක කර්මාන්තය මහත් අගාධයකට ඇද දැමූ කරුණක් විය.

මෙම ප්‍රහාරය ගැන රාජ්‍ය බුද්ධි අංශ මෙන්ම රජය කර වූ සියල්ලෝම දැන සිටි බව මේ වනවිට තහවුරු වුවත්, එදා ප්‍රහාරය එල්ල වූ අවස්ථාවේ ඒ සියල්ලෝම අන්ද මන්ද වූයේ මෙය කාගේ වැඩක් දැයි සිතා ගැනීමට පවා නොහැකිවය.

මේ ප්‍රහාර මාලාව අයි.එස්.අයි.එස්. අන්තවාදී සංවිධානයට අනුබද්ධව මෙරට ක්‍රියාත්මක වන ජාතික තවුහිද් ජමාත් සංවිධානය විසින් මෙම ප්‍රහාරවලින් එල්ල කළ බව පැයක් දෙකක් පමණ ගතවෙද්දි තහවුරු විය. මෙම කල්ලියේ මෙරට නායකයා කාත්තන්කුඩියේ පදිංචි මවුලවිවරයකු වූ සහරාන් හෂීම් බවට හඳුනා ගත් අතර, ෂැංග්‍රිලා හෝටලයේදී මරාගෙන මැරුණු අන්තවාදීන් දෙදෙනාගෙන් එක් අයකු ඔහු බව ද එදිනම තහවුරු කර ගනු ලැබීය.

මේ ප්‍රහාර එල්ල වී පැය හතරක් පහක් පමණ ගත වීමෙත් අනතුරුව රට පුරා ඇඳිරිනීතිය පැනවීමට එවකට බලධාරීහු කටයුතු කළහ. අනතුරුව රට පුරා සෝදිසි මෙහෙයුම් දියත් කැරිණි. මුස්ලිම් ජාතිකයන් වැඩි වශයෙන් ජීවත්වන ප්‍රදේශ මෙන්ම කොළඹ හා අවටත් රටේ ප්‍රධාන නගර සියල්ලත් ආවරණය වන පරිදි මෙම සෝදිසි ව්‍යාප්ත කෙරිණි. ඊට සාමාන්‍ය මහජනතාවගෙන් නොමඳ සහයක් ලැබිණි.

පොලීසිය, යුද හමුදාව ඇතුළු ත්‍රිවිධ හමුදාවත්, පොලිස් විශේෂ බළකායත් මෙලෙස මෙහෙයුම්වල යෙදෙද්දී නැගෙනහිර පළාතේ මෙහෙයුම්වල නිරත භට පිරිසකට යම් තොරතුරක් ලැබෙන්නේ ප්‍රදේශවාසියකුගෙනි. එම තොරතුර වූයේ සහරාන් හෂීම්ගේ රියැදුරා ලෙස කටයුතු කළ මොහොමඩ් ෂරීෆ් ආදම් ලෙබ්බේ නොහොත් ගෆූර් මාමා ධීවර සංස්ථාව පාර, නව කාත්තන්කුඩිය දරන ලිපිනයේ සැඟවී සිටින බව ය.

කාත්තන්කුඩි පොලීසියේ ස්ථානාධිපතිවරයා ඇතුළු කණ්ඩායමකට පසු දිනට අලුයම් වෙද්දි මොහු අත්අඩංගුවට ගැනීමට හැකි විය. ප්‍රශ්න කිරීමේදී ඔහු පවසා සිටියේ දෙදහස් දහඅට වර්ෂයේ නොවැම්බර් මස තිස්වනදා අලුයම වවුනතිව් පොලිස් මුරපොළේ රාජකාරියේ යෙදී සිටි කොස්තාපල්වරුන් දෙදෙනා ඝාතනය කළේ තමන් ඇතුළු ජාතික තව්හිද් ජමාත් සංවිධානයේ කණ්ඩායමක් විසින් බව ය.

වැඩිදුර විමර්ශන සඳහා මොහු සී.අයි.ඩී.යට බාර කෙරිණි. අනතුරුව අනෙක් සැකකරුවන් තිදෙනාගෙන් දෙදෙනකු අත්අඩංගුවට ගත්තේ සී.අයි.ඩී.යෙනි. කාත්තන්කුඩි ධීවර වරාය පාරේ පදිංචි අබ්දුල් මනාස් මොහොමඩ් ෆිරදවුඩ් හා කාත්තන්කුඩිය එම්. ජේ. එච්. පටුමග පදිංචි හම්සා මොහිදීන් මෙලෙස අත්අඩංගුවට ගත් අතර, අනෙක් පුද්ගලයා වන මිල්හාන් යන අය ඒ වනවිට මක්කම වන්දනාවේ ගොස් ඇති බවත්, ඔහු යළි මෙරටට පැමිණීම සඳහා අබුඩාබියට ගොස් ඇති බවත් අනාවරණය විය.

## ■ අපරාධ රැසක සුලමුල හෙළි වේ

රඳවාගෙන කළ ප්‍රශ්න කිරීමේදී වවුනතිව් පොලිස් කොස්තාපල්වරු ඝාතනය ඇතුළු මොවුන්ගෙන් අපරාධ රැසක සුලමුල හෙළි කළේ ගෆූර් මාමාය. දෙදහස් දහනවයේ මාර්තු මස නව වැනිදා රාත්‍රියේ මාවනැල්ල ධනාගම ප්‍රදේශයේදී වෙඩි තබා පුද්ගලයකුට බරපතළ තුවාල සිදුකර තිබිණි. ඔහුට වෙඩි තැබුවේ කවුරුද කුමන හේතුවක් නිසා ද යන්න ඒ සම්බන්ධයෙන් විමර්ශන කළ කණ්ඩායම්වලට සොයා ගැනීමට හැකිව තිබුණේ නැත.

ප්‍රශ්න කිරීමේදී ගෆූර් මාමා පැවසුවේ මොහොමඩ් රාසික් මොහොමඩ් තස්ලීම් නමැති එම පුද්ගලයාට වෙඩි තැබුවේ ඔහු සහරාන් ප්‍රමුඛ සංවිධානය ප්‍රතික්ෂේප කළ නිසා බවය. ඔහුට වෙඩි තැබුවේ වවුනතිව්හිදී ඝාතනය කළ පොලිස් නිලධාරීන්ගෙන් පැහැර ගත් රිවෝල්වර දෙකෙන් එකකින් බවත් පැවසුවේය.

ගෆූර් මාමාගේ මගපෙන්වීමට අනුව මෙම රිවෝල්වර දෙක ද සොයා ගැනීමට හැකි විය. ඉන් එකක් සොයා ගත්තේ තින්දවුර්හි පවත්වාගෙන ගිය තව්හිද් ජමාත් සංවිධානයට අයත් ආරක්ෂක නිවාසයක සඟවා තිබියදීය. එම රිවෝල්වරය ඇතුළු තවත් අවි ආයුධ රැසක් එම නිවෙසේ තිබී සොයා ගැනිණි.

අනෙක් රිවෝල්වරය හමුවන්නේ වනාතවිල්ලුවේ මීට පෙර පුපුරන ද්‍රව්‍ය ඇතුළු උපකරණ සොයා ගත් වත්තෙනි. බැරලයක බහා ගෙවත්ත පිටුපස වළ දමා තිබූ අතර, එහි තිබී එම රිවෝල්වරයට අයත් ජීව පතරොම් පහක්, ටී-56 ගිනි අවියක්, එම පතරොම් විසිහතරක් සහිත මැගසිනයක්, විදේශීය රටක නිෂ්පාදිත මයික්‍රෝ පිස්තෝලයක් සහ එම මැගසිනය, දේශීයව නිෂ්පාදිත රිවෝල්වර හයක් ඇතුළු උපකරණ එම බැරලයේ තිබී හමු විය.

මීට පෙර වනාතවිල්ලුවේ ඉඩමේ තිබී පුපුරණ ද්‍රව්‍ය, රසායනික ද්‍රව්‍ය ඇතුළු ආයුධ සොයා ගත්තේ ද සී.අයි.ඩී.යමය. ඒ ඊට පෙර මාවනැල්ලේ බුදුපිළිම කැඩීමේ සිද්ධියට අදාළව අත්අඩංගුවට ගත් සැකකරුවන්ගෙන් හෙළි වූ තොරතුරුවලට අනුවය.

එදා බුදුපිළිම කැඩීමේ සිද්ධියේ විමර්ශන මාවනැල්ල කොට්ඨාසය බාරව සිටි පොලිස් අධිකාරිවරයාගේ අධීක්ෂණයෙන් යුතුව එම කොට්ඨාසය බාර සහකාර පොලිස් අධිකාරීවරයා ඇතුළු කණ්ඩායමක් අපූරුවට කරගෙන ගියේය.

විමර්ශන අවසන් වන්නට ඔන්න මෙන්න තිබියදී ඒ සඳහා ද සී.අයි.ඩී.ය යෙදවීමට එවකට බලධාරීන් කටයුතු කළේය. ඒ අනුව මාවනැල්ල බුදුපිළිම සිද්ධියේ විමර්ශන බාරගත් සී.අයි.ඩී.ය වනාතවිල්ලුව ඉඩමෙන් අවි සොයා ගත්තා මිස ඉන් එහාට ගැඹුරු විමර්ශනයක යෙදුණේ නැත. එලෙස කළේ නම් පාස්කු ප්‍රහාරය ගැන තොරතුරු අනිවාර්යයෙන්ම හෙළි කර ගැනීමට ඉඩ තිබිණි.

ඉන් අනතුරුව සිදු වූ වවුනතිව් ද්විත්ව ඝාතනය සම්බන්ධයෙන් සී.අයි.ඩී.ය විමර්ශන කරගෙන ගියේ රටේ තොටේ ප්‍රචාරය වෙමින් තිබූ කටකතාවලට අනුවය. එනම් කාගේත් මුවින් පිට වූ "එල්.ටී.ටී.ඊ.යේ යළි පිබිදීම" ඉලක්ක කරගෙනය.

ඒ දවස්වල නැගෙනහිර පළාත ආරක්ෂාව බාරව සිටි ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ උසස් නිලධාරීන්ගේ පවා මතය වී තිබුණේ මේක එල්.ටී.ටී.ඊ. ප්‍රහාරයක් කියලා. ඉතින් ඒ නිසා තමයි සී.අයි.ඩී.යත් ඒ මතයේ පිහිටලා විමර්ශන කළේ. කාටත් ඔය වගේ වැරදීම් වෙනවා. තායිලන්තයේ මනුස්සයෙක් අත්අඩංගුවට අරගෙන අවුරුදු 7ක් තිස්සේ හිරගත කරලා තිබිලා. මේ මෑතක තමයි මිනිහා නිවැරදිකාරයා කියලා ඔප්පුවෙලා තිබුණේ. ඔහොම දේවල් කා අතිනුත් වෙනවා. වවුනතිවු ප්‍රහාරයට අහුවෙච්ච අජන්තන් කියන හිටපු එල්.ටී.ටී.ඊ.කාරයගෙ නරක වෙලාව.

මීට සති කිහිපයකට පෙර මාගේ දුරකතන ඇමතුමකට පිළිතුරු දුන් අලුත් සී.අයි.ඩී.යේ නිලධාරියකුගේ අදහස එසේ විය.

## ■ ඇත්ත එළියට ගැනීම

ආරක්ෂක බලධාරීන් තබා කවුරු කිව්වත් සී.අයි.ඩී.ය යනු අනුන් ගහන පදේට නටන හෝ පෙනෙන්නට තියෙන දෙය ඇත්ත යැයි, නිවැරැදි යැයි සිතන පිරිසක් නොවිය යුතුය. ඔවුන්ට විමර්ශන බාරදෙන්නෙ පෙනෙන දෙයින් ඔබ්බට ගොස් නොපෙනෙන නොදන්නා දේ සියුම් ලෙස විමර්ශනය කොට ඇත්ත එළියට ගැනීම සඳහාය.

එහෙත් එදා ඒ අතිදක්ෂ විමර්ශකයන් වවුනතිව් සිද්ධියට අත්අඩංගුවට ගෙන රඳවා තබා ප්‍රශ්න කරමින් සිටි අජන්තන් මෙම ද්විත්ව ඝාතනය කළ බවට ඔප්පු කරගෙන තිබිණි. ඒ බව නිවැරැදිව ඔප්පු කිරීම සඳහා අදාළ සාක්ෂි සියල්ල ද සොයාගෙන තිබිණි. එහෙත් ඔහු අධිකරණයට ඉදිරිපත් නොකොට රඳවාගෙනම සිට ඇත්තේ කෙදිනක හෝ ඔහු කොස්තාපල්වරුන්ගේ පිස්තෝලවලට සිදු වූයේ කුමක් දැයි කියන තුරුය.

පාස්කු ප්‍රහාරය එල්ල නොවුණා නම් ඔහු තවමත් සී.අයි.ඩී.යේය. නොඑසේ නම් හිරගෙදරය. ඒ ද්විත්ව ඝාතනයට එහා ගිය ත්‍රස්තවාදයට අදාළ ගොනු කළ නඩුවක ප්‍රධාන විත්තිකරු ලෙසය.

මිනිසුන් විශාල සංඛ්‍යාවක් මිය ගොස් රටට මහා විනාශයක් වී හෝ තමා නිවැරැදිකරුවකු බව ඔප්පු වීම ගැන ඔහු එදා නිදහස ලැබූ දිනයේ බොහෝ සෙයින් සතුටට පත්වන්නට ඇත.

නිදහස ලබා අධිකරණයෙන් එළියට පැමිණ ඔහු පවසා තිබුණේ තමන් මේ සිද්ධිය ගැන කිසිවක්ම නොදන්නා බව කොපමණ කීවත් සී.අයි.ඩී.ය තමා කී දේ පිළිනොගෙන ඔවුන් කියන දේ තමාට පිළිගන්නට කී බව ය.

"මම අමාරුවෙන් දියුණු වෙන්න උත්සාහ ගත් කෙනෙක්. මම බෝට්ටුවක් අරගෙන ධීවර රස්සාව කළේ. මාස හයකට වැඩි කාලයක් සී.අයි.ඩී. එකේ හිටපු නිසා මගේ ඒ ව්‍යාපාර සේරම නැති වෙලා ගියා. මම ආපහු හිඟන්නෙක් වුණා. පොලීසියට කියන්න මේ විදියට නිරපරාදේ අහිංසක මිනිස්සු අපරාධකරුවන් කරන්න යන්න එපා" කියලා.

ඔහු එදා මාධ්‍යවේදීන් ඉදිරියේ එලෙස පවසා තිබුණේය. මේ වලහා හාවා කිරීමේ සී.අයි.ඩී. න්‍යාය නිසා නිරපරාදේ අහිංසකයෙක් එල්ලුම් ගස් යන්නට ගොස් අනූනවයෙන් බේරුණු එක් අවස්ථාවක් පමණකි. එහෙත් එය අතිශය භයානකම බරපතළම අවස්ථාව බව කිව යුතුමය.

**තක්ෂිලා ජයසේකර**

# කන්තලේ භාතියගම මෙත්තාරාම විහාරයේ ධාතු පින්කම දා...




**සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ**

අභිනවයෙන් ඉදිකරීමට නියමිත කන්තලේ භාතියගම මෙත්තාරාම විහාරස්ථානයේ චෛත්‍ය රාජයාණන් වහන්සේගේ තැන්පත් කිරීම සඳහා ධාතුන් වහන්සේ වැඩම කිරීම පසුගියදා සිදු කෙරිණි.

වැටැක්කේ සෝරත හිමියන්ගේ අවවාද අනුශාසනා පරිදි අග්‍රබෝධි වෙළුන්නා විහාරස්ථානයේ සිට ධාතුන් වහන්සේ පෙරහරකින් වැඩම කළ අතර මේ අවස්ථාවට උතුරු නැගෙනහිර දෙපළාතේ ප්‍රධාන අධිකරණ සංඝ නායක උදළුමඩ සෝමරතන හිමි, පාර්ලිමේන්තු මන්ත්‍රී කපිල අතුකෝරළ, හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් වන ආරියවතී ගලප්පත්ති, ප්‍රියන්ත පතිරණ යන මහත්ම මහත්මීහුද සහභාගි වූහ.

සතර දෙසින්
pronews@lakehouse.lk
ප්‍රාදේශීය පුවත්

## වැලිගම නීතිවිරෝධි ගවඝාතකාගාරයක්: සැක 2ක් අත්අඩංගුවට

**ටී.කේ. මහින්ද - වැලිගම සමූහ**

වැලිගම, ගල්බොක්ක ප්‍රදේශයේ පවත්වාගන ගිය නීති විරෝධි ගවඝාතකාගාරයක් වටලා සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට ගැනීමට මාතර කොට්ඨාස දූෂණ මර්දන අංශයේ නිලධාරීහු සමත් වූහ. කාලයක් තිස්සේ පවත්වාගෙන ගිය මෙම නීති විරෝධී ගවඝාතකාගාරයේ සොරකම් කරන ලද මී ගවයන් ඝාතනය කරන බවට පොලීසියට තොරතුරු ලැබී තිබිණි. ඒ අනුව ගවඝාතකාගාරයේ මී ගවයන් ප්‍රවාහනය කිරීමට යොදගත් ත්‍රිරෝද රථයක් හා සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇති අතර එහි තිබූ ගව මස් කිලෝ 45ක් පමණ අත්අංගුවට ගෙන තිබේ. මේ ගවඝාතකාගාරය පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් අත්අඩංගුවට පත් වූයේ වැලිගම, දෙණිපිටිය, මධුරාගොඩ ප්‍රදේශයේ අබ්දුල් වශීබ් මුදම්මලි නැමැති 52 හැවිරිදි පුද්ගලයෙකි. අත්අඩංගුවට පත්වූ අනෙත් පුද්ගලයා වන්නේ දෙණිපිටිය, ගල්බොක්ක ප්‍රදේශයේ 23 හැවිරිදි නිසාම් මොහොමඩ් නමැත්තෙකි. ඔහු ත්‍රිරෝද රථයෙන් මස් ප්‍රවාහනය කර ඇති බව හෙළිවී ඇත. මෙලෙස ප්‍රවාහනය කර ඇති මස් නරක් වූ බවට අනාවරණය වී ඇති අතර සැකකරුවන් මාතර මහේස්ත්‍රාත් හමුවට ඉදිරිපත් කිරීමට නියමිතය.මාතර කොට්ඨාස දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරික්ෂක මෙන්ඩිස් මහතා ඇතුළු පිරිසක් සහභාගි වූහ.

# ගොයම් කපද්දී වැදුණු අකුණට ජයන්තිපුර තිදරු මවකගේ දිවි අහිමි වෙලා




**ඩබ්ලිව්. ඒ. පියතිලක - මැදිරිගිරිය සමූහ**

මින්නේරිය පොලිස් වසමට අයත් ජයන්තිපුර යාය 07 ප්‍රදේශයේ දි කුඹුරේ අස්වැන්න නෙළමින් සිටි අඹුසැමි යුවළකට අකුණු සැර වැදීමෙන් බිරිය මරණයට පත් වී ඇතැයි මින්නේරිය පොලීසිය කියයි.

මෙසේ මරණයට පත් වී ඇත්තේ අංක 622, යාය 07, ජයන්තිපුර ලිපිනයේ පදිංචිව සිටි යුදහමුද සේවයේ සිට විශ්‍රාම ලබා සිටින බී. චන්ද්‍රිකා දමයන්ති නමැති 46 හැවිරිදි තිදරු මවකි. පොලීසිය කළ විමර්ශන අනුව මේ කාන්තාව ඇතුළු පිරිසක් යාය 07 ප්‍රදේශයේ ඔවුන්ට අයත් කුඹුරේ අස්වැන්න නෙළමින් සිටියදි වර්ෂාවක් ආරම්භ වී තිබේ. ඒ අවස්ථාවේ කුඹුරේ සිටි සියලු දෙනා එහි ඇති පැලට ගොස් තිබේ. මියගිය කාන්තාව සහ සැමියා ඒ අසන්නයේම ඇති කුඩා ගසක් අසල රැඳී සිට තිබේ ඒ අවස්ථාවේ අකුණක් වැදි ඇත. අකුණ වදිනවාත් සමග කෑගැසීම නිසා ඒ අසල පැල තුළ පිරිස එම ස්ථානයට ඇවිත් බලන විට අඹු සැමි යුවළ එම ස්ථානයේ වැටි සිටිනවා දැක තිබේ. පසුව පිරිස දෙදෙනාම ජයන්තිපුර ප්‍රාථමික රෝහල වෙත රැගෙන ගොස් තිබේ. එහි දි කාන්තාව මියගිය බව වෛද්‍යවරු පවසා තිබේ. අකුණු සර වැදීම නිසා කම්පනයට පත්ව සිටි පුද්ගලයා පොලොන්නරුව මහ රෝහල වෙත මාරු කර යවා තිබේ. මින්නේරිය පොලීසිය සිද්ධිය පිළිබඳ වැඩිදුර විමර්ශන පවත්වයි.

## යාපනයේ පුංගුඩුතිව් අඩු ආදායම්ලාභී පවුලකට නව නිවෙසක්



**රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ**

යාපනය ආරක්ෂක සේනාංකයේ නිලධාරීන් විසින් යාපනයේ පුංගුඩුතිව් ප්‍රදේශයේ තවත් අඩු ආදායම්ලාභී පවුලකට නව නිවෙසක් ඉදිකොට එම නිවෙස අදාළ පවුල වෙත බාර දීම යාපනය ආරක්ෂක සේනාංක ආඥපති මේජර් ජෙනරාල් සෙනරත් බණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියද සිදු වුණි.

ධානපතියකු වන වාමදේව ත්‍යාගේන්ද්‍රන් මහතාගේ ධන පරිත්‍යාගයෙන් යුද හමුදවේ 51 වැනි සේනාංකයේ සම්බන්ධීකරණයෙන් 512 වෙනි බළසේනා මූලස්ථානයේ අධීක්ෂණය යටතේ 17 වෙනි ගැමුණු හේවා බළ ඇණිය විසින් ඉදි කරනු ලැබූ එම නිවෙස යාපනයේ පුංගුඩුතීව් පදිංචි තවරාසා කවිදු වෙත බාර දෙන ලදී.

## හාලිඇළ උඩුවර මුගුණුමත විදුහලේ පරිගණක ඒකකයට හොරු පැනලා

**හාලිඇළ සමූහ**

හාලිඇළ අධ්‍යාපන කොට්ඨාසයට අයත් උඩුවර බ/ මුගුණුමත මහ විදුහලේ පරිගණක ඒකකය කඩා එහි තිබූ පරිගණක කට්ටල දෙකක් හා ලැප්ටොප් පරිගණකයක් සොරාගෙන යෑමේ සිද්ධියක් සම්බන්ධයෙන් හාලිඇළ පොලීසිය පරීක්ෂණ පවත්වයි.

පෙරේද (31) අදළ විදුහලේ විදුහල්පතිවරයා හා ගුරුවරුන් මේ බව දැක පොලීසියට පැමිණිලි කොට ඇති අතර (30) රාත්‍රියේ මේ සොරකම සිදුවන්නට ඇතැයි පොලීසිය සැක කරයි. අදළ පරිගණක ඒකකයේ දෙරගුළු හා දෙරද කඩා සොරු එහි ඇතුළු වී ඇති බවත් එහි තිබූ ඩෙක්ස්ටොප් වර්ගයේ පරිගණක යන්ත්‍ර (සී.පී.යූ) දෙකක්, මොනිටර් දෙකක්, යූ පී එස් දෙකක් සහ ලැප්ටොප් පරිගණකයක්ද සොරාගෙන ගොස් තිබේ. පෙරේද වන විටත් සොරාගෙන ගොස් ඇති භාණ්ඩවල වටිනාකම ගණනය කර නොතිබුණු අතර සිද්ධියට අදළව සැකකරුවන් කිසිවකුත් අත්අඩංගුවට ගෙන නොතිබිණි.

## රිය අනතුරකින් මොළය මියගිය දියණියගේ ඇස්-වකුගඩු මව්පියෝ දන් දෙති

**බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ**

දරුණු අනතුරකින් බරපතළ තුවාල ලබා මොළයේ ක්‍රියාකාරීත්වය අකර්මණ්‍ය වීමෙන් මියගිය වෛද්‍ය සිසුවියගේ ඇස් හා වකුගඩු තවත් අයෙකුගේ ජීවිතයක් ජීවත් කිරිමේ අරමුණින් මව්පියන් විසින් අදළ අංශවලට පරිත්‍යාග කරන ලදි. රුසියාවේ විශ්ව විද්‍යාලයක වෛද්‍ය උපාධිය හදරමින් සිටි කැකිරාව පාර තලාව ලිපිනයේ පදිංචිව සිටි ශෙරීන් නුවන්ගි හේරත් (23) සිසුවිය පසුගිය (22ද) සිදු වූ අනතුරකින් බරපතළ තුවාල ලබා අනුරාධපුර ශික්ෂණ රෝහලේ ප්‍රතිකාර ලැබුවාය . දින හතකට ආසන්න කාලයක් ඇය දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලැබූ අතර ඇගේ මොළයේ ක්‍රියාකාරිත්වය අකර්මණ්‍ය වී ඇති බව නිගමනය කළ වෛද්‍යවරුන් සිසුවියගේ ජීවිතය බේරා ගැනිමට නොහැකි බව පවුලේ ඥතින්ට පවසා තිබිණි.

ඒ අනුව මව්පියන් විසින් සිය තරුණ දියණියගේ ජීවිතය අවසන් වුවත් ඇගේ අවයවලින් තවත් රෝගියකුට ජීවිතය ලැබීමට අවස්ථාව ලබාදිමේ උදර පින්කමකට උරදෙමින් ඇගේ දෙඇස් හා වකුගඩු දන්දීමට පියවර ගත්හ.එම තීරණයට අනුව අනුරාධපුර ශික්ෂණ රෝහල් ශල්‍යාගාරයේදි සැත්කමක් මඟින් ඇගේ දෙනෙත් ඉවත් කර අක්ෂිදන සංගමයේ අනුරාධපුර ශාඛාවේ ස්ථානභාර නිලධාරි ඩබ්ලිව්.එම්.එස් චන්දන මහතා වෙත ලබාදිමට පියවර ගැනිණි.

ඊට අමතරව මහනුවර පේරාදෙණිය ශික්ෂණ රෝහලෙන් පැමිණි විශේෂ වෛද්‍ය කණ්ඩායමක් වෛද්‍ය සිසුවියගේ වකුගඩු ශල්‍යකර්මයක් මඟින් ඉවත් කර ගත්හ.

## තලාවේ දුම්රිය අනතුර: මුරකරුට ඇප දෙන්න කවුරුත් ඉදිරිපත් වී නැහැ

**සී. එම්. ආරියපාල - තඹුත්තේගම**

තලාව පියින්ඩිකුලම් දුම්රිය මංසන්ධියේදී පසුගිය 21වැනිද සිදුවූ දරුණු අනතුරට හේතුව මුරකරු එදින එහි සේවයට වාර්තා නොකර සිටීමේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූවක් බැවින් අදළ මුරකරු අත්අඩංගුවට ගෙන තඹුත්තේගම අධිකරණයට ඉදිරිපත් කිරිමෙන් පසු සැකකරු රුපියල් ලක්ෂයක ශරීර ඇප මත මුද හරින ලෙස තඹුත්තේගම මහේස්ත්‍රාත් කේ. ඒ. ආර්. නදිශාණි මහත්මිය නියෝග කළ මුත් ඇප දීමට කිසිවකු හෝ ඉදිරිපත් නොවීම නිසා තවමත් රිමාන්ඩ් බාරයේ පසුවෙයි. අනතුර සිදු වූද දුම්රිය මාර්ගය විවෘතව තිබීමෙන් රාත්‍රී මන්නාරම තැපල් දුම්රියේ කැබ් රථයක් ගැටීම නිසා එහි ගමන්ගත් 07 දෙනෙක් තුවාල ලබා රෝහල් ගතකොට තිබුණි. මේ අනතුරෙන් වෛද්‍ය සිසුවියක මිය ගිය ගියේය. මේ නඩුව පසුගිය 31 වැනි දින යළි අධිකරණයේදි කැඳවූ අතර කැබ් රථය පැදවූ රියැදුරා අද (02) දක්වා යළි රිමාන්ඩ් බාරයට පත් කරන ලෙසද තඹුත්තේගම මහේස්ත්‍රාත්වරිය නියෝග කළාය.

## වරකාපොළ නගරයට ළමා උයනක් සහ ඇවිදින මං තීරුවක්





**ජයසිරි මුණසිංහ**

ලස්සන නගරයක් නිර්මාණය කිරීමේ අරමුණින් සහ නගරයට පැමිණෙන ජනතාවට වැඩි පහසුකම් සලසාදීමේ අරමුණින් වරකාපොළ ප්‍රාදේශීය සභාව විසින් නගරය මධ්‍යයේ අංග සම්පූර්ණ ළමා උද්‍යානයක් සහ ඇවිදින මංතීරුවක් ඉදිකිරීමට පියවර ගෙන තිබේ. වරකාපොළ නගරයේ පවතින අඩුපාඩු රාශියක් මගහැරවීමට පසුගිය පාලන කාලයේ පියවර නොගත් බව සඳහන් කරන වරකාපොළ ප්‍රාදේශීය සභාවේ සභාපති සරත් සුමනසූරිය මහතා අතීතයට දෙස් නගා නිහඬ වී සිටීම නොව වර්තමානයේ තමන්ට පැවරී ඇති වගකීම ඉටුකිරීම මුලට ගෙන නව ඉදිකිරීම් සිදුකිරීමට තීරණය කළ බව කීවේය. ඇවිදින මංතීරුව සහ ළමා උද්‍යානය හැකි ඉක්මනින් ඉදිකොට මේ වසර අවසාන වීමට පෙර ජනතා අයිතියට පත් කරලීම තම අරමුණ බව ද සභාපතිවරයා කීය. වරකාපොළ ප්‍රාදේශීය සභාවේ ආදයම් පහළ මට්ටමක පැවති යුගය නිමකොට වැඩි ආදයම් සොයාගන්නා නව ක්‍රමවේද අනුගමනය කරමින් ජනතාවගේ පහසුකම් වැඩි දියුණු කිරීමට එම මුදල් යොද ගැනීම තමාගේ කාර්යය බව ද සභාපතිවරයා කීය. ඒ අනුව ප්‍රථම වතාවට ප්‍රාදේශීය සභාවක් විසින් පාලනය කරන හෙළ බොජුන් හල් දෙකක් තම බල ප්‍රදේශයේ ආරම්භ කළ බව කී සභාපතිවරයා, ඒවා තුළින් ප්‍රදේශවාසී ජනතාවට සෞඛ්‍ය සම්පන්න වඩාත් පිරිසුදු දේශීය ආහාර මිලදී ගැනීමට පහසුකම් සලසා ඇතැයි ද කීය.

මීට අමතරව වරකාපොළ නගර මධ්‍යයේ වැඩිදියුණු කළ මහජන පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයක් ඉදිකොට ජනතා අයිතියට පත්කොට තිබේ. ඉදිරියේදී වඩාත් පහසුකම් සපිරි සුන්දර සහ පිරිසුදු නගරයක් ලෙස වරකාපොළ නගරය පත්කිරීම තමාගේ එකම අරමුණ බවද සරත් සුමනසූරිය සභාපතිවරයා සඳහන් කළේය.

**ඡායාරූප - සමන් ශ්‍රී වේදගේ**

## උකුවෙල ප්‍රාදේශීය සභාව

## ගුරලවෙල ගමට පානීය ජලය නැහැ

› ගාමිණී කුලතුංග (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ)

**ප්‍රියන්ත සුමනසේන - මාතලේ දිස්ත්‍රික් සංවාරක**

උකුවෙල ප්‍රාදේශීය සභාවේ රාජකාරි කටයුතු අධික්ෂණය සහ නියාමනය කිරිම සඳහා පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් පත් කර ඇති නිලධාරින්ගෙන් සේවයක් නොවන නිසා මධ්‍යම පළාත් ආණ්ඩුකාර වෙත දන්වන ලෙස ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ මන්ත්‍රී සිසිර ජයම්පති ඇටිපොළ මහතා සභාවට යෝජනා කළේය . උකුවෙල ප්‍රාදේශිය සභාවේ මාසික සභා රැස්වීම සභාපති ඩි . ඩබ්ලිව් . එම්. චේතියරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියද පැවැත්විණි .

සභාපති ඩි .ඩබ්ලිව්. එම්. චේතියරත්න මහතා විසින් ඇල්කඩුව පාරේ උඩතැන්න රෝස තිරිවාන කැණීම් නිධියට වෙළෙඳ බලපත්‍ර ඉල්ලා අයැදුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇති බව සභාවට දන්වන ලදි .

**අයි. එම් . පාරිස් මන්ත්‍රී (එ ජා ප )** – සියලු ආයතන මඟින් අවසර ගත්තත් වතු සමාගම ටෙන්ඩර් දීලා තියෙන්නේ. පරිසර හානියක් ද තිබෙනවා. ප්‍රාදේශිය සභාවෙන් බලපත්‍රය දීම තාවකාලිකව නතර කරන්න.

**සිසිර ජයම්පති ඇටිපොළ (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ)** – උකුවෙල සභා බල කොට්ඨාසයේ සියලු ග්‍රාමීය මාර්ග මැන වෙන් කිරිමට සුදුසුයි. එම කටයුත්ත කර ගැනිම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගැනිමට මධ්‍යම පළාත් ආණ්ඩුකාරට දන්වා අවසර ගන්න .

**දේවිකා හෙට්ටිආරච්චි (එක්සත් ජනතා නිදහස් සංධානය)** – ඉදිරිපත් කළ යෝජනාව වැදගත් . මාර්ගත් ඇතුළත් කරන්න .

**ගාමිණී කුලතුංග (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ)** – අදළ මාර්ගවලට සම්බන්ධ කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි මහතාගේ සහාය ගන්න. අඩි 10 පාර අඩි 8 වෙලා තියෙනවා .

**උප සභාපති අබ්දුල් නිෂාර් (ස්වාධීන)** – මහ මැතිවරණයට තරග කළේ ස්වාධීනව. තව දුරටත් ස්වාධීනව ඉදිරියටම ක්‍රියා කරනවා . පක්ෂ10යි. ස්වාධීන කණ්ඩායම් 10ක් සමග තරග කරලා රත්තොට ආසනයේ තෙවන ස්ථානය දිනා ගැනිමට කටයු කළා. ප්‍රශ්න රාශියක් තිබුණා. එක එක්කෙනාට කඩේ යනවා කියලත් කිව්වා .එහෙම නැහැ සමගියෙන් එකතුවෙලා හඬක් නැගුවා .

## මාතලේට ඡන්ද අඩු වුණේ නගරාධිපතිගේ වරදින්

› අයි. එම්. ෆාරිස් (එජාප)

**අයි .එම්. ෆාරිස් (එ ජා ප)** – මෙවර එක්සත් ජාතික පක්ෂ මාතලේ ආසනයට ඡන්ද අහිමි වුණේ මාතලේ නගරාධිපති නිසයි. නාගරික මන්ත්‍රිවරුන්ට හිරිහැර කළා . කඩුවෙල ජල යෝජනා ක්‍රමයේ අක්‍රමවත් ප්‍රශ්න තියෙනවා. මේ ගැන අවධානය යොමු කරන්න .

**ගාමිණී කුලතුංග (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ)** – ගුරලවෙල ගමටත් පානිය ජලය නැහැ. ක්‍රියා මාර්ගයක් ගන්න . මේ සභාවේ උඩු මහලෙන් වැස්සට වතුර වැටෙනවා. මේවා ගැනත් බලන්න වෙනවා .

**උප සභාපති** – ඉහළම මහලට වහලයක් ගහන්න වෙනවා. තියෙන බිල්ඩිම හිතෙන විදිහට ප්ලෑන් වෙනස් කරලා හදලා ප්‍රශ්නයක් බවට පත්වෙලා. ඒ වගේම අගුවක් නැතිව බිත්තියේ ප්‍රමාණයටම හදලා.

**සිසිර ජයම්පති ඇටිපොළ (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ)** –2004 වසරේදි මේවා අනුමත කරපු වැඩ. බලපු ඉංජිනේරුවෝ ඉන්නවා .ඒ අය ගෙනත් පරික්ෂණයක් කරන්න.

**අයි .එම් .ෆාරිස් (එ ජා ප )** සමෘද්ධි දීමනාව ගන්න යන්න බැරිව ඇදේ ඔත්පලව ඉන්න අය සමෘද්ධි නිලධාරි ළඟට ගේන්න කියනවා . වාහනයක් හයර් කරන්න වෙනවා .නිලධාරියාට ගිහින් බලන්න බැරිද රාජ්‍ය සේවය කියන්නේ මේවාටද .දිවුරුම් පෙත්සම ප්‍රතික්ෂේප කරනවා .

**සමන්ත ධර්මසේන (ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ )** – මෙවර මහමැතිවරණයට ඉදිරිපත් වුණා. පියවරෙන් පියවර ඉදිරියට ගියා. මෙවර ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ජයග්‍රහණය ඉදිරියට ගියා .චන්ද දයකයන්ට ස්තුතියි.

**සි .බි. පුරිජ්ජල (ශ්‍රී ලංකා පොදුජනපෙරමුණ)**– පෝසිලෙන් ආයතනයේ කොස් ගසක් අනවසරයෙන් කපලා තියෙනවා. මේවා රාජ්‍ය නිලධාරින් දන්නේ නැහැ. වෘත්තිය සමිති නායකයෙක්ට දීල තියෙන්නේ. වැරැදි වැඩක්. ගස් අයිති ප්‍රාදේශීය ලේකම්ට. සභාවට දන්වන්නේ මෙහෙම දේත්.වෙනවා කියන්න .දැන ගන්න තියෙන්නේ සන්තෝසමක් දුන්නා කියලා . හොයලා බලන්න .

**නිමල් කරුණාතිලක (ජවිපෙ)**– එහෙම දෙයක් වෙලා නැහැ. අපේ සමාජිකයෙක් තමයි .

# පන්සල පිටිපස්සේ අත්බෝම්බ 2ක්


**ජයන්ත වාසුලසේන**
**ගලෙන්බිඳුණුවැව සමූහ**

ගලෙන්බිඳුණුවැව පොලිස් වසමට අයත් පෙරියකුලම පන්සල පිටුපස පිහිටි ලඳු කැලෑවේ තිබී විදේශ රටක නිෂ්පාදිත S F G - 87 වර්ගයට අයත් ජීව අත්බෝම්බ 02ක් සොයා ගැනීමට හැකි වූ බව ගලෙන්බිඳුණුවැව පොලීසිය ප්‍රකාශ කළේය.

මෙම ජීව අත්බෝම්බ දෙක යළි ප්‍රයෝජනයට ගැනීමට හැකි වන පරිදි ටින් එකක ජලය නොයන ලෙස අසුරා තිබී ඇති අතර පෙරියකුලම ගම්මානයේ පදිංචි පුද්ගලයකු දැක ඒ පිළිබඳව ගලෙන්බිඳුණුවැව පොලිස් ස්ථානයට කළ දැනුම් දීමකට අනුව සොයාගෙන තිබේ. අත්බෝම්බ දෙක පිළිබඳව අනුරාධපුර අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් අනතුරුව අනුරාධපුර පොලිස් විශේෂ කාර්ය බළකා කඳවුරේ නිලධාරීන් පැමිණ බෝම්බ දෙක නිෂ්ක්‍රිය කිරීමට කටයුතු කළ බව ද ගලෙන්බිඳුණුවැව පොලීසිය ප්‍රකාශ කළේය.

සතර දෙසින්
pronews@lakehouse.lk
ප්‍රාදේශීය පුවත්

# අතරමැදි කන්නයේ මුං වගාව සාර්ථකයි





**සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ**

අතරමැදි කන්නයක් ලෙස ආරම්භ කළ ඉපනැල්ලේ මුං ඇට වගාවෙන් අස්වනු මේ වන විට ගොවීන් ලබා ගනිමින් සිටින බවත් අක්කර 6000ක පමණ සිදු කළ වගාවෙන් මුං ඇට මෙට්‍රික් ටොන් 10,000ක පමණ අස්වැන්නක් බලාපොරොත්තු වන බවත් කන්තලේ නේවාසික ව්‍යාපාර කළමනාකාර ජී. ජී. සුනිල් මහතා පැවසීය.

යල කන්නය හා 2020, 2021 මහ කන්නය අතර සැලකිය යුතු කාලයක් ඇති බැවින් අතරමැදි කන්නයක් ලෙස මෙම කන්නය අතිරේක මුං වගාවට සූදානම් කිරීමට ත්‍රිකුණාමලය දිසාපති අසංක අබේවර්ධන මහතා සමඟ කන්තලේ ව්‍යාපාර ගොවි සංවිධාන සාමාජිකයන් අතර පැවති කන්න රැස්වීමේදී මෙම තීරණයට එළඹ තිබිණි.

ඒ අනුව කන්තලේ, වාන්ඇළ, තඹලගමුව, කින්නියා, මොල්ලිපතාන, වෙන්ඩ්‍රාසන්පුර යන ගොවි ජනපද කේන්ද්‍ර කර ගනිමින් ජූලි මස 5 වැනි දින මුං වගාව ආරම්භ කරන ලදි.

මේ වන විට මුලින්ම වගාව ආරම්භ කළ තඹලගමුව, පොට්කේනි, මොල්ලිපතාන, කින්නියා යන ප්‍රදේශවල ගොවීහු තමන් වගා කළ බිම්වල සාර්ථක ලෙස අස්වනු නෙළන බවත් අස්වැන්න කිලෝවක් රුපියල් 200 ගණනේ මිල දී ගැනීමට හේලීස් ආයතනය ගිවිසුම් අත්සන් කර ඇති බැවින් ගොවීන්ට කිසිදු ප්‍රශ්නයකින් තොරව අස්වනු විකුණා ගැනීමට අවස්ථාව එළඹ ඇති බවත් සුනිල් මහතා පැවසීය.

# මත් වතුර සාදයේ බහින්බස් වී මස්සිනාට මන්නෙකින් කොටලා

**බී. එම්. විජේසූරිය**
**අනුරාධපුර මධ්‍යම විශේෂ**

දෙමස්සිනන් අතර ඇති වූ බහින්බස් වීමක් දුරදිග ගොස් එල්ල කළ මන්නා පහරකින් බරපතළ තුවාල ලැබූ හිටපු යුද හමුදා සෙබළකු ජීවිතක්ෂයට පත් වී ඇති අතර ඝාතනය සිදු කර පලා ගිය සැකකාර මස්සිනා අත්අඩංගුවට ගැනීම සඳහා මැදවච්චිය පොලීසියේ අපරාධ විමර්ශන අංශය නිලධාරීන් පෙරේදා (31) අලුයම පරීක්ෂණ ආරම්භ කර තිබේ.

මෙසේ ඝාතනයට ලක් වී ඇත්තේ විරාල්මුරුප්පුව මැදවච්චිය ලිපිනයේ පදිංචිව සිටි එක්දරු පියකු වූ 27 හැවිරිදි සජිත් දේශප්‍රිය සුභසිංහ නමැත්තෙකි. මරණකරුගේ දෙඅත්වලට හා දෙපාවලට තදබල මන්නා පහර හතරක් එල්ල වී ඇති අතර වම් පාදයට එල්ල වූ මන්නා පහරකින් අධික ලෙස රුධිරය වහනය වීම හේතුවෙන් තම නිවෙස ඉදිරිපිටදීම මරණයට පත් වී ඇති බව පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී තිබිණි.


මරණයට පත් වූ හිටපු යුද හමුදා සෙබළා වසර කිහිපයක් යුද හමුදාවේ සේවය කර නීත්‍යනුකූලව ඉන් ඉවත් වී ඇති බවත් සැකකරු විවිධ අපරාධ, කොල්ලකෑම්වලට මෙන්ම මත්ද්‍රව්‍ය පානයට ද ඇබ්බැහි වූ අයකු බවත් පොලීසිය ප්‍රකාශ කළේය. සැකකරු මරණයට පත් වූ සෙබළාගේ නැඟණිය සමඟ විවාහ වී සිටිනා අතර එක් දරු පියෙකි.

ඝාතනයට ලක් වූ සෙබළා හා සැකකරු පසුගියදා (30) රාත්‍රියේ විරාල්මුරුප්පුව ප්‍රදේශයෙන් දිවෙන උතුරු දුම්රිය මාර්ගය ආසන්නයේ මත් වතුර සාදයක් පවත්වා ඇති අතර එහිදී දෙදෙනා කිසියම් හේතුවක් මුල් කර ගනිමින් බහින්බස් වී තිබේ. අනතුරුව යුද හමුදා සෙබළා නිවෙසට පැමිණීමට ගමන් අරඹා ඇති බවත් සැකකරු නිවෙසට ගොස් තියුණු මුවහත සහිත මන්නා පිහියක් රැගෙන ඔහු මරන බව පවසමින් ඔහුගේ නිවෙස දෙසට පැමිණ ඇති බවත් පොලීසිය ප්‍රකාශ කළේය. එසේ පැමිණි සැකකරු යුද හමුදා සෙබළාව ඔහුගේ නිවෙස ආසන්නයේදී අමානුෂික ලෙස කපා කොටා පලා ගොස් ඇත.

ඝාතනයට ලක් වූ අයගේ සිරුර පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා අනුරාධපුර ශික්ෂණ රෝහලේ විශේෂඥ අධිකරණ වෛද්‍යවරයා හමුවට පමුණුවන ලෙස මහේස්ත්‍රාත් පරීක්ෂණය පැවැත් වූ අනුරාධපුර මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු එන්. ටී. හේමන්ත පුෂ්පකුමාර මහතා නියෝග කර තිබේ. දැනට පලා ගොස් සිටිනා සැකකරු වහාම අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරනා ලෙසටත් මහෙස්ත්‍රාත්වරයා පොලීසියට එහිදී නියෝග කළේය.

මැදවච්චිය පොලීසියේ අපරාධ විමර්ශන අංශය හා අනුරාධපුර මූලස්ථාන පොලීසියේ අපරාධ ස්ථානාගාරයේ නිලධාරීහු වැඩිදුර විමර්ශන සිදු කරති.

# නින්දානේ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ අපවත් වෙති



ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ නිර්මාතෘ රාජකීය පණ්ඩිත පූජ්‍ය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ නායක ස්වාමීන් වහන්සේගේ ශිෂ්‍යරත්නයක් වූ කොළඹ 7, ශ්‍රී කල්‍යාණ ධර්ම ආශ්‍රමවාසී නින්දගනේ ඤාණානන්ද ස්වාමීන් වහන්සේ අපවත් වූහ. ආදාහන කටයුතු අද (02) සවස 04.00ට බොරැල්ල කනත්තේදී සිදු කිරීමට නියමිතය. ආගමික වතාවත් සවස 02.00ට ශ්‍රී කල්‍යාණ ධර්ම ආශ්‍රමයේදී සිදු කෙරේ.

# සිව් හැවිරිදි දැරියට අමානුෂිකව පහර දීලා

**ටී.කේ. මහින්ද - වැලිගම සමූහ**

සිව් හැවිරිදි දැරියකට අමානුෂික ලෙස පහර දීම සම්බන්ධයෙන් කොටවිල පොලිස් වසමේ කඹුරුගමුව තුඩැල්ල ප්‍රදේශයේ කාන්තාවක් කොටවිල පොලීසිය මගින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර තිබේ.

සිව් හැවිරිදි දැරියකට නිතර නිතර අමානුෂික ලෙස පහර දීම සම්බන්ධයෙන් එම දැරියගේ ඥාතීන් විසින් කොටවිල පොලීසියට කළ පැමිණිල්ලකට අනුව ළමාරක්ෂක අධිකාරිය මගින් විමර්ශන කටයුතු සිදු කර මෙම දැරියගේ මවට දැඩි අවවාද කර තිබියදී එය නොසලකා නැවත වරක් අමානුෂික ලෙස පහර දී වධ හිංසා පැමිණවීම හේතුවෙන් ඇය නැවතත් අත්අඩංගුවට ගෙන තිබේ. පසුව මෙම කාන්තාව කොටවිල පොලීසිය මගින් මාතර ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත.

# දකුණේ මාර්ග සංවර්ධනයට ගැටලු

**එස්. දියගහගේ**
**දකුණු පළාත් සංචාරක**

පළාත් සභාවෙන් වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නැති වීමත් යන්ත්‍ර සූත්‍ර අබලන් වීමත් හේතුවෙන් දකුණු පළාතේ මාර්ග සංවර්ධනය කිරීමේදී බාධා පැමිණ ඇතැයි මෙවර පැවති ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිනී පී. පී. වික්‍රමසිංහ මහත්මිය කියා සිටියාය.

දකුණු පළාත් ආණ්ඩුකාර විලී ගමගේ, ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරාල යන මහත්වරුන්ගේ සමසභාපතිත්වයෙන් ගාල්ල හෝල් ඩි ගෝල් ශාලාවේදී රැස්වීම පැවැත්විණි.

එහිදී ඒ මහත්මිය වැඩිදුරටත් කියා සිටියේ නඩත්තු කටයුතු සඳහා වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නැති වීම, අධිකාරිය සතුව දැනට තිබෙන යන්ත්‍ර සූත්‍රවල හා වාහනවල නිතරම අලුත්වැඩියා කිරීමට සිදු වීම, දැනට අධිකාරිය සතුව තිබෙන කැබ් රථ සංඛ්‍යාව මාර්ග අධීක්ෂණය සඳහා ප්‍රමාණවත් නැති වීම හා පෙරමුසු අංගණවල ඇති අලුත්වැඩියා කටයුතු ආදිය හේතුවෙන් මාර්ග නඩත්තු කිරීමේදී ගැටලු රැසක් පවතින බවත්ය.

පසුව මේ සම්බන්ධයෙන් ඒ මහත්මියගෙන් වැඩිදුරටත් කරන ලද විමසීමේදී කියා සිටියේ දැනට දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සතුව දකුණු පළාතේ මාර්ග කිලෝමීටර 1740ක් තිබෙන අතර ඒවා නඩත්තු කිරීමට පළාත් සභාවෙන් වාර්ෂිකව ලැබෙන්නේ රුපියල් මිලියන 200ක් පමණක් බවය.

පළාතේ දිස්ත්‍රික්ක තුනේම කාපට් අංගණ තුනක් තිබෙන අතර ගාල්ල දිස්ත්‍රික්කයේ කාපට් අංගණය වසර කිහිපයක් තිස්සේ වැඩ නැති බවත් මුදල් නැති වීම සහ පරිසර ගැටලු හේතුවෙන් එම තත්ත්වය ඇතිව තිබෙන බවත් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරිය වැඩි දුරටත් කියා සිටියාය.




# බස් නැවතුම්පොළ හදමු ද?

**කේ. එස්. කරුණාරත්න**
**මරදන්කඩවල සමූහ**

අනුරාධපුර නගරයේ නව බස් නැවතුම්පොළ දැඩි ලෙස අබලන් වීමෙන් බස් රථ රියැදුරන් මෙන්ම මගී ජනතාවද දැඩි අපහසුතාවකට පත්ව සිටිති. මෙම බස් නැවතුම්පොළේ තැනින් තැන විශාල වළවල් සෑදී ඇති අතර සුළු වර්ෂාවකදී පවා බස් නැවතුම්පොළ ජලාශයක් බවට පත් වේ. දිවයිනේ ප්‍රධාන නගර අතුරින් එකක් වන අනුරාධපුර නගරයේ බස් නැවතුම්පොළ මෙසේ අබලන් වීම හේතුවෙන් දෛනිකව විශාල පිරිසක් දැඩි අපහසුතාවට පත් වේ. මෙම බස් නැවතුම්පොළ කඩිනමින් පිළිසකර කර දෙන ලෙස රියැදුරන් මෙන්ම මගී ජනතාව ද වගකිව යුතු බලධරීන්ගෙන් ඉල්ලා සිටිති.

# මත්ද්‍රව්‍ය මැඩීන්න මාතලේ විශේෂ මෙහෙයුම්

**නාඋල සමූහ**

මත් කුඩු සහ විවිධ විෂ සහිත මත් ද්‍රව්‍ය අලෙවිය හා ළඟ තබා ගන්නන් සොයා පුළුල් මෙන්ම ක්ෂණික මෙහෙයුම් කිහිපයක් ක්‍රියාත්මක කර ඇති බව නාඋල පොලීසිය ප්‍රකාශ කළේය. දීපව්‍යාප්තව සිදු කරනු ලබන මත්ද්‍රව්‍ය වැටලීම්වලට සමගාමීව මෙම මෙහෙයුම් ද ක්‍රියාත්මක කර ඇත.

මහනුවර හා යාපනය ඒ - නවය මාර්ගය ඉලක්ක කර ගනිමින් සිදු වන විවිධ මත්ද්‍රව්‍ය සම්බන්ධ අපරාධ මැඩලීමේ අරමුණින් මෙම මෙහෙයුම් ක්‍රියාත්මක කර තිබේ. ජංගම මුර සංචාර, හදිසි වැටලීම් මෙන්ම විවිධ සෝදිසි කිරීම් හරහා මෙම මෙහයුම ක්‍රියාත්මක වන බවත් මේ වන විටත් විවිධ අපරාධවලට සම්බන්ධ පුද්ගලයන් රැසක් අත්අඩංගුවට ගෙන ඇති බවත් මේ සම්බන්ධයෙන් අදහස් දැක් වූ නාඋල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක යූ. ජී. පී. කේ. රත්නායක මහතා කියා සිටියේය.

# විදෙස් හමුදා නිලධාරීන්ට තිළිණ ප්‍රදානයක්



**රසුල දිල්හාර ගමගේ**
**උතුරු පළාත් විශේෂ**

විදේශීය රටවල සිට ආරක්ෂක පාඨමාලාවන් ඇතුළු සෙසු පාඨමාලාවන් හැදෑරීම සඳහා මෙරටට පැමිණ සිටින විදේශීය යුද හමුදා නිලධාරීහු පිරිසක් පෙරේදා (31) යාපනයට පැමිණ යාපනයේ ආරක්ෂක අංශ ප්‍රධානීන් හමු වූහ.

එහිදී යාපනය ආරක්ෂක සේනාංක ආඥාපති මේජර් ජෙනරාල් සෙනරත් බණ්ඩාර මහතා ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ යුද හමුදා නිලධාරීන් විදේශීය හමුදා කණ්ඩායමට යාපනයේ වත්මන් තත්ත්වය හා පශ්චාත් යුද සමයේදී යුද හමුදාව විසින් ජනතාව වෙනුවෙන් ඉටු කළ කාර්යභාරය පිළිබඳව ඔවුන්ව දැනුම්වත් කරණු ලැබීය. මේ අවස්ථාව සිහිපත් වීම සඳහා තිළිණ කිහිපයක් ද යාපනයේ යුද හමුදා ප්‍රධානීන් විසින් විදේශීය හමුදා නිලධාරීන් වෙත පිරිනමන ලදි.

# මාතලේ ජල ව්‍යාපෘතියේ වැඩ කඩිනම් කරයි



**ප්‍රියන්ත සුමනසේන**
**මාතලේ දිස්ත්‍රික් සංචාරක**

විසල් මාතලේ ජල ව්‍යාපෘතියේ වැඩකටයුතු කඩිනම් කරන ලෙස අදාළ කොන්ත්‍රාක් සමාගම්වලට උපදෙස් ලබා දුන් බව මාතලේ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී රෝහණ කුමාර දිසානායක මහතා පැවසීය.

මන්ත්‍රී රෝහණ දිසානායක මහතා මේ බව සඳහන් කළේ රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්ත මහතා ඇතුළු නිලධාරීන් සමඟ විසල් මාතලේ ජල ව්‍යාපෘතිය සිදු කරන මාතලේ දිස්ත්‍රික්කයේ ස්ථාන කිහිපයක නිරීක්ෂණ චාරිකාවකට එක් වෙමිනි.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක් වූ දිසානායක මහතා මෙසේ පැවසීය.

"මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතක ජනතාවට පිරිසුදු පනීය ජලය බෙදා හැරීමේ අරමුණින් 2014 වසරේ මාගේ මූලිකත්වයෙන් මෙම ජල ව්‍යාපෘතිය ආරම්භ කළා. පසුගිය කාලයේ මෙහි වැඩකටයුතු මඳක් මන්දගාමී වුණා. මේ වන විට වැඩකටයුතු අවසන් වෙමින් පවතින්නේ. ලබන වසරේ මැද වන විට ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් කර විවෘත කරන්න අපට පුළුවන්. මාතලේ දිස්ත්‍රික්කයෙන් පානීය ජල අවශ්‍යතාවෙන් සියයට 65ක් පමණ ආවරණය වීමක් සිදු වෙනවා."

මෙම නිරීක්ෂණ චාරිකාව සඳහා ජාතික ජලසම්පාදන මණ්ඩලයේ සභාපති නිශාන්ත රණතුංග මහතා සමඟ ප්‍රංශ හා චීන ජාතික ප්‍රධාන ඉංජිනේරුවරුන් ඇතුළු නිලධාරීහු පිරිසක් එක් වී සිටියහ.

# දහම් පාසලේ මුස්ලිම් දැරියට විශේෂ ශිෂ්‍යත්වයක්



**කළුතර මධ්‍යම විශේෂ**

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන ශ්‍රවණාගාරයේ පැවති කළුතර දිස්ත්‍රික් දහම් පාසල් සිසු නිපුණතා තරග සහතික ප්‍රදානෝත්සවයේදී පසුගියදා (30) මුස්ලිම් දැරියකට ද විශේෂ මුදල් ශිෂ්‍යත්වයක් පිරිනැමිණි.

මතුගම, නවුත්තුඩුව, තීරන්තිඩියේ පදිංචි මාස් උමාෂා ෆසීනා නූර්දීන් නම් වූ එම දැරිවිය මතුගම සිරි සුගත දහම් පාසලේ අධ්‍යාපනය ලබන අතර බුදු දහම හා පාලි බස ඇතුළු සියලු විෂයන්වලට ඉහළම ලකුණු ලැබීමෙන් රු.12,000/=ක මූල්‍ය ශිෂ්‍යත්වයක් පිරිනමන ලදි.

උමාෂා ෆසීනා නූර්දීන් දැනට මතුගම මධ්‍ය විද්‍යාලයේ උසස් පෙළ ජීව විද්‍යා පන්තියේ ඉගෙනුම ලබන අතර අනාගතයේදී රටට දැයට සේවයක් ඉටු කිරීම සඳහා වෛද්‍යවරියක වීම ඇයගේ බලාපොරොත්තුව බව නූර්දීන්ගේ මව වන ප්‍රේමමාලා දමයන්ති 'දිනමිණ'ට පැවසීය.

එම දැරිය සහ ඇයගේ මව බස්නාහිර පළාත් ප්‍රධාන සංඝ නායක, සමස්ත ලංකා ශාසනාරක්ෂක මණ්ඩපයේ උත්තරීතර ලේකඛාධිකාරී හා වාද්දුව, කොරොස්දූව පුරාණ විහාරාධිපති, ශාස්ත්‍රපති අතිපූජ්‍ය ගෝණදූවේ ගුණානන්ද නා හිමියන් සමඟ ඡායාරූපයකට පෙනී සිටි අයුරුයි මේ.

# ගණිකා මඩමේ වාලම්පුරි බිස්නස්



**ඒ. ටී. එම්. ගුණානන්ද**
**ත්‍රිකුණාමලය විශේෂ**

ත්‍රිකුණාමල නගරයේ සම්බාහන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන මුවාවෙන් ගණිකා මධ්‍යස්ථානයක් පවත්වාගෙන ගිය පුද්ගලයකු ඇතුළු ගණිකා වෘත්තියේ යෙදුණු කාන්තාවන් තිදෙනකු පසුගියදා (30) රාත්‍රී අත්අඩංගුවට ගැනීමට ත්‍රිකුණාමලය මූලස්ථාන පොලීසිය සමත් වී තිබේ. අත්අඩංගුවට ගත් කාන්තාවන් තිදෙනා දඹුල්ල, අනුරාධපුර, රක්වාන ප්‍රදේශවල පදිංචිකාරියන් වන අතර එක් කාන්තාවක් මීට පෙර ද ගණිකා වෘත්තියේ යෙදී සිටියදී අත්අඩංගුවට ගෙන තිබිණි.

ත්‍රිකුණාමල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ලයනල් ගුණතිලක මහතාට ලද තොරතුරක් අනුව අධිකරණයෙන් ගත් සෝදිසි වරෙන්තුවක් මත මෙම වැටලීම මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක දුමින්ද රාජපක්ෂ මහතාගේ මෙහෙයවීමෙන් අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ඩී. ඒ. පී. ආර්. ප්‍රේමලාල්, කොට්ඨාස දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක බුද්ධික චතුරංග චන්ද්‍රසිරි යන මහත්වරු ඇතුළු පොලිස් නිලධාරීහු මෙම වැටලීමට එක් වූහ.

කොට්ඨාස දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති උප පොලස් පරීක්ෂක බුද්ධික චතුරංග චන්ද්‍රසිරි මහතාට ලද නවත් තොරතුරක් මත මෙම ගණිකා මධ්‍යස්ථානය තුළ සිදු කළ වාලම්පුරි ජාවාරමක්ද හෙළි කර ගැනීමට හැකි වී ඇති අතර පරණ රූපවාහිනියක් තුළ සඟවා තිබූ මැලේසියාවේ සිට ගෙන්වන ලද වාලම්පුරියක් ද සොයා ගැනීමට හැකි වී තිබේ.




# නීරෝගි දිවියක් - සුවපත් රටක් සඳහා
# පිරිසුදු පොල් තෙල් පමණක් ආහාරයට එක් කර ගන්න

සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් සඳහා මිනිසාගේ ආහාර අවශ්‍යතාව ප්‍රධාන සාධකයකි. දෛනිකව සමබල ආහාර වේලක් ලබා ගැනීම මිනිසාට නීරෝගී සම්පන්න සක්‍රිය දිවි පෙවෙතක් ගත කිරීමට බෙහෙවින් ඉවහල් වේ. එම ආහාර අවශ්‍යතාව සපුරා ගැනීමේදී පොල් සඳහා හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. ඒ අනුව පොල් ගෙඩිය, ගහට පොත්ත මෙන් මිනිසා සමග බැඳී ඇත.

මහා වංශයේ ඇතුළත් වන පරිදි, දෙවන අග්බෝ රජු සමයෙන් ඇරැඹි පොල් වගාව වැවිලි භෝගයක් වශයෙන් ව්‍යාප්ත විය. 19 වැනි සියවස මැද භාගයේ සිට වානිජමය වශයෙන් ගොඩනැගුණු පොල් කර්මාන්තය තුළ වර්තමානය වන විට අගය එකතු කළ නිෂ්පාදන රාශියක් නිෂ්පාදනය කරනු ලබයි.

- පොල් මදය
- පොල් ලෙල්ල
- පොල් කටුව
- වෙනත් විසිතුරු භාණ්ඩ නිෂ්පාදන,

ආදී වශයෙන් ප්‍රධාන බාණ්ඩ 4 ක් යටතේ පොල් ආශ්‍රිත නිෂ්පාදන හඳුනා ගත හැකිය.

මෙම නිෂ්පාදන අතර පොල් මදය ආශ්‍රිත නිෂ්පාදනයන්ට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි, වර්තමාන ශ්‍රී ලංකාවේ පොල් මදය ආශ්‍රිතව සිදු කරන නිෂ්පාදනයන් සුළු, මධ්‍ය සහ මහා පරිමාණ කර්මාන්ත වශයෙන් වර්ග 3 කට හඳුනාගත හැකිය.

එම කර්මාන්ත අතර,

- පොල් කිරි
- පොල් කිරි පිටි
- නැවුම් පොල් තෙල් (vergin Coconut Oil )
- දිසිදි පොල්
- පොල් තෙල්
- කොප්පරා
- පොල් වතුර

ආදී නිෂ්පාදන කර්මාන්ත රාශියක් ශ්‍රී ලංකාව පුරා විහිදී පවතී.

මෙම නිෂ්පාදන අතුරින් අතීතයේ පටන් මිනිසාගේ සමාජීය සහ සංස්කෘතික ජීවිතය සමග ඉතා කිට්ටු සම්බන්ධයක් පවත්වන පොල් තෙල් කර්මාන්තයට, ලාංකීය ජන සමාජය තුළ




හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි.

සාම්ප්‍රදායික කොප්පරා නිෂ්පාදනය තුළින් ජනනය කර ගන්නා පොල් තෙල්, 1980 වසරේ දී ශ්‍රී ලංකාව තුළ මෙ.ටොන් ලක්ෂ 9 කට අධික ප්‍රමාණයක් නිෂ්පානය වූ අතර පොල්තෙල් සඳහා යොදා ගන්නා ප්‍රධාන අමුද්‍රව්‍ය වන කොප්පරා නිෂ්පාදනය මෙ.ටොන් 123,000 කට අධික විය.

ශ්‍රී ලංකාව තුළ පොල් කර්මාන්තයේ නිෂ්පාදන විවිධාංගිකරණය වීම තුළ ක්‍රමයෙන් පොල් තෙල් සහ කොප්පරා නිෂ්පාදනය විශාල ලෙස අවප්‍රමාණය වීමක් දක්නට ලැබේ.

එනමුත් පොල් කිරි, දිසිදි පොල්, වර්ජින් පොල් තෙල් යන කර්මාන්තයන්ගෙන් ඉවත් වන පොල් ගෙඩියේ කුරුට්ට යොදා ගනිමින් කුරුටු පොල් තෙල් නිෂ්පාදනය විශාල වශයෙන් ආරම්භ වී ඇත. කෙසේ වෙතත් පරිභෝජනය සඳහා මෙරටට වාර්ෂික තෙල් අවශ්‍යතාව මෙ.ටොන්. 250,000 ක් වේ. එම අවශ්‍යතාවය සපුරා ගැනීමේ දී 2019 වන විට ශ්‍රී ලංකාවේ නිපද වූ පොල් තෙල් ප්‍රමාණය මෙ.ටොන් 40,000 තරම අඩු ප්‍රමාණයක් විය. ඉතිරිය සම්පූර්ණ කරගැනීම සඳහා පාම් තෙල් හෝ වෙනත් ආදේශක තෙල් වර්ගයක් ආනයනය කිරීමට සිදුව ඇත. එලෙස ආදේශක තෙල් ආනයනය කිරීම සඳහා 2019 වසරේ දී රු. බිලියන 25 පමණ මුදලක් රජය විසින් වැය කර ඇත.

## වෙළෙඳපොළේ ඇති පොල්තෙල් වර්ග

**පිරිසුදු පොල්තෙල්** – වියළි පොල්, පොල් මදයෙන් (කොප්රා) නිස්සාරණය කරනු ලැබේ. එය රළු, පිරිපහදු නොකළ සහ කිසිදු ආකලන රහිත ය. ප්‍රධාන වශයෙන් නිපදවනු ලබන්නේ මෝලක හෝ ගොනුන් විසින් මෙහෙයවන සෙක්කුව තුළ cpora සම්පීඩනය කිරීමෙනි.

**පිරිපහදු කළ පොල්තෙල්** – මෙය RBD පොල්තෙල් (පිරිපහදු කළ, විරංජනය කළ හා ඩියෝඩරීකරණය කළ) ලෙසද හැඳින්වේ. මෙය ලබා ගන්නේ යාන්ත්‍රික හා රසායනික පිරිපහදු කිරීම, විරංජනය කිරීම සහ බොරතෙල් පොල්තෙල් ඩියෝඩරීකරණය කිරීමෙන් සිහින්, වර්ණ රහිත, ගන්ධ රහිත සහ කිසිදු අංශුවකින් තොරවය.




පිරිසුදු පොල් තෙල් නිෂ්පාදනය අවප්‍රමාණය වීමත්, පොල් තෙල් නිෂ්පාදනය කරන කර්මාන්ත නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යල් පැන ගිය ක්‍රම භාවිත කිරීම, සුදුසු අමුද්‍රව්‍ය භාවිත නොකිරීම, පත්සල්, ඉවත් කල අපිරිසුදු පොල් නිෂ්පාදන සඳහා යොදා ගැනීම, නිෂ්පාදන ආයතන සුදුසු තත්ත්වයේ නොතිබීම.

**වර්ජින් පොල්තෙල්** – මෙම තෙල් නිස්සාරණය කිරීමේදී සෙල්සියස් අංශක 60 ට හෝ ඊට අඩු තාපයක් භාවිත කළ යුතු වේ. මේ ආකාරයෙන් නිපදවන විට තෙල් රසයෙන්, සුවඳින් හා ඖෂධීය ගුණයෙන් යුක්ත වේ.

## පොල් තෙල් නිෂ්පාදනයේ අර්බුධකාරී තත්ත්ව

- පොල් වියළීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම, බෙදා හැරීම යන කටයුතු ගුණාත්මකව සහ අහාර නිෂ්පාදනයට අදාළ පිරිවිතරයන්ට අනුව සිදු නොවීම යන කරුණු හේතුවෙන් ගුණාත්මක, පිරිසුදු පොල් තෙල් ලබා ගැනීමට නොහැකි වීම.
- ලාභ අපේක්ෂාව පමණක් පදනම් කර ගනිමින් පාම් තෙල් සමග පොල් තෙල් මිශ්‍ර කර විකිණීම,
- නිෂ්පාදිත සහ කල් ඉකුත්වීමේ දින සටහන් නොවීම.
- පොල් තෙල් නිපදවන ස්ථාන සහ බෙදාහැරීමේ ස්ථාන නියාමනය නොවීම.
- අපිරිසුදු පොල්තෙල් භාවිතය නිසා ඇති වන අයහපත් සෞඛ්‍ය ගැටලු පිළිබඳ ජනතාව තුළ නිසි අවබෝදයක් නොමැති වීම
- සංචාරක හෝටල්වලින් ඉවත් කරන භාවිත කළ තෙල්, කුඩා හෝටල්වල ආහාර සකස් කිරීම සඳහා භාවිත කිරීම... ආදී කරුණු ගණනාවක් නිසා සමාජීය, සහ සෞඛ්‍යමය ගැටලු රාශියක් පැන නැගී ඇත.

මෙම කරුණු සැලකිල්ලට ගනිමින් පොල් සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, සෞඛ්‍ය අමාත්‍යාංශයේ - පාරිසරික හා ආහාර සෞඛ්‍ය, ප්‍රජා පෝෂණ හා සෞඛ්‍ය අංශය , පාරිසරික හා ආහාර සෞඛ්‍ය, හා සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය මෙන්ම ශ්‍රී ලංකා වෛද්‍ය සභාව, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය එක්ව වසර 2ක් තිස්සේ පොල් තෙල් නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලා අධීක්ෂණය කරමින් ශ්‍රේණි ගත කිරීමක් සිදු කරන ලදී. එමගින් හඳුනාගත් කර්මාන්තශාලා 7 තව දුරටත් පූර්ණ අධීක්ෂණයට ලක් කරමින් ගුණාත්මක ලෙස නිෂ්පාදන සිදු කරන තත්ත්වයට පත්කොට ඇත.

එමෙන්ම මෙම කර්මාන්ත, පොල් සංවර්ධන අධිකාරියේ පරීක්ෂක සහ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ නිරන්තර අධීක්ෂණයට ලක්වේ.

මෙම සාමුහික ප්‍රයත්නයට වැවිලි අමාත්‍යාංශයේ මගපෙන්වීම ද නිරන්තරයෙන් ලද බැවින් මෙම කර්තව්‍යය අවුරුදු 2 ක් තුළදී ආරම්භ කර ක්‍රියාත්මක කිරීමට හැකි වීම සියලුම ආයතන මගින් සාමුහිකව ලද ජයග්‍රහණයකි.

ඒ අනුව මෙම කර්මාන්ත ශාලාවන්හි නිෂ්පාදිත පොල් තෙල් සඳහා පොල් සංවර්ධන අධිකාරියේ සහතිකය සහිත ලාංජනය ලබා දී ඇත. මෙම පියවර යටතේ පාරිභෝගිකයින් සඳහා පිරිසුදු පොල් තෙල් හඳුනා ගැනීමේ පහසුව සැලසේ. මෙය අඛණ්ඩව ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් වන අතරම මේ මගින් පාරිභෝගිකයාට ප්‍රමිතියෙන් යුතු ගුණාත්මක පොල් තෙල් පහසුවෙන් වෙළෙඳපොළින් ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

*පොල් නම් රටම අගයන - කළහැකි දේ අපමණ*

සැකසුම් සංවර්ධන අංශය
පොල් සංවර්ධන අධිකාරිය.

# වියළි කාලයේදී පොල් වගාවට වින කරන පළිබෝධකයින්

**පොල්, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වැවිලි භෝග අතර ජාතික වශයෙන් වැදගත්කමක් හිමි වන භෝගයක් වේ. ශ්‍රීලාංකීය ජන සමාජය තුළ පරිභෝජනයට මෙන්ම විවිධ නිෂ්පාදන කර්මාන්ත සඳහාද පොල් වැදගත් වේ. එමෙන්ම, ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් දක්වන කර්මාන්ත අතර, ප්‍රමුඛ ස්ථානයක් ගනී. පොල් වගාවෙන් වැඩි අස්වැන්නක් ලැබීම මගින් ඉහළ ඵලදයිතාවක් ලබාගත හැකි අතර එය ජාතික ආර්ථිකයට වැඩිදායකත්වයක් ලබාදීමට ඉවහල් වේ.**

පොල් වගාවේ අස්වැන්න කෙරෙහි බලපාන සාධක ගණනාවක් අතරින් පළිබෝධ හානියද වැදගත් සාධකයක් ලෙස සැලකිය හැකිය. පොල් වගාවේ විවිධ වයස් කාණ්ඩවලට හානි කරන ප්‍රධාන පළිබෝධ හානි කිහිපයක් ඇත. පළිබෝධ හානි නිසා පොල් අස්වැන්න සැලකිය යුතු ලෙස අඩුවන අතර දේශගුණික තත්ත්වයද පළිබෝධකයින්ගේ ව්‍යාප්තියට බලපානු ලබයි.

පොල් දළඹුවා, රතු කුරුම්ණියා හා පොල් මයිටාවා යන පළිබෝධකයින් තිදෙනාම වියළි කාලගුණික තත්ත්වයන් යටතේ ගහනය වැඩි කරගන්නා පළිබෝධකයින් වේ. පසුගිය වසරවල පැවති වියළි දේශගුණික තත්ත්ව යටතේ මෙම පළිබෝධකයින්ගේ ගහනය වැඩිවීමත් සමග අස්වනු හානියද සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි විය. මෙය ඉදිරියටද ඇති විය හැකි තත්ත්වයකි.ජාතික ආර්ථිකයටද මෙමගින් බලපෑමක් ඇතිවන බැවින් ඉහත පළිබෝධ හානි තත්ත්ව වළක්වාලීමට පියවර ගැනීම ඉතා වැදගත්වේ.

## පොල් දළඹු හානිය

විශේෂයෙන් වියළි කාලගුණික තත්ත්වය යටතේ පැතිරී යන පොල් දළඹු හානිය, පොල් අස්වැන්න අඩුවීම කෙරෙහි බලපායි. පොල් ගසේ පත්‍රවලට හානි කරන පොල් දළඹුවා පත්‍රයේ යටි පැත්ත සූරා කෑම නිසා පත්‍ර දුඹුරු පැහැ වී වියළීම නිසා පිළිස්සුම් ස්වභාවයක් ඇතිවේ. මෙසේ පත්‍රවලට සිදුවන හානියේ බලපෑම නිසා ගස දුර්වල වී අස්වැන්න අඩුවීමක් සිදුවේ. හානිය නිසි ලෙස කළමනාකරණය නොකළ හොත් ගස් මියයාම පවා සිදුවිය හැකිය.

හානිය ආරම්භයේදීම හඳුනාගෙන ජීව විද්‍යාත්මක ක්‍රම භාවිත කිරීමෙන් ඉතා සාර්ථක ලෙස හානිය කළමනාකරණය කරගත හැකිය. මේ සඳහා පොල් දළඹුවාගේ කීට සහ පිලා පරපෝශීතයින් හානි ක්ෂේත්‍රයන්ට නිදහස් කරනු ලැබේ.

පොල් දළඹු පරපෝශිතයින් පොල් වගාකිරීමේ මණ්ඩලයේ මඩකලපුව, හම්බන්තොට හා මුන්දලම යන කීටාගාර සහ පොල් පර්යෂණ ආයතනයේ මධ්‍යම කීටාගාරයෙන් හානි වාර්තා වන ඉඩම් සඳහා ලබාගත හැකිය. මේ සඳහා ඉහත විස්තර කළ හානි ලක්ෂණ ඔබගේ ඉඩමේ දක්නට ලැබේ නම් හැකි ඉක්මනින් ප්‍රදේශයේ පොල් සංවර්ධන නිලධාරිහට දැනුම් දෙන්න.

## රතු කුරුම්ණී හානිය







පොල් වගාවේ රතු කුරුම්ණී හානිය වසර තුනත්(03) දහයත්(10) අතර පොල් වගාවට තදබල හානියක් ගෙන දෙයි. රතු කුරුම්ණී හානිය පොල් වගාවට මාරාන්තික වන අතර විශේෂයෙන්ම පීදුණු පොල් වගාව (වසර 5-10ත් අතර) හානියට පාත්‍ර වූ විට එවායේ අස්වැන්න නැතිවී යයි. මෙම හානිය වියළි කාලයේදී වැඩිපුර දැක ගත හැකි අතර රතු කුරුම්ණී ගහනය වැඩිවීමද නිරීක්ෂණය කර ඇත.

රතු කුරුම්ණී හානි කළමනාකරණය සඳහා ඒකාබද්ධ රතු කුරුම්ණී මර්ධන ක්‍රමය හඳුන්වාදී ඇති අතර පූර්ණ ප්‍රජා සහභාගිත්වයෙන් මර්දන ක්‍රම සිදුකිරීම අත්‍යාවශ්‍යය. ඒකාබද්ධ රතු කුරුම්ණී මර්දන ක්‍රමවේදයේ ප්‍රධාන පියවරයන් වන්නේ හානි ගස් පිරික්සුම, පූර්ව ප්‍රතිකාර කිරීම, හානිවූ ගස් පුළුස්සා දැමීම, බේරාගතහැකි මට්ටමේ ගස්වලට කෘමිනාශක යෙදීම හා අවසාන පියවර ලෙස හානිය වාර්තාවන මුළු ප්‍රදේශයම ආවරණය වන පරිදි සුහුඹුල් රතු කුරුම්ණියන් උගුල් ගත කිරීමට නිර්දේශිත පෙර මොන උගුල් යෙදීම වේ. තවද, මෙය සැලසුම් ගත කාල රාමුවකට අනුව සිදු කිරීම අත්‍යාවශය අතර එමගින් කෘමි ගහනය අඩුවී හානිය නිසි ලෙස කළමනාකරණය කරගත හැකිය.

## පොල් මයිටා හානිය

පොල් අස්වැන්න කෙරෙහි සෘජුවම බලපාන පළිබෝධකයකු ලෙස පොල් මයිටාවා හඳුන්වා දිය හැකිය. වියළි කාලගුණික තත්ත්වය යටතේ පොල් මයිටා ගහනය වැඩි වන අතර පොල් මයිටාවා මාස තුනත් හතරත් අතර කුඩා බැට්ටිවල තැරිය යට පටකයන්ගේ යූෂ උරා බොයි. මෙසේ යූෂ උරා බීම නිසා පොල් ලෙල්ලට හානි ගෙනදෙයි. තවද කුඩා ගෙඩි හැලී යාම, අක්‍රමවත් ගෙඩි හට ගැනීම, ලෙල්ල ඝනකම් වීම වැනි හානි ලක්ෂණ ඇති වේ. පොල් මයිටා හානිය හේතුවෙන් සාමාන්‍යයෙන් අඩු වන අස්වනු ප්‍රතිශතය 30% - 40% පමණ වේ. එබැවින් මෙය ජාතික පොල් නිෂ්පාදනය අඩුවීමට



සෘජුවම බලපාන හේතුවක් වේ.

මයිටා හානි කළමනාකරණය සඳහා දැනට වගාකරුවන් වෙත ලබාදී ඇති නිර්දේශ වන්නේ පාම් ඔයිල්, සල්ෆර් මිශ්‍රණය යෙදීම සහ විලෝපික මයිටාවා යෙදීම වේ. හානිය තිබූ ඉඩම් සඳහා පාම් ඔයිල්, සල්ෆර් මිශ්‍රණය යොදා මාසයකට පසු විලෝපික මයිටාවන් කිහිප වතාවක් යෙදීමෙන් මයිටා හානිය නිසිපරිදි කළමනාකරණය කරගත හැකිය.

පොල් මයිටාවන් මර්-දනයට යොදා ගන්නා විලෝපික මයිටාවන් දිවයින තුළ පිහිටුවා ඇති විලෝපික මයිටා අභිජනන විද්‍යාගාර තුළදී අභිජනනය කර මයිටා හානිය සහිත ඉඩම්වලට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

ඉහත විස්තර කළ පරිදි වියළි දේශගුණික තත්ත්ව යටතේ පොල් වගාවේ අස්වැන්න අඩු වීමට ඉවහල් වන ප්‍රධාන පළිබෝධකයින් නිසි ලෙස කළමනාකරණය කිරීමෙන් අපේක්ෂිත අස්වනු ඉලක්ක කරා යාමට පහසුවක් වනු ඇත.

එස්. ඒ. එස්. එම්. සිල්වා,
විෂයානුබද්ධ විශේෂඥ (පැළෑටි සංරක්ෂණ),
පොල් වගාකිරීමේ මණ්ඩලය.

















# ජාත්‍යන්තර පොල් දිනය 2020 අභිමානයෙන් සමරමු.

## 2020 ජාත්‍යන්තර පොල් දින සැමරුම් සමාරම්භක උත්සවය

**පොල්, කිතුල්, තල් හා රබර් වගාව ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍ය ගරු අරුන්දික ප්‍රනාන්දු මැතිතුමාගේ සහභාගිත්වයෙන්**

**වැවිලි අමාත්‍ය ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්**

**2020 සැප්තැම්බර් මස 02 දින**

**ලුණුවිල පොල් පර්යේෂණ ආයතන පරිශ්‍රයේදී පැවැත්වෙන වගයි.**



## කප්රුක පණ මෙන් සුරකිමු.

ඔබ පොල් ගසේ අස්වැන්න එක් මුරයකට ගෙඩියකින් හෝ ගෙඩි දෙකකින් වැඩි කර මෙරට පොල් හිඟය පරදවමු. අත මිට සරු කර ගනිමු. ජාතික ආර්ථිකයට ශක්තියක් වෙමු.

**නිසි කලට ජලය, පොහොර යොදන්න - වැඩි ඵලදාවක් ලබා ගන්න.**

### පිරිසිදු පොල් තෙල් පරිභෝජනයට අපිත් හුරුවෙමු.




ආහාර සඳහා නුසුදුසු වෙනත් බාල තෙල් වර්ග පොල් තෙල් සමග මිශ්‍ර කිරීම නිසා එම තෙල් පරිභෝජනයෙන් ඇතිවන අයහපත් සෞඛ්‍යය හේතු රාශියක් ඇත. එම නිසා ඔබත් බෝ නොවන රෝගවල ගොදුරක් නොවී පොල් සංවර්ධන අධිකාරිය විසින් සහතික කල, වෙනත් තෙල් වර්ග සමග මිශ්‍ර නොකල, පිරිසිදු පොල් තෙල් පමණක් පරිභෝජනයට හුරුවන්න.

### 2023 දී පොල් කර්මාන්තයෙන් ඩොලර් බිලියනයක අපනයන ආදායමක්



2021, 2022, 2023 වර්ෂ සඳහා වූ කෙටි කාලීන හා මධ්‍ය කාලීන පොල් සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙන් වර්ෂ 2023 අවසන් වන විට පොල් කර්මාන්තයෙන් අපනයන ආදායම රුපියල් බිලියන 170ක් හෙවත් ඩොලර් බිලියනයක් දක්වා ඉහල නැංවීමට අපේක්ෂා කෙරේ.

### නව දෙමුහුම් පොල් ප්‍රභේදයක්



- පොල් සැකසුම් පර්යේෂණ අංශයේ "ප්‍රශස්ත ව්‍යාපාරික ඒකකය" විවෘත කිරීම
- වසර 3-4 ක් වැනි කෙටි කාලයකදි පීදිම, ගසකට ගෙඩි 125-150 ක ඉහළ ඵලදාවක් ලබා දීම, මයිටා හානියට යම් ප්‍රතිරෝධයක් දැක්විම යන විශේෂ ගුණාංග සහිත **CRISL 2020** නව දෙමුහුන් පොල් ප්‍රභේදය හඳුන්වාදීම
- නව රතු කුරුම්ණි විකර්ෂකය හඳුන්වාදීම

2020 සැප්තැම්බර් 02 දින සිදු කෙරේ.

### ගෘහස්ථ පොල් නාස්තිය අවම කරමු පොල් කිරි භාවිතයට හුරුවෙමු!



ගෘහස්ථ පරිභෝජනයේදි සිදුවන 40% පොල් නාස්තිය පිටු දකිමු.

කාර්ය බහුල ගෘහණියනි, ඔබට පහසුවක්- රටට ඉතිරියක්

පොල් ගෙඩි වෙනුවට සැකසුම් කරන ලද පොල් කිරි භාවිතයට හුරු වෙමු.



### වැවිලි අමාත්‍යතුමාගේ පණිවිඩය

"කප්රුක" නමින් අනාදිමත් කාලයක සිට හඳුනාගැනෙන පොල් ගසට ක්‍රි.පූ. 150 ඉක්ම වූ කාලයක් දක්වා දිවෙන ලිඛිත ඉතිහාසයක් ඇත. දැනට 0.7% දළ දේශීය නිෂ්පාදන ධාරිතාවක් දරමින් දේශීය ආර්ථිකය සඳහා දායකත්වය ලබාදීමට පොල් කර්මාන්තට හැකියාව ලැබී ඇත.

1840 සිට දේශීය ව්‍යාපාරිකයෝ පොල් කර්මාන්තයට ආයෝජනය කළ හෙයින්, එවකට යුරෝපීය වෙළඳපොළ සඳහා පොල් තෙල් සැපයූ ප්‍රධාන රටක් වශයෙන් සුවිශේෂ ස්ථානයක් ශ්‍රී ලංකාවට හිමි වී තිබුණි.

1978 වසරේ සිට මේ දක්වා අමාත්‍යාංශයක් ලෙස දියුණු කෙරුණු පොල් කර්මාන්ත ක්ෂේත්‍රය, 1998 වසරෙහි සිට වසර 22ක් පුරා පොල් දිනය සමරයි.

ඵලදායිතාව ඉහළ නංවමින්, පොල් හා ඒ ආශ්‍රිත නිෂ්පාදනයන් දියුණු කිරීමත් අරමුණුකොට, 2021 වසරේ සිට කෙටි කාලීන මෙන්ම මධ්‍ය කාලීන සැලසුම් ක්‍රියාත්මක කිරීමෙන්, වර්ෂ 2025 අවසානයේ දී පොල් කර්මානයේ ජයග්‍රහණ රැසක් ලබා ගැනීමට විධිමත් සැලසුම් සකස් කර ඇත. එතුළින් ඩොලර් බිලියන 1.5ක් දක්වා අපනයන ආදායම ඉහළ නැංවීමත්, සෘජු හා වක්‍ර රැකියා අවස්ථා බිහිකිරීමත්, ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමත් අපේක්ෂාව වේ.

ශ්‍රී ලංකාවට නැවතත් ස්වර්ණමය යුගයක් උදා කිරීමේ පරමාර්ථ සමඟ, අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම සාක්ෂාත් කරමින්, ගරු අග්‍රාමාත්‍යතුමාගේ උපදෙස් පරිදි, දේශීය ආර්ථිකය සවිමත් කිරීමේ බලාපොරොත්තුවෙන් ජාත්‍යන්තර පොල් දිනය සමරන්නට ලැබීම භාග්‍යයක් කොට සලකමි.

**වෛද්‍ය රමේෂ් පතිරණ**
වැවිලි අමාත්‍ය



### පොල්, කිතුල්, තල් හා රබර් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ මුළු අපනයන ආදායමට 5% ක දායකත්වයක් ලබා දෙන මෙරට පොල් කර්මාන්තයෙන් 2019 වසරේ ලද විදේශ විනිමය ප්‍රමාණය රුපියල් බිලියන 109 කි. පොල් නිෂ්පාදනයේ යෙදෙන පිලිපීනය, ඉන්දුනීසියාව හා ඉන්දියාව වැනි රටවල් සමග දැඩි තරඟයකට මුහුණදෙමින් සිටින ශ්‍රී ලංකාව, විදේශීය වෙළඳපොළ තහවුරු කර ගැනීමට නම් තවදුරටත් පොල් වගාව හා පොල් කර්මාන්තය වර්ධනය කළ යුතුය. පොල් වගාවේ හා පොල් කර්මාන්තයේ නියුතු ලක්ෂ සංඛ්‍යාත රැකියාලාභී පිරිස තව දුරටත් ඉහළ නංවා ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම හා ඒ තුලින් ලබන විදේශ විනිමය ප්‍රමාණය තව දුරටත් වර්ධනය කිරීමට ශ්‍රී ලාංකිකයින් වන අප සැම අධිෂ්ඨාන කරගනිමුයි යෝජනා කරමි. එසේම අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය යථාර්ථයක් කර ගනිමින් ශ්‍රී ලංකාව ලෝකයේ හොඳම පොල් වගා කරුවා වෙමින් පොල් ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය ළඟාකර ගැනීමට හැකිවේවායි ජාත්‍යන්තර පොල් දිනය සමරන මේ මොහොතේ මම ප්‍රාර්ථනා කරමි.

**අරුන්දික ප්‍රනාන්දු**
පොල්, කිතුල්, තල් හා රබර් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍ය



### වැවිලි අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලාංකේය වැවිලි ක්ෂේත්‍රය තුළ පොල් වගාව හා පොල් කර්මාන්තයේ නියැලෙන ලක්ෂ පහක පමණ ව්‍යවසායකයින් මෙරට ආර්ථිකයට අති මහත් දායකත්වයක් සපයයි. එබැවින්, මෙරට පොල් වගාව දීප ව්‍යාප්තව ඇති හෙක්ටයාර 440,450ක ප්‍රමාණය සංවර්ධනය කරමින් ජාතික ආදායම ඉහළ නැංවීමට කටයුතු කිරීම අභිප්‍රායක් කර ගත යුතුය. ඒ සඳහා වර්ෂ 2020 සිට 2025 වර්ෂය වන විට ඉලක්ක ගත පොල් අස්වැන්න ගෙඩි මිලියන 4,000ක් කරා ළඟා වෙමින් දේශීය පොල් කර්මාන්ත අංශයේ ඵලදායිතාවය ඉහළ නැංවීම, කර්මාන්ත නවීකරණය, නිෂ්පාදන විවිධාංගීකරණය, දේශීය පොල් මිළ ප්‍රශස්ථ ලෙස පවත්වාගෙන යාම හා අපනයන වෙළපොල නව ප්‍රවණතා ජයගැනීම තුළින් වැවිලි ක්ෂේත්‍රයේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රමුකයා බවට පත්වීමට අප අරමුණු කර කරගත යුතුය. "නව තාක්ෂණය මුසුවූ අපනයන කේන්ද්‍රීය වැවිලි කර්මාන්තයක්" යන පැහැදිළි දැක්ම පොල් ක්ෂේත්‍රය තුළ හුදෙක් යථාර්තවාදීව ස්ථාපනය කිරීම සඳහා වන ප්‍රතිපත්ති සම්පාදනය ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා පසු විපරම් කිරීම උදෙසා කැපවීම රාජ්‍ය අංශය වෙතින් අපේක්ෂා කෙරේ. මෙරට ජන ජීවිතය හා දැඩිව බැඳුනු "කප්රුක" ලෙස විරුදාවලිය ලත් පොල් ගස තුළින් සමස්ථ ආර්ථිකයට නව පුනර්ජීවයක් ලබා දෙමින් ජාතියේ අපේක්ෂාවක් ලෙස නඟා සිටුවීමට අප අමාත්‍යාංශය කැපවී සිටින බවද ජාත්‍යන්තර පොල් දිනය සමරන මේ මොහොතේ සඳහන් කරනු කැමැත්තෙමි.

**රවින්ද්‍ර හේවාවිතාරණ**
ලේකම් -වැවිලි අමාත්‍යාංශය



### පොල්, කිතුල්, තල් හා රබර් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය,

කෘෂි ආර්ථිකය පදනම් කර ගත්, ශ්‍රී ලාංකිකයකුගේ ආහාර පරිභෝජනයේදී පොල්වලට හිමි වනුයේ ප්‍රධාන ස්ථානයකි. පොල් වගාවේ ඵලදායීත්වය ඉහළ නැංවීම තුළින් කර්මාන්තයන් හා ගෘහස්ථ පරිභෝජනයන් සඳහාවන ගෙඩි පොල් අවශ්‍යතාව සැපිරීම අත්‍යවශ්‍ය කරුණකි. දේශීය පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 2800-3000 කි. එයින් ගෙඩි මිලියන 1800ක් වාර්ෂික භෝජනයට ගැනේ. සෙසු ප්‍රමාණය, පොල් කර්මාන්තය සඳහා යොදා ගැනේ. දැනට ලංකාවේ පොල් වගාබිම් ප්‍රමාණය හෙක්ටයාර 440,450 කි. ඉදිරි කාලය තුළ පොල් වගාවේ ඵලදායිතාවය ඉහළ නැංවීමෙන් අපනයනය දිරිමත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමේ වගකීම අප හඳුනාගෙන ඇත.

ජාත්‍යන්තර පොල් ප්‍රජාව විසින් සමරන ලෝක පොල් දිනය ශ්‍රී ලංකාවේ පොල් වගාවේ උන්නතියට වඩාත් ඵලදායී ලෙස යොදාගැනීම සඳහා අප රාජ්‍ය අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ 2020.08.31-2020.09.06 දින දක්වා පොල් වගා සහ කර්මාන්ත ප්‍රවර්ධන වැඩසටහන් දීපව්‍යාප්ත මට්ටමින් සිදු කිරීමට කටයතු සූදානම් කර ඇත. පොල් දිනය පවත්වමින් ශ්‍රී ලංකාවේ ජන ජීවිතයට සහ ජාතික ආර්ථිකයට වැදගත්, පොල් වගාවේ උන්නතිය උදෙසා ක්‍රියාත්මක කරන සියළු කටයුතු අතිශයින් සාර්ථක කර ගැනීමට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**තිස්ස හේවාවිතාන**
ලේකම්- පොල්, කිතුල්, තල් හා රබර් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍යාංශය



### පොල් සංවර්ධන අධිකාරිය/ පොල් වගා කිරීමේ මණ්ඩලය/ පොල් පර්යේෂණ ආයතනය යන ආයතන ත්‍රිත්වයේ සභාපතිතුමාගේ පණිවිඩය

පොල් කර්මාන්තය ආශ්‍රිත සියළු නිෂ්පාදන දියුණු කිරීමෙන් ජාතික ආර්ථිකය ඉහළ නැංවීමට මහත් දායකත්වයක් ලැබේ. එය පොල් සංවර්ධන අධිකාරියේත්, පොල් වගා කිරීමේ මණ්ඩලයේත්, පොල් පර්යේෂණ ආයතනයත් සතු ප්‍රධාන වගකීම වේ. ආසියානු පැසිපික් ප්‍රජාවගේ අවධානය පොල් කර්මාන්තය කෙරෙහි යොමු කර පොල් වගාවට හා පොල් කර්මාන්තයට නව ආයෝජකයින් එක් කිරීමෙන් පොල් වගා කරුවන්ගේ ආදායම ස්ථාවර කිරීමේ හා වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරි කර 1998දී ජාත්‍යන්තර පොල් දිනය ප්‍රකාශයට පත් කර ඇත.

ජනතාවගේ පාරිභෝජන හා කර්මාන්ත අවශ්‍යතා සදහා අවශ්‍ය වාර්ෂික පොල් නිෂ්පාදනය සම්පූර්ණ කිරීමටත්, පොල් කර්මාන්තයේ නිෂ්පාදන ඉලක්ක සම්පූර්ණ කරමින් පොල් නිෂ්පාදන ජාත්‍යන්තර වෙළඳපොළට අපනයනය කර ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමත් තුළින් මෙරට පොල් වගාවේ හා පොල් කර්මාන්තයේ නව පුනර්ජීවයක් ඇතිකර ගැනීමට ඉදිරි වසර 5 තුළ හැකියාව ලැබෙන බව සඳහන් කරමි. අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම සාක්ෂාත් කිරීම උදෙසා ගරු අග්‍රාමාත්‍යතුමාගේ ද උපදෙස් සමග, අප අමාත්‍යාංශය මගින් සිදුකරන්නට නියමිත ඉදිරි කටයුතු සාර්ථක කර ගැනීමට හැකියාව ලැබේවායි 2020 වසරේ දී ජාත්‍යන්තර පොල් දිනය සමරන මේ මොහොතේ මම ප්‍රාර්ථනා කරමි.

**ජයන්ත වික්‍රමසිංහ**
සභාපති-පොල් සංවර්ධන අධිකාරිය/ පොල් වගා කිරීමේ මණ්ඩලය/ පොල් පර්යේෂණ ආයතනය



### ජාත්‍යන්තර පොල් ප්‍රජාවේ (International Coconut Council) විධායක අධ්‍යක්ෂකතුමියගේ පණිවිඩය

ජාත්‍යන්තර පොල් වගාව සහ පොල් නිෂ්පාදන ප්‍රචලිත කිරීමට දරන උත්සාහය පිලිබඳව ලෝක පොල් දිනය සමරන මේ මොහොතේ එම සියලු පාර්ශවයන් වෙත සුභ පැතීමට අවස්ථාවක් කරගන්නෙමි.

මෙම වසරේ ලෝක පොල් දිනයේ තේමාව වී ඇත්තේ "පොල් සඳහා ආයෝජනය කර ලෝකය බේරා ගනිමු" යන්නයි. මෙම තේමාව සත්‍ය ලෙසම පොල් හා පොල් ආශ්‍රිත නිෂ්පාදන මගින් රටක ආර්ථිකය, සෞඛ්‍යය, සංස්කෘතිය සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා ලෝකයේම සුභ සිද්ධිය උදෙසා ලබාදෙන දායකත්වය පිලිබිඹු කරනවා.

මෙම වසරේ ආරම්භයත් සමග ඇති වූ කොවිඩ් වසංගතය සෘජුවම සමස්ත මානව වර්ගයාගේ සෞඛ්‍යය, ආර්ථික, පාරිසරික, සමාජීය වර්ධනයට සෘජුවම හානිදායක වන ලෙස බලපාන ලදී. මෙම තත්ත්වය පොල් සහ පොල් ආශ්‍රිත කර්මාන්තය සඳහා ද විශාල අභියෝගයක් වි ඇත.

එබැවින් මෙම තත්වය හමුවේ පැන නැගී ඇති අභියෝගයට මුහුණ දීමට නම් පොල් ප්‍රජාවේ සංවිධානාත්මක ක්‍රමානුකුල ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කර නව හැකියාවන් හා නවොත්පාදකයින්ට අවස්තාව ලබාදෙමින් කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වැඩි කරමින් සියලු අංශ ගුණාත්මකව නගා සිටුවීමට ඒකරාශී වීම තුලින් මෙම අභියෝග ජය ගැනීම දැකීම මාගේ ඒකායන ප්‍රාර්ථනයයි.

**ජෙල්ෆිනා අලෝවු මහත්මිය**
විධායක අධ්‍යක්ෂක- ජාත්‍යන්තර පොල් ප්‍රජාව (International Coconut Council)



## පොල් නම් රටම අගයන - කළ හැකි දේ අපමණ

පොල් සංවර්ධන අධිකාරිය | පොල් පර්යේෂණ ආයතනය | පොල් වගා කිරීමේ මණ්ඩලය

# ලොව පුරා කොරෝනා රෝගීන් ගණන කෝටි දෙක හමාර පනී

## 854,809ක් මරුට

**මහින්ද අලුත්ගෙදර**

ලොව පුරා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් තිබෙන කොවිඩ් 19 හෙවත් නව කොරෝනා වෛරසය ආසාදනයවූවන් සංඛ්‍යාව ලක්ෂ 256 ඉක්මවා ගොස් ගොස් තිබේ.

නවතම දත්තවලට අනුව වාර්තා වන මියගිය සංඛ්‍යාව 854,809ක් වන අතර, මුළු ආසාදිතයන් සංඛ්‍යාව 25,641,965 ක් වෙයි. ඒ අතරින් 17,943,965 දෙනෙකු සුවය ලබා තිබෙන බව වාර්තා වෙයි.

වැඩිම ආසාදිතයන් පිරිස අමෙරිකාවෙන් වාර්තා වන අතර එම සංඛ්‍යාව 6,211,796 ක් වෙයි. එරට මිය ගිය සංඛ්‍යාව 187,736 ක් වෙයි.

මේ අතර බ්‍රසීලයේ ආසාදිතයන් සංඛ්‍යාව 3,910,901ක් ලෙස වාර්තා වන අතර රුසියාව, පේරු, දකුණු අප්‍රිකාව, කොලොම්බියාව, මෙක්සිකෝව යන රටවලින් ලක්ෂ පහ ඉක්ම වූ ආසාදිතයන් පිරිසක් වාර්තා වෙයි. ඊට අමතරව ස්පාඤ්ඤය, ආර්ජන්ටිනාව, බ්‍රිතාන්‍ය, තුර්කිය, ඉතාලිය, චිලී, ඉරානය, ඉරාකය, මෙක්සිකෝව, පාකිස්තානය, ප්‍රංශය සහ පිලිපීනය යන රටවල ආසාදිතයන් දෙලක්ෂයේ සීමාව ඉක්මවා ගොස් තිබේ.

මේ වනවිට කොවිඩ් නයින්ටීන් ආසාදනයවීම හේතුවෙන් ලොව පුරා මියගිය සංඛ්‍යාව ලක්ෂයකට වැඩි පිරිසක් අමෙරිකා එක්සත් ජනපදයෙන් සහ බ්‍රසීලයෙන් වාර්තා වන අතර බ්‍රසීලයේ මියගිය සංඛ්‍යාව 121,515ක් වේ.

ජෝන්ස් හොප්කින්ස් විශ්වවිද්‍යාලයේ සංඛ්‍යා ලේඛන අනුව කොවිඩ් නයින්ටින් වෛරසය හේතුවෙන් ස්පාඤ්ඤයේ 29094 ක්, ඉතාලියේ 35483 ක්, ප්‍රංශයේ 30635 ක්, බ්‍රිතාන්‍යයේ 41501 ක්, බ්‍රසීලයේ 121515, රුසියාවෙ 17176, බෙල්ජියමේ 9895, ඉරානයේ 21571, නෙදර්ලන්තයේ 6224, මෙක්සිකෝවේ 64414, කැනඩාව 9126 සහ ජර්මනියේ 9371 ලෙස මරණ වාර්තා වී තිබේ. ඊට අමතරව අසල්වැසි ඉන්දියාවේ ආසාදිතයන් 3,694,878ක් වාර්තා වන අතර මියගොස් තිබෙන සංඛ්‍යාව 65,469කි.

චීනයේ හුබෙයි පළාතේ වූහාන් නගරයෙන් ව්‍යාප්ත වීමට පටන් ගත් නව කොරෝනා වෛරසය පැතිර යෑමේ නව කේන්ද්‍රස්ථානය බවට අමෙරිකානු කලාපය සහ ආසියාව පත්ව ඇතැයි ලෝක සෞඛ්‍ය සංවිධානය පෙන්වා දෙයි. නව කොරෝනා වෛරසය හේතුවෙන් අගෝස්තු මාසය වනතෙක් බ්‍රසීලය ඇතුළු අනෙක් ලතින් ඇමෙරිකානු රටවලින් වෛරස ආසාදිත මරණ වාර්තා වනු ඇතැයි ද ලෝක සෞඛ්‍ය සංවිධානය සඳහන් කරයි.

මේ වනවිට ලොව වැඩිම ආසාදිතයන් සංඛ්‍යාවක් වාර්තා වන රටවල් ලැයිස්තුවේ තවදුරටත් පෙරමුණේ පසුවන්නේ අමෙරිකාව වන අතර බ්‍රසීලය 02 ස්ථානයේත්, ඉන්දියාව තෙවන ස්ථානයේත්, රුසියාව සිව්වන ස්ථානයේත් පසුවෙයි.

## වකුගඩුවක් දන් දී ජීවිතයක් බේරා ගන්න



කිරිදිවැල, මාහල්ඔලුව ඉඹුල්හේන අංක 53 පදිංචි ඒම්. බී. තිලංග ශ්‍රීපති සදමාල් (38) යන අය වකුගඩු රෝගයකින් පෙළෙයි.

ඒක් දරු පියකු වන ඔහුට වකුගඩුවක් බද්ධ කළ යුතු වන බවට ඔහුට ප්‍රතිකාර කරන කොළඹ වකුගඩු රෝහලේ වෛද්‍ය අනුර හේවාගීගන මහතා නිර්දේශ කර ඇත.

ඔහුට ඕ පොසිටිව් වර්ගයේ හෝ බී පොසිටිව් වර්ගයේ වකුගඩුවක් බද්ධ කළ යුතු වන අතර, වකුගඩුවක් පරිත්‍යාග කරීමට කැමති අයකු වෙතොත් දුරකථන අංක 0772617536 ට දන්වන මෙන් සදමාල් මහතා කාරුණික ඉල්ලීමක් කරයි.

## විජය පුවත්පත් සමාගමේ සේවක ජයන්තගේ අවසන් කටයුතු අද



විජය පුවත්පත් සමාගමේ ප්‍රවාහන අංශයේ සේවය කළ ජී.වී.ඩී ජයන්ත සංජීව මහතා අභාවප්‍රාප්ත විය. ආර්.එම්.මල්ලිකා රත්නායක මහත්මියගේ ස්වාමි පුරුෂයා වූ ජයන්ත සංජීව මහතා ඒෂාන් උෂිර සංජීවගේ පියාණන් වේ. අභාවප්‍රාප්ත වන විට පනස් එක්වන වියෙහි පසු වූ ජයන්ත සංජීව මහතා විජය පුවත්පත් සමාගමේ වසර තිස් දෙකක් පමණ පැරණි සේවකයෙකි.

දේහය අංක 215 ඒ , හෙට්ටිගේ මණ්ඩිය පාර, වැවිට, බණ්ඩාරගම නිවසේ තැන්පත් කර ඇති අතර අවසන් කටයුතු බණ්ඩාරගම අඳුන්වැන්න ආදාහනාගාරයේ දී අද (2) පස්වරු 4:30ට සිදුකෙරෙයි.



මාතර ප්‍රාදේශීය ලේකම් දීපිකා කේ. ගුණරත්න මහත්මිය රචිත 'නිල්නදී දියණිය' කෘතිය දෙරට වැඩීම පසුගිය 21 ද මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේදී පැවැත්විණි. එහි ප්‍රධාන දේශනය රාජ්‍ය සම්මානලාභී, ගත්කරු ගාමිණී කුමාර විතාන මහතා පැවැත් වූ අතර, එම අවස්ථා මාතර දිස්ත්‍රික් ලේකම් ප්‍රදීප් රත්නායක, දකුණු පළාත් ආණ්ඩුකාර ලේකම් දිලේබා කුඩාච්චි, 613 බලසේනාංකයේ සේනාධිපති බ්‍රිගේඩියර් කීර්ති කෝට්ටෙවත්ත යන මහත්ම මහත්මීන් සමග ප්‍රාදේශීය ලේකම්වරුන්, නිලධාරීන් ඇතුව පිරිසක් සහභාගි වී වූහ. එහිදී කර්තෘවරිය මාතර දිස්ත්‍රික් ලේකම් ප්‍රදීප් රත්නායක මහතාට පොත පිළිගැන් වූ අයුරු.




# තුරුසවිය අරමුදල මගින් පවත්වනු ලබන නවක කිරි අස්වනු සහායක ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහන - 2020



**1. වැඩසටහන - කෑගල්ල දිස්ත්‍රික්කය**
2020.09.04 - දැනුවත් කිරීමේ වැඩසටහන
දිසා උපදේශක කාර්යාලය - පෙ. ව. 10.30
2020.09.07 - පුහුණුව ආරම්භක දිනය
2020.09.13 - අවසාන දිනය
විමසීම් - නයනා දර්ශනී මිය 071-8251690
- චන්දිමා ප්‍රියදර්ශනී මිය 071-4408144
- අමිතා රත්නායක මිය 071-5759067
- සමීර ජයවර්ධන මයා 071-4482087

**2. වැඩසටහන - රත්නපුර දිස්ත්‍රික්කය**
2020.09.18 - දැනුවත් කිරීමේ වැඩසටහන
කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරය - පෙ. ව. 10.30
2020.09.21 - පුහුණුව ආරම්භක දිනය
2020.09.27 - අවසාන දිනය
විමසීම් - මංගලා කුමාරිහාමි මෙනවිය 071-535448
- සමීර ජයවර්ධන මයා 071-4482037

**3. වැඩසටහන - කළුතර දිස්ත්‍රික්කය**
2020.09.22 - දැනුවත් කිරීමේ වැඩසටහන
නිවිතිගල කැලේ පුහුණු මධ්‍යස්ථානය
2020.09.23 - පුහුණුව ආරම්භක දිනය
2020.09.29 - අවසාන දිනය
විමසීම් - අචල චතුරංග මයා 071-3218218
- සුදත් ගලබඩ මයා 071-8037710

**4. වැඩසටහන - මොණරාගල දිස්ත්‍රික්කය**
2020.10.02 - දැනුවත් කිරීමේ වැඩසටහන
කුඹුක්කන රබර් පර්යේෂණායතනය - පෙ.ව. 10.30
2020.10.03 - පුහුණුව ආරම්භක දිනය
2020.10.09 - අවසාන දිනය
විමසීම් - සුමේධ විජයංග බණ්ඩාර මහතා 071-0948746

**5. වැඩසටහන - බදුල්ල දිස්ත්‍රික්කය (පල්ලෙකිරුව)**
2020.11.04 - දැනුවත් කිරීමේ වැඩසටහන
පල්ලේකිරුව රජමහා විහාරස්ථානය - පෙ.ව.10.30
2020.11.05 - පුහුණුව ආරම්භක දිනය
2020.11.11 - අවසාන දිනය
විමසීම් - ධනුෂ්ක මහතා - 071-1672909
- සුමේධ විජයංග බණ්ඩාර මහතා 071-0948746

**6. වැඩසටහන - ගාල්ල දිස්ත්‍රික්කය**
2020.11.09 - දැනුවත් කිරීමේ වැඩසටහන
යක්කලමුල්ල ප්‍රා.ලේ.කාර්යාලය - පෙ.ව.10.30
2020.11.10 - ආරම්භක දිනය
2020.11.16 - අවසාන දිනය
විමසීම් - නිෂාදි සේනානායක මිය 071-4405882
- සඳරුවන් මයා 070-5573134

**7. වැඩසටහන - කොළඹ දිස්ත්‍රික්කය**
2020.11.18 - දැනුවත් කිරීමේ වැඩසටහන
කණංපැල්ල ශ්‍රී සුමනාරාම විහාරස්ථානය - පෙ.ව. 10.30
2020.11.19 - පුහුණුව ආරම්භක දිනය
2020.11.25 - අවසාන දිනය
විමසීම් - ඉරේෂා මුණසිංහ මිය 070-5137166

**වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ තුරුසවිය අරමුදල විසින් සංවිධානය කර මෙහෙයවන නවක කිරි අස්වනු සහායක ශිල්පීන් පුහුණු කිරීමේ වැඩසටහන මෙවරත් කෑගල්ල දිස්ත්‍රික්කයෙන් ආරම්භ වන වගයි. මෙම පාඨමාලාව සියලු පහසුකම් සහිතව සම්පූර්ණයෙන් නොමිලේ රබර් කිරි කැපීම් වෘත්තියේ නියැළීමට කැමැත්තක් දක්වන වයස 18 - 50 ත් අතර ඔබ සියලු දෙනාට මේ සඳහා අයදුම් කළ හැක. පාඨමාලාව සාර්ථකව නිමකරන්නන් සඳහා වටිනා උපකරණ කට්ටලයක් හා පිළිගත් සහතික පත්‍රයක් ප්‍රදානය කරනු ලැබේ.**

**විමසීම්**
ලිපිනය : සභාපති, තුරුසවිය අරමුදල, අංක 39, ශ්‍රී සුභූතිපුර, බත්තරමුල්ල.
දුරකථන : 0112-863786
ෆැක්ස් : 011-2863786
වි තැපැල් : thurusaviya2000@gmail.com

# ශ්‍රී ලංකා ධජය ඉහළට එසැවූ ක්‍රීඩා ශූරයා

# හෙට්ටිපොළ හන්දියේ බිත්තර විකුණයි

**"සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිටි ඇතැම් නිලධාරීන් ජාතික ශූරතාව කුමක්ද කියා දන්නේ නෑ. කනිෂ්ඨ තරගවලින් ජය ගත් අයට ජාතික ශූරතාවට හා සමාන ලකුණු දුන්නා. ඒ නිසා මූලික සුදුසුකම් නැති අයදුම්කරුවන් අද ක්‍රීඩා නිලධාරීන් ලෙස සේවය කරනවා. ඒ වුණාට මගෙන් විතරක් ඉංග්‍රීසි පුළුවන් ද අහනවා"**

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා ධජය ඉහළට ඔසවා ජාත්‍යන්තරයේ හා දේශීය ක්‍රීඩා පිටියේ පදක්කම් දිනා දස්කම් දැක්වූ මලල ක්‍රීඩා ශූරයකු හා අතිදක්ෂ කබඩි පුහුණුකරුවකු වන අතපත්තු මුදියන්සේලාගේ චන්දන නිශාන්ත මහතා වයඹ පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරී තනතුරකට ඉල්ලුම් කළද එය නොලැබී යෑම හේතුවෙන් ජීවත් වීමට පඬුවස්නුවර හෙට්ටිපොළ මංසන්ධියේ බිත්තර වෙළෙඳාමේ යෙදී සිටියි.

වයඹ පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරී තෙවැනි ශ්‍රේණියේ තනතුරට අවශ්‍ය ප්‍රායෝගික හා න්‍යායාත්මක සියලු සුදුසුකම් සපුරා තිබියදී විශේෂ සුදුසුකමක් ලෙස සැලකෙන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම නොමැති බව පවසා එම රැකියාව ඔහුට අහිමි කොට ඇත. ඒ නිසා කීයක් හරි හම්බු කරගෙන දරු පවුලක් නඩත්තු කිරීමට ඔහු පාරට බැස සිටී.

**"මා ඉංග්‍රීසි භාෂාව නැතිව දෙස් - විදෙස් තරග බිම ජය ගත්තා. ඒත් ක්‍රීඩාවෙන් රැකියාවක් ගන්න ඉංග්‍රීසි ඉල්ලනවා. බිත්තර විකුණන්න මට ඉංග්‍රීසි ඕනෑ නෑ. ඒ නිසා දරුවන් තිදෙනා හා බිරිය රැකගන්න බිත්තරවලට අමතරව මා හෙට්ටිපොළ හන්දියේ පුවක් ටිකකුත් විකුණලා දැන් ජීවත් වෙනවා"**


කොළඹ සුගතදාස පිටියේදී මීටර් 110 කඩුලු මතින් දිවීමේ තරගයකට එක්ව සිටි චන්දන නිශාන්ත

" මා ඉංග්‍රීසි භාෂාව නැතිව දෙස් - විදෙස් තරග බිම ජය ගත්තා. ඒත් ක්‍රීඩාවෙන් රැකියාවක් ගන්න ඉංග්‍රීසි ඉල්ලනවා. බිත්තර විකුණන්න මට ඉංග්‍රීසි ඕනෑ නෑ. ඒ නිසා දරුවන් තිදෙනා හා බිරිය රැකගන්න බිත්තරවලට අමතරව මා හෙට්ටිපොළ හන්දියේ පුවක් ටිකකුත් විකුණලා දැන් ජීවත් වෙනවා" චන්දන නිශාන්ත මහතා 'දිනමිණ'ට පැවැසීය.

චන්දන නිශාන්ත ශ්‍රී ලාංකේය මලල ක්‍රීඩා ඉතිහාසයේ දස ප්‍රයාම ඉසව්වෙන් ලෝක මට්ටමට සුදුසුකම් ලැබූ පළමු ප්‍රවීණ මලල ක්‍රීඩකයා ලෙස ඉතිහාසයට එක් වෙමින් ස්පාඤ්ඤයේ පැවැති ලෝක ප්‍රවීණ මලල ක්‍රීඩා ශූරතාවලියේදී ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව 19වැනි ස්ථානයට පත් වූ ක්‍රීඩකයා වේ. වසර 2018දී ලෝකයේ අතිදක්ෂ ප්‍රවීණ ක්‍රීඩකයන් සහභාගී වූ එම ලෝක තරගාවලියේදී මීටර් 400 සහාය දිවීම, මීටර් 100 සහාය දිවීම හා මීටර් 110 කඩුලු මතින් දිවීම යන ඉසව්වලදී දක්ෂතා දැක්වීමට හෙතෙම සමත් විය.


දෙස් - විදෙස් තරග බිමේ දිනාගත් පදක්කම් සමග

එමෙන්ම 2017දී චීනයේ පැවැති ආසියානු ප්‍රවීණ මලල ක්‍රීඩා ශූරතාවලියේදී මීටර් 400 සහාය දිවීමේ රන් පදක්කම් දිනූ කණ්ඩායමේ සාමාජිකයකු වූ හෙතෙම ආසියාවේ දස ප්‍රයාම ඉසව්වේ වයස අවුරුදු 40ට වැඩි දක්ෂ ක්‍රීඩකයන් අතුරින් පළමු ස්ථානයේ ශ්‍රේණිගතව සිටින ක්‍රීඩකයා වීම විශේෂත්වයකි. 2016දී සිංගප්පූරුවේ පැවැති ආසියානු ප්‍රවීණ මලල ක්‍රීඩා ශූරතාවලියේදී ඔහු මීටර් 110 කඩුලු මතින් දිවීමේ තරගයේ සිව්වැනි ස්ථානයට පත්වූ අතර කබඩි ක්‍රීඩාවෙන් ද ජාතික තලයේ දක්ෂතා දැක්විය.

වසර 2000දී ජාතික යොවුන් කබඩි ශූරතාවලියේ ලෝකඩ පදක්කම, 2004දී එම ශූරතාවලියේ සිව්වැනි ස්ථානය හාඇතුළු ජයග්‍රහණ රැසක් ඔහු සතුව ඇත. මේ වසරේ ජනවාරි මාසයේදී ඉන්දියාවේ පැවැති විවෘත ඉන්දීය කබඩි තරගාවලියට ද ශ්‍රී ලංකාව නියෝජනය කරමින් හෙතෙම සහභාගී විය. චන්දන නිශාන්ත මහතා මේ වනවිට 'ඩී' ශ්‍රේණියේ පාඨමාලාව සමත් කබඩි පුහුණුකරුවෙකි. නිකවැරටිය ශ්‍රී පරාක්‍රම ජාතික පාසලේ කබඩි පුහුණුකරු ලෙස කටයුතු කරමින් සිටී. කැලණියේ පවත්වාගෙන යන දකුණු ආසියා ක්‍රීඩා ඇකඩමිය යටතේ මලල ක්‍රීඩා විද්‍යා පාඨමාලාව සමත්ව සිටින ඔහු නායකත්ව පුහුණු පාඨමාලා ඇතුළු සුදුසුකම් රැසක් සම්පූර්ණ කර සිටී.

එහෙත් පසුගිය වසරේ සැප්තැම්බර් මාසයේ වයඹ පළාත් කාර්යාල සංකීර්ණයේ එම පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරී තෙවැනි ශ්‍රේණියේ තනතුරට අදාළ සම්මුඛ පරීක්ෂණයට චන්දන නිශාන්ත මහතා සහභාගී විය.

එම සම්මුඛ පරීක්ෂණය අදියර කිහිපයක් යටතේ පරීක්ෂණ මණ්ඩල කිහිපයකින් යුතුව පවත්වා තිබේ. පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි ලකුණු දුන් බව චන්දන නිශාන්ත මහතා පවසයි.

"සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිටි ඇතැම් නිලධාරීන් ජාතික ශූරතාව කුමක් ද කියා දන්නේ නෑ. කනිෂ්ඨ තරගවලින් ජය ගත් අයට ජාතික ශූරතාවට හා සමාන ලකුණු දුන්නා. ඒ නිසා මූලික සුදුසුකම් නැති අයදුම්කරුවන් අද ක්‍රීඩා නිලධාරීන් ලෙස සේවය කරනවා. ඒ වුණාට මගෙන් විතරක් ඉංග්‍රීසි පුළුවන් ද අහනවා" චන්දන නිශාන්ත මහතා පැවැසීය.

වයඹ පළාතේ දැනට ක්‍රියාත්මකව නොපවතින ක්‍රීඩා වෙනුවෙන් ද පත්වීම් දී ඇතැයි පවසන චන්දන නිශාන්ත මහතා තම පළාතට අවශ්‍යම ක්‍රීඩා සඳහා ක්‍රීඩා නිලධාරීන් නොමැතිවීමේ අඩුපාඩුව බරපතළ එකක් බවද පෙන්වා දෙයි.

කොරෝනා වසංගත තත්ත්වය හමුවේ ස්ථිර ආදායමක් නැති තමන්ට පුතුන් දෙදෙනකු හා දියණියක ඇතුළු සිය පවුල නඩත්තුව අභියෝගයක් බවද සඳහන් කළේය.


ක්‍රීඩා පිටියේ පදක්කම් දිනා දස්කම් දැක්වූ චන්දන නිශාන්ත පඬුවස්නුවර හෙට්ටිපොළ මංසන්ධියේ බිත්තර වෙළෙඳාමේ යෙදී සිටින අයුරු.

SINCE 1978 42nd OBSERVER MOBITEL SCHOOL CRICKETER OF THE YEAR 2020
Recognizing talent, inspiring greatness.
Sri Lanka Telecom Mobitel
ඔබ සමගයි. සැමදා.

## 42 වන ඔබ්සවර් - මොබිටෙල්

### වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරඟ වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : ..............................

අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐

සමස්ත ලංකා ක්‍රීඩිකාව: ..............................

**(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)**

SUNDAY OBSERVER

පාසල : ..............................

ඔබේ නම : ..............................

ලිපිනය : ..............................

ජංගම දුරකථන අංකය : ..............................

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**

**ප්‍රථම ත්‍යාගය** : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
**තෙවන ත්‍යාගය** : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 2020-09-05 **අංකය** 26

UNLIMITED
Facebook Instagram Twitter LinkedIn
රු. 99 + බදු අදාළ වේ
සක්‍රිය කිරීමට අමතන්න #170#
මොබිටෙල් 4G සමග සුපිරි අන්ලිමිටඩ් අත්දැකීමක්
වේගවත්ම INTERNET 4G LTE
Sri Lanka Telecom Mobitel

# වැන්ටේජ් සභාපති කුසලාන පාපන්දු අවසන් සටන අදයි

VANTAGE FFSL PRESIDENT'S CUP 2020

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය මෙහෙයවන වැන්ටේජ් සභාපති කුසලාන පාපන්දු තරගාවලියේ අවසන් මහා තරගයට සුදුසුකම් ලැබූ ගුවන් හමුද පාපන්දු පිල හා කොළඹ පාපන්දු පිල අතර අවසන් සටන අද පස්වරු 7ට කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේදී විදුලි ආලෝක ධාරා මැද පැවැත්වෙයි.

වසර 2016 සිට පිට පිට තුන්වතාවක් චැම්පියන් ලීග් ප්‍රධානතම අන්තර් ක්‍රීඩා සමාජ පාපන්දු තරගාවලියේ අවසන් මහා තරගයට පිවිස ශූරතාව දිනාගත් කොළඹ පාපන්දු සමාජය හා වසර 7කට පසු ප්‍රධාන පෙළේ තරගාවලියක අවසන් මහා තරගයකට පිවිස සිටින ගුවන් හමුදව අතර පැවැත්වෙන මේ තරගය කෙරෙහි විශාල අවධානයක් යොමුව පවතී.

එයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ මෙම තරගාවලියේ මූලික වටයේදී ගුවන් හමුදව වෙතින් කොළඹ පාපන්දු සමාජය ගෝල් 2-0කින් පරාජයට පත්ව සිටීමයි. එසේ වුවද ගුවන් හමුද පිල මෙම තරගාවලියේ අවසන් මහා තරගයට අවසන් මොහොතේ සුදුසුකම් හිමි කරගත්තේ නිව් ස්ටාර් ක්‍රීඩා සමාජයට එරෙහිව විරෝධතාවත් ගොනු කිරීමෙන් අනතුරුව නිව් ස්ටාර් තරගාවලියෙන් ඉවතට ඇදදැමීමෙනි. එබැවින් මෙම තරගාවලියේ වාසනාවන්ත කණ්ඩායමක් බවට ගුවන් හමුද පිල පත්ව සිටී.


ගුවන් හමුද පිලේ නායක ලක්මාල් ගුණසිංහ හා කොළඹ පාපන්දු සමාජයේ නායක චරිත රත්නායක සභාපති කුසලානය සමඟ.

මෙම තරගාවලියේ පළමු අවසන් පූර්ව තරගයෙන් ජාවාලේන් පිල පරදවා ගුවන් හමුදව දඬුවම් පහර 4-3කින් ජය ගත් අතර, කොළඹ පාපන්දු සමාජය දඬුවම් පහර ගෝල් 3 -2 කින් රෙඩ් ස්ටාර් පිල පරදවා ජයග්‍රහණය වාර්තා කළේය. එම තරග දෙකේදීම නියමිත කාලයේදී සෑම කණ්ඩායමක්ම ගෝල් 2 බැගින් සම තත්ත්වයකට පත් වීමෙන් ජයග්‍රහණය සෙවීමට දඬුවම් පහර පිරිනැමිණි.

කොරෝනා වයිරස ව්‍යාප්තිය හේතුවෙන් ඇනහිටි ක්‍රීඩාව යළිත් නගා සිටුවීමේ අරමුණින් ප්‍රබලතම කණ්ඩායම් 20ක් අතර පැවැති මෙම ආරාධිත පාපන්දු තරගාවලිය වෙනුවෙන් ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය රුපියල් මිලියන 30ක් වැය කර ඇත. පසුගිය මස 26 වැනිද තරගාවලිය ආරම්භ වූ අතර, මාසයක් තුළ තරග 40ක් පවත්වා අවසන් කිරීමට කටයුතු සංවිධානය විණි. මෙම සියලු තරග කොළඹ සුගතදාස හා රීඩ් මාවත තුරග තරග ක්‍රීඩාංගණවලදී පමණක් පැවැත්වීමට කටයුතු යොද තිබිණි.



# නයෝමි පළමු කඩුල්ල පනී

කොවිඩ් වසංගතයෙන් පසු ආරම්භ වූ පළමු ග්‍රෑන්ඩ් ස්ලෑම් ටෙනිස් ශූරතාවලිය වන අමෙරිකානු විවෘත ටෙනිස් තරගාවලියේ පළමු තරගයෙන් සිය රටේහිම ප්‍රතිවාදී ක්‍රීඩිකා මිසාකි ඩොයි 6-2ක්, 5-7ක් සහ 6-2ක් ලෙස පරාජය කරමින් දෙවැනි වටයට සුදුසුකම් ලැබීමට ජපානයේ සුපිරි ක්‍රීඩිකා නයෝමි ඔසාකා සමත් වූවාය. ග්‍රෑන්ඩ් ස්ලෑම් ටෙනිස් ශූරතා දෙකකට හිමිකම් කියන නයෝමි වසර 2018 දී අමෙරිකානු විවෘත ටෙනිස් ශූරිය වන අතර, මෙවර තරගාවලියේදී කුසලානය හඹා යන ක්‍රීඩිකාවන් අතර ඉදිරිපෙළ පසුවන්නිය.

මේ වනවිට ලෝක කාන්තා ටෙනිස් ශ්‍රේණිගත කිරීම්වල සිවුවැනි තැන පසුවන 22 හැවිරිදි නයෝමිගේ ඉවසීම පරීක්ෂා කළ බැලූ මිසාකි දෙවැනි වටය ජයගනිමින් තරගය 1-1කින් සමකරගැනීමට සමත් වූව ද තුන්වැනි වටයේදී ඇය අභිබවා යාමට අසමත් වූවාය.

140 වැනි වරටත් පැවැත්වෙන අමෙරිකානු විවෘත ටෙනිස් ශූරතාවලියේ පළමු දිනය වූ පෙරේදා බොස්නියානු ක්‍රීඩක ඩමීර් සුම්හර් පරාජය කිරීමට ලොව අංක එකේ ක්‍රීඩක සර්බියාවේ නොවැක් ඩිජෝකෝවික් සමත් විය

# නාගරික මන්ත්‍රී ක්‍රීඩා භාණ්ඩ බෙදයි



මැදකොළඹ උතුරු ග්‍රෑන්ඩ්පාස් කොට්ඨාසයේ ක්‍රීඩා සමාජවලට එම කොට්ඨාසයේ නාගරික මන්ත්‍රී ඒ.ආර්.එම්. සපාන් මහතාගේ විමධ්‍යගත මුදල්වලින් ක්‍රීඩා භාණ්ඩ බෙද දීම පසුගියද සිදු කෙරිණි. එහිදී උතුරු ග්‍රෑන්ඩ්පාස්හි විජයබා විද්‍යාලයේ විදුහල්පති බැරගම විමලතිස්ස හිමියන්ගේ සහ හිටපු පළාත් සභා මන්ත්‍රී එම්.එස්. නයිරුස් මහතා අව්වල් සාවියා ක්‍රීඩා සමාජයට ක්‍රීඩා භාණ්ඩ බෙද දුන් අයුරු. නියෝජ්‍ය පුරපති එම්.ටී.එම්. ඉක්බාල්, නාගරික මන්ත්‍රී ඒ.ආර්.එම්. සපාත්, හිටපු නාගරික මන්ත්‍රී රිෆායි බාහුඩීන් මහත්වරු ද මේ අවස්ථාවට එක් වූහ.

*ඡායාරූපය - මැදකොළඹ සමූහ ඒ. ගනේගොඩ*

වර්ෂ 2020ක් වූ සැප්තැම්බර් මස 02 වැනිදා බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

ජ්‍යෝ.නි. පොලිස්පති ලලිත් ජයසිංහ සේවයෙන් පහ කිරීමේ සිද්ධිය

# යළි සේවයේ පිහිටුවීම ගැන පොලිස්පති වික්‍රමරත්නගෙන් සාක්ෂි විමසීම හෙට

## වරදක් කළ බව අනාවරණය වී නෑ

### සාක්ෂි සමාලෝචනයේදී තහවුරු වෙයි

**රෝෂන් තුෂාර**

හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලලිත් ජයසිංහ මහතා වරදක් කර ඇතැයි අනාවරණය නොවන බැවින් යළි සේවයේ පිහිටුවීම පිළිබඳව සලකා බැලීමට වැඩබලන පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතා හෙට (03) සාක්ෂියට කැඳවන්නැයි දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයා බැලීමේ ජනාධිපති කොමිසම පෙරේදා (31) නොතීසි නිකුත් කළේය.

පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ පොලිස් පරීක්ෂක නියෝමාල් රංගජීව මහතා යළි සේවයේ පිහිටුවූ ආකාරයට ලලිත් ජයසිංහ මහතාගේ සේවය යළි ලබා දීමට බාධාවක් ඇද්ද යන්න පිළිබඳ සලකා බැලීමට මෙම සාක්ෂිය කැඳවන බව කොමිසමේ සභාපති විනිසුරු උපාලි අබේරත්න මහතා පැවසීය.

අසත්‍ය සාක්ෂි මත නඩු පවරා දේශපාලන පළිගැනීමක් කළ බවට සඳහන් කරමින් ලලිත් ජයසිංහ මහතා මෙම පැමිණිල්ල ගොනු කර තිබුණි. කොමිසම මඟින් දීර්ඝ ලෙස සාක්ෂි විමසීමෙන් අනතුරුව ලලිත් ජයසිංහ මහතා වරදක් කර ඇති බවට අනාවරණය වී නොමැති බව සාක්ෂි කැඳවමින් කොමිසම දන්වා සිටියේය.

> **දේශපාලන පළි ගැනීම් පිළිබඳ සොයා බැලීමේ ජනාධිපති කොමිසම**

ලලිත් ජයසිංහ මහතා විසින් යළි සේවයේ පිහිටුවන ලෙසට මේ වන විට අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ ඇති අතර එම අභියාචනය ප්‍රතික්ෂේප වී ඇති බව පෙරේදා (31) අනාවරණය විය. ජාතික පොලිස් කොමිසම එසේ අභියාචනය ප්‍රතික්ෂේප කර තිබිණි. නීතිඥ මහේෂ් කොටුවැල්ල මහතා ජයසිංහ මහතා වෙනුවෙන් කරුණු ඉදිරිපත් කළේය.

- අතිරේක සොලිසිටර් ජනරාල් රොහාන්ත අබේසූරිය මහතා

ජාතික පොලිස් කොමිසම 19 වැනි ව්‍යවස්ථාව අනුව ස්ථාපිත කළා. ව්‍යවස්ථාවේ 155 - 'ඇ' සහ 'ඌ' කියන වගන්ති අනුව මෙය ස්ථාපිත කර තිබෙනවා. ජාතික පොලිස් කොමිසම ලලිත් ජයසිංහ මහතාගේ අභියාචනය සලකා බලා නැවත සේවය ලබා දීමට තීරණය වී තිබෙනවා.

-කොමිසම

අපි ජාතික පොලිස් කොමිසමේ තීන්දුව ගැන බලපෑමක් කරන්නේ නැහැ. අපේ ඉල්ලීම තමයි නැවත පොලිස් සේවයේ පැමිණිලිකරුව ස්ථාපිත කරන ලෙස. මොකද සිදු කර ඇති විමර්ශනවලින් ලලිත් ජයසිංහ මහතා වරදක් කළා කියලා අනාවරණය වෙන්නේ නැහැ. නැවත සේවයේ පිහිටුවීමට කර ඇති අභියාචනය සලකා බලා රංගජීව මහතාගේ සේවය යළි පිහිටුවූ ආකාරයට ලලිත් ජයසිංහ මහතාගේ සේවය පිහිටුවිය හැකිද, එසේ නොකළේ කුමන හේතුවක් මතද යන්න සාක්ෂි විමසීම සඳහා වැඩබලන පොලිස්පති සී.ඩී. වික්‍රමරත්නව කැඳවීමට නියෝග කරමි.

ලබන 03 වැනි දින මෙය යළි සලකා බැලීමට නියෝග කරමු.

කොරෝනා අතරේ ලංකාවට ආ

# විගමනිකයන්ගේ තොරතුරු සොයන්න නව කාර්යාලයක්



**අනුර ප්‍රේමලාල්**

කොරෝනා වසංගතය හේතුවෙන් මෙරටට පැමිණි විගමනික ශ්‍රමිකයන් පිළිබඳව නිවැරදි තොරතුරු මේ වන විටත් නොමැති බැවින් එම තොරතුරු එක් රැස් කිරීමේ කාර්යාලයක් කම්කරු අමාත්‍යාංශයේ පිහිටුවීමට කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා තීරණය කළේය.

ඒ සඳහා තාක්ෂණික ආධාර ලබා දීමට සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය එකඟතාවය පළ කළේය.එම සංවිධානයේ ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා වන ප්‍රධානී සරට් ධාෂ් මහතා (Sarat Dash) සමඟ පෙරේදා (31) කම්කරු අමාත්‍යාංශයේ පැවැති සාකච්ඡාවකින් පසු මෙම තීරණයට එළැඹ තිබේ. එම දත්ත සහ තොරතුරු පදනම් කර ගනිමින් මෙම විගමනික ශ්‍රමිකයන්ට අහිමි වූ රැකියා සහ රැකියා අහිමි වීම වෙනුවෙන් යම් සහන සහ ආධාර වැඩපිළිවෙළක් සකස් කළ යුතු බව ඇමැතිවරයා මෙහිදී අවධාරණය කළේය. ඒ සඳහා තම සංවිධානයට ද ජාත්‍යන්තර වශයෙන් යම් මැදිහත්වීමක් සිදු කළ හැකි බව සංක්‍රමණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානය පැවසීය.

එසේම දැනට ලංකාව, කොරියාව ඇතුළු රටවල් රැසකට ශ්‍රමිකයන් යැවීම සඳහා රජයේ සහ පෞද්ගලික ආයතන විවිධ පුහුණුවීම් සිදු කරයි. ඒ සඳහා විශාල මුදලක් වැය කරමින් රැකියා අපේක්ෂිතයන් සහභාගී වේ. නමුත් පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් බොහෝ රටවල විදෙස් ශ්‍රමිකයන් ඒ රටවල වෘත්තීන් සඳහා ගැනීමට මැලිකමක් දක්වන බැවින් මෙම පුහුණුවීම් ඵලදායී නොවන තත්ත්වයකට පත් වීමට ඉඩ ඇති බවත් ඒ පිළිබඳව ද ඒ ඒ රටවල් සමඟ තානාපති මට්ටමින් සාකච්ඡා කරන බවත් ඇමැතිවරයා මෙහිදී පැවසීය.

මෙම සාකච්ඡාවේදී IOM සංවිධානයේ මෙරට ප්‍රධානී සරට් ධාෂ් මහතා ප්‍රකාශ කළේ, IOM සංවිධානය මේ වන විට, රුපියල් මිලියන 45ක් වටිනා කොරෝනා රෝග නිශ්චය යන්ත්‍ර හා උපකරණ කටුනායක බණ්ඩාරනායක ගුවන් තොටුපොළට ලබා දී ඇති බවයි. එසේම ඉදිරි දින කිහිපය තුළ දී දිනකට පී.සී.ආර්. පරීක්ෂණ 1,000ක් කළ හැකි අංග සම්පූර්ණ රසායනාගාරයක් කටුනායක ගුවන් තොටුපොළට ලබා දෙන බවද සාකච්ඡාවට එක් වූ IOM සංවිධානයේ නියෝජිතයෝ පැවසූහ. එසේ පී.සී.ආර්. පරීක්ෂණ සඳහා පහසුකම් සම්පාදනය කළද එම පරීක්ෂණ කර ගුවන් තොටුපොළෙන් පිට කරන අය නිරෝධායනය සඳහා යොමු කිරීමට ප්‍රමාණවත් තරම් පහසුකම් නොමැති වීම ගැටලුවක් බවත් නැවත ලංකාවට පැමිණීමට අපේක්ෂා කරන විදෙස්ගත වූවන් 45,000ක් මෙරටට ගෙන්වා ගැනීමට සෑහෙන කාලයක් ගතවනු ඇති බවත් මෙම සාකච්ඡාවේ දී ප්‍රකාශ කෙරිණි.

මේ අතර විගමනික ශ්‍රමිකයන් මෙරටට එවීම සඳහා අදාළ රටවල පී.සී.ආර්. පරීක්ෂණ සඳහා සහ නිරෝධායනය සඳහා ඇති පහසුකම් අවම වීම නිසා ද මෙම ලාංකික ශ්‍රමිකයන් ගෙන්වා ගැනීම අඩාල වී ඇත. එම නිසා සමහර රටවලට ශ්‍රමිකයන් යැවීම ද ගැටලුවක් බවට පත්ව තිබේ. මේ හේතුවෙන් ශ්‍රමිකයන් කඩිනමින් මෙරටට ගෙන්වා ගැනීමේ ක්‍රියාවලිය ඉක්මන් කිරීම සඳහා මෙරට ශ්‍රමිකයන් බහුලව සිටින රටවල තානාපතිවරුන්, විදෙස් රැකියා නියෝජිතයන් සහ IOM සංවිධානයේ ප්‍රධානීන් සමඟ කඩිනමින් සාකච්ඡා කරන බව ද ඇමැතිවරයා කියා සිටියේය.

# බාල වයස්කරුවන් ධීවර රැකියාවට ගෙනයන්න බෑ



## ඇමැති දේවානන්දා ධීවර කාර්මිකයන්ට දන්වයි

**බුද්ධිකා ඉඹුලාන**

ධීවර කර්මාන්තය සඳහා මුහුදු යැමේ දී එම යාත්‍රාවේ සේවය කරන්නන් (ගැතියන්) ලෙස බාලවයස්කාර දරුවන් රැගෙන යැමෙන් වළකින්නැයි ධීවර ඇමැති ඩග්ලස් දේවානන්ද මහාතා ධීවර කාර්මිකයන්ට දන්වා සිටියේය.

එමෙන්ම ධීවර යාත්‍රා මුරකරුවන් ලෙස බාලවයස්කාර දරුවන් යෙදවීමද නොකරන ලෙසට ඇමැතිවරයා උපදෙස් ලබා දී තිබේ. යම් ධීවර යාත්‍රාවක් මුහුදු ගමන් වාරයක් සඳහා ධීවර වරායෙන් පිටත්ව යැමේ දී සම්පූර්ණ කළ යුතු අයදුම්පතෙහි එම ගමන් කරන ධීවරයන්ගේ මෙන්ම ගැතියන්ගේ ද නිවැරදි තොරතුරු හා ජාතික හැඳුනුම්පත්, ධීවර හැඳුනුම්පත් අංක නිසි ලෙස ඇතුළත් කළ යුතු බවද ඇමතිවරයා අවධාරණය කළේය. නිසි තොරතුරු වසන් කර බාල වයස්කාර දරුවන් ධීවර යාත්‍රාවල සේවයට රැගෙන යන්නන්ට විරුද්ධව දැඩි නීතිමය පියවර ගන්නා බවද ඇමැතිවරයා වැඩිදුරටත් පැවසීය.

ජාතික හැඳුනුම්පත හෝ ධීවර හැඳුනුම්පත නොමැති නම් එම පුද්ගලයා ප්‍රදේශයේ ග්‍රාම නිලධාරියා විසින් අනන්‍යතාව තහවුරු කරන ලද ඡායාරූපයක් සහිත ලිපියක (මාස 03ක කාලයක් ඉක්ම නොවූ) මුල් පිටපත ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ. ධීවර රැකියාවට පැමිණෙන නවකයකු නම් පදිංචි පොලිස් බල ප්‍රදේශයේ ස්ථානාධිපතිවරයාගෙන් මාස 03ක කාලයක් ඇතුළත ලබා ගත් පොලිස් වාර්තාවක මුල් පිටපත් ලබා දීම අනිවාර්යය කර තිබේ.

අවුරුදු 18ට අඩු බාලවයස්කාර දරුවන් මෙවැනි රැකියාවල යෙදවීම ජාත්‍යන්තර කම්කරු නීතියද උල්ලංඝනය කිරීමක් වන අතර එමඟින් එම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ද කඩාකප්පල් වන වේ. එය දරුවන් මානසික හා කායික පීඩාවලටද ලක් වීමකි.

# හිටපු ජනපතීන්ට හා ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තු එන්න 20 ගේන්න හදනවා

## ව්‍යවස්ථා සංශෝධනයක ඉලක්කය ජනතා සුබසිද්ධියයි

### මන්ත්‍රී රංජිත් මද්දුමබණ්ඩාර

**නදී මාණික්කගේ**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සිදු කළ යුත්තේ එක් එක් පුද්ගලයා ඉලක්ක කරගෙන නොව, රටේ ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් බව සමගි ජන බලවේගයේ මහලේකම්, පාර්ලිමේන්තු මන්ත්‍රී රංජිත් මද්දුමබණ්ඩාර මහතා සමගි ජන බලවේගය ප්‍රධාන කාර්යාලයේ පෙරේදා (31) පැවැති මාධ්‍ය හමුවකට එක් වෙමින් ප්‍රකාශ කළේය.

අවුරුදු හතරහමාරක් පුරා ජනතාව වෙනුවෙන් යහපාලන ආණ්ඩුව ආරක්ෂා කළ දේ විනාශ නොකරන්නැයි තමා රජයෙන් ඉල්ලා සිටින බවද මහලේකම්වරයා කියා සිටියේය.

ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභා 11ක් මඟින් රාජ්‍ය සේවකයන්ට ස්වාධීනව කටයුතු කිරීමට හැකියාව ලැබුණද 20 වැනි සංශෝධනයෙන් එය අහෝසි වුවහොත් රටේ ප්‍රජාතන්ත්‍රවාදයට සිදු වන දේ සිතා ගැනීමටවත් නොහැකි බවත් එය සංශෝධනය කළ යුත්තේ



පුද්ගලයකු ඉලක්ක කරගෙන නොවන බවත් රටේ ජනතාවගේ අයිතීන් සුරැකෙන ලෙස බවත් මන්ත්‍රීවරයා පැවසීය.

හෙතෙම වැඩිදුරටත් කියා සිටියේ, මෙම සංශෝධන ගෙන ඒමට ප්‍රධාන හේතුවක් වන්නේ හිටපු ජනාධිපතිවරුන්ට හා ද්විත්ව පුරවැසිභාවය ඇති පුද්ගලයන්ට නැවත පාර්ලිමේන්තුවට පැමිණීමට අවශ්‍ය තත්ත්වය නිර්මාණය කිරීමට වන බවයි. 2015ට පෙර තිබුණු තත්ත්වයට නැවත රට ගෙන යැමට රජය කටයුතු කරන බවත් මද්දුම බණ්ඩාර මහතා එහිදී සඳහන් කර සිටියේය.

# රාජ්‍ය දැව සංස්ථාවේ අලුත් ප්‍රදර්ශනාගාර 10ක් ඉදි කිරීමට සැලසුම්

**අසේල ලියනගේ**

රාජ්‍ය දැව සංස්ථාවේ ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාර 10ක් මෙම වසර අවසන් වන විට දිවයින පුරා ඉදිකිරීමට සැලසුම් කර ඇති බව එම සංස්ථාවේ සභාපති උදය වලිසිංහ මහතා ඊයේ (01) 'දිනමිණ' ට ප්‍රකාශ කළේය.

දැනට දැව සංස්ථාව සතුව පවතින ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනාගාර 08ට අමතරව මෙම නව ප්‍රදර්ශනාගාර 10 ඉදිකිරීමට නියමිතය. වලිසිංහ මහතා කියා සිටියේ, දැනට රාජ්‍ය දැව සංස්ථාව සතු උසස් තත්ත්වයේ ගෘහ භාණ්ඩවලට අමතරව ජනතාවට පහසු මිලට මිලදීගත හැකි භාණ්ඩද මෙම ප්‍රදර්ශනාගාරවල අලෙවි කිරීමට නියමිත බවයි.

ඉදි වන නව ප්‍රදර්ශනාගාර සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා ග්‍රාමීය වඩු කර්මාන්තකරුවන් සමග ඒකාබද්ධ වැඩසටහනක් ආරම්භ කර ඔවුන්ගේ ආර්ථික තත්ත්වය මෙන්ම රාජ්‍ය දැව සංස්ථාවේ ආදායම ද වැඩි කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ බව ඒ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

මේ සඳහා ග්‍රාමීය වඩු කාර්මිකයන් සඳහා සහන පොළී ණය මුදලක් රාජ්‍ය බැංකු මඟින් ලබා දී ඔවුන් ව්‍යවසායකයන් කිරීම අවසන් බලාපොරොත්තුව බව කී ඒ මහතා, රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය ලී භාණ්ඩ නිෂ්පාදනය සඳහා වෙනම වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමටද සැලසුම් කර ඇති බවත් ඒ සඳහා අවශ්‍ය පිරිසැලසුම් මේ වන විට නිර්මාණය කරමින් සිටින බවත් කියා සිටියේය.

# මාතලේ කැලෑ ගිනි තැබීමෙන් පරිසරයට දැඩි හානි

**නාඋල සමූහ**

ඉවක් බවක් නොමැතිව මාතලේ දිස්ත්‍රික්කයේ සිදු වන වනාන්තර ගිනි තැබීම් හේතුවෙන් ස්වභාවික පරිසරයට බරපතළ හානි සිදු වෙමින් පවතින බව පරිසර සංවිධාන පෙන්වා දුන්නේය.

වාර්ෂිකව විවිධ පුද්ගලයන් විසින් සිදු කරනු ලබන ස්වභාවික වනාන්තර ගිනි තැබීම් හේතුවෙන් දුර්ලභ පැළෑටි වර්ග, ආවේණික සත්ත්ව විශේෂ මෙන්ම වටිනා රුක්ෂලතාද වැනසී යන බව ඔවුහු කියා සිටිති.

වියළි කාලගුණයත් සමඟ නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පමණක් මේ වන විට විශාල භූමි ප්‍රමාණයක් ගිනි තැබීම් හේතුවෙන් විනාශ වී ඇතැයි මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ නාඋල ප්‍රාදේශීය සභාවේ සභාපති සනත් දසනායක මහතා කියා සිටියේය. ඔහු පෙන්වා දුන්නේ, නාඋල - හාඩුව ප්‍රදේශය හා විරගොල්ල ප්‍රදේශවල පැතිර ගිය ගිනි ගැනීම් නිවා දැමීම සඳහා විශාල පරිශ්‍රමයක් දැරීමටද සිදු වූ බවයි. වියළි කාලගුණය හා දැඩි සුළං තත්ත්වය හමුවේ ගින්න පැතිර යැම බරපතළ තත්ත්වයක් බවට පත්ව ඇති බවත් දඹුල්ල ගිනි නිවීම් ඒකකය පවා කැඳවා ගිනි ගැනීම් පාලනයට කටයුතු කළ බවත් සභාපතිවරයා වැඩිදුරටත් කියා සිටියේය.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නාඋල කාර්යාලයීය නිලධාරීන් හා නාඋල පොලිස්ථානයේ නිලධාරීන් ඇතුළු ප්‍රදේශවාසීනුත් ප්‍රාදේශීය සභා නිලධාරීන් මෙන්ම එහි සේවකයන් රැසකුත් ගිනි නිවීම් පාලනය සඳහා පසුගිය දින කිහිපයේදීම යුහුසුළුව කටයුතු කළහ.

# ආනවිලුන්දාව රක්ෂිතයේ සිද්ධියට මගේ කිසි සම්බන්ධයක් නෑ

## සම්බන්ධ නම් ඕනෑම දඬුවමකට ලෑස්තියි

### රාජ්‍ය ඇමැති සනත් නිශාන්ත



**සුභාෂිණී සේනානායක**

ආනවිලුන්දව රක්ෂිතයේ සිද්ධිය සම්බන්ධයෙන් තමාගේ කිසිඳු සම්බන්ධයක් නැතැයි ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්ත මහතා පැවසීය.

වචනයකින් හෝ එම සිද්ධියට තමාගේ සම්බන්ධයක් ඇත් නම් ඕනෑම දඬුවමකට යටත් වීමට තමා සූදානම් බව පවසන ඒ මහතා, එහි ස්ථානීය පරීක්ෂාවක් සිදු කළ බවත් එහි පරිසර හානියක් සිදුව නැති බවත් කියා සිටියේය.

මේ වන විට සමාජ මාධ්‍ය ජාලා හරහා සංසරණය වෙමින් පවතින පුවතක් සම්බන්ධයෙන් තමාගෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විමසීමක් කළ බව කියා සිටින සනත් නිශාන්ත මහතා එය නිර්මාණය කළ කතන්දරයක් බවද පැවසීය. කෙසේ වෙතත් එම සිද්ධියට තමාගේ ප්‍රදේශයේ ඡන්දදායක ගම්වැසියකු සම්බන්ධ බව දිනමිණ සිදු කළ විමසීමකට පිළිතුරු දෙමින් හෙතෙම වැඩිදුරටත් අවධාරණය කළේය.

# රුසියානු නෞකා තුනක් හම්බන්තොට වරායට එයි



## ප්‍රති සබ්මැරීන් යුද නෞකා දෙකක් හා සැපයුම් නෞකාවක් ඒ අතර

රුසියානු සමූහාණ්ඩුවට අයත් ප්‍රති සබ්මැරීන් යුද නෞකා දෙකක් සහ සැපයුම් නෞකාවක් පෙරේදා (31) හම්බන්තොට වරායට සේන්දු විය.

එම නෞකා රුසියානු සමූහාණ්ඩුවට අයත් "අද්මිරාල් ට්‍රිබක්" සහ "අද්මිරාල් විනොග්‍රදෙව්" යන ප්‍රති සබ්මැරීන යුද නෞකා ද්විත්වය සහ "බොරිස් බුටෝමා" යන සැපයුම් නෞකාව වේ.

සැපයුම් අවශ්‍යතා සඳහා සහ කාර්යමණ්ඩල විවේකය සඳහා හම්බන්තොට වරායට පැමිණ ඇති මෙම නෞකාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී කොවිඩ් - 19 ව්‍යාප්තිය වැළැක්වීමේ සෞඛ්‍ය උපදෙස් සහ ක්‍රමවේදයන්ට අනුව අපේක්ෂිත කාර්යයන් සඳහා පමණක් සීමා කිරීමට පියවර ගෙන ඇත.

මෙලෙස දිවයිනට පැමිණ නෞකාවන් ත්‍රිත්වය හෙට (03) දිවයිනෙන් පිටත්ව යැමට නියමිතය.

## 'ඇත්තටම රාවණා හොඳ එකෙක් වෙන්න ඇති' අද එළිදකී

සුරංග කුරුප්පු ආරච්චි විසින් රචිත 'ඇත්තටම රාවණා හොඳ එකෙක් වෙන්න ඇති' කාව්‍ය කෘතිය අද (02) සවස 3.00ට කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී එළිදැක්වේ.

ග්‍රන්ථය එළිදැක්වීමේ උත්සවයේ මෙහෙයවීම සහ ප්‍රධාන දේශනය ආචාර්ය සනත් විමලසිරි විසින් සිදු කරනු ලබයි.

# කිඹුලඇළේ ගුණාගේ මත් ජාවාරමේ සගයෝ 8ක් අත්අඩංගුවට

## සෙසු ජාවාරමුන් අල්ලන්න මෙහෙයුම් තවදුරටත්

**මහානාම විතානගේ - මල්වාන සමූහ**

විදේශ රටක සිටින මහා පරිමාණ මත්කුඩු ජාවාරම්කරුවකු වන 'කිඹුලඇළේ ගුණා' හා ඔහුගේ සහෝදරයකු විසින් මෙහෙයවන ලද මහා පරිමාණ මත් කුඩු ජාවාරමකට සම්බන්ධ ජාවාරම්කරුවන් අට දෙනකු සපුගස්කන්ද පොලීසිය මඟින් පෙරේදා (31) අත්අඩංගුවට ගැනිණි.

මොවුන් ළඟ තිබී හෙරොයින් ග්‍රෑම් අසූවක් (80) පමණ හා හෙරොයින් ජාවාරම් කිරීමෙන් උපයා ගත් රුපියල් විසිදහසක මුදලක්ද පොලිස් භාරයට ගැනිණි. මෙම ජාවාරම සඳහා යොදා ගන්නා ලද ත්‍රීරෝද රථ දෙකක් හා යතුරු පැදි දෙකක් සමග කඩු දෙකක් ද සොයා ගෙන ඇත. එම මත්කුඩු ජාලය හඳුනා ගනිමින් සිදු කරන ලද විමර්ශනවල ප්‍රතිඵලයක් ලෙස ඉකුත් 08 වැනිදා සිට 31 වැනිදා දක්වා කාලය තුළ මොවුන් මෙසේ අත්අඩංගුවට ගැනීමට පියවර ගෙන තිබේ.

දැනට මොවුන් අට දෙනා මහර මහෙස්ත්‍රාත් අධිකරණයෙන් ලබා ගත් රැඳවුම් නියෝග මත රඳවා තබාගෙන ප්‍රශ්න කරමින් සිටී. එම ජාලයට සම්බන්ධ තවත් පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට මේ වන විට මෙහෙයුමක් ක්‍රියාත්මක කර තිබේ.

අත්අඩංගුවට පත් ජාවාරම්කරුවන් අට දෙනා කොළඹ හා අවට තදාසන්න ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර ඔවුන්ගේ වයස අවුරුදු 20ත් 40ත් අතර අය වෙති. මේ අතර මෙම ජාවාරම්කරුවන්ගේ බැංකු ගිණුම් පරීක්ෂා කොට ඔවුන්ගේ දේපළ තහනම් කිරීමට පියවර ගැනේ. එහි විමර්ශන කටයුතු අවසන් වීමෙන් පසුව අත්අඩංගුවට ගත් සියලු දෙනා මහර මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් හා කැලණිය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රෝෂාන් ඩයස් යන මහත්වරුන්ගේ අධීක්ෂණය යටතේ සපුගස්කන්ද පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක දුමින්ද කුලසේකර, අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක එල්. අමරසේකර, උප පොලිස් පරීක්ෂක නිපුන ද සිල්වා, සැරයන් ජයවර්ධන (12011), පො.කො. දසනායක (71335), කුමාර (71453), ලක්මාල් (82436), ජීවන්ත (78311), අබේසිංහ (74265) හා බණ්ඩාර (85855) යන නිලධාරීහු මෙම මෙහෙයුම සිදු කළහ.

දිනමිණ රේඩියෝ ගුරුවරයා

අංක 10 | I පත්‍රය | මිනිත්තු 45

**2020 වසරේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව මගින් ඉදිරිපත් කරන රේඩියෝ ගුරුවරයා වැඩසටහන් මාලාව ඇසුරින් සකස් කරන ලද පෙර පුහුණු ප්‍රශ්න පත්‍රය**

**වචනවලට වඩාත්ම ගැලපෙන රූපය තෝරන්න.**

1. | ගුවන<br>වේගය<br>ඉන්දන |



(1) (2) (3)


2. | ශ්‍රව්‍ය<br>දෘශ්‍ය<br>ඉගෙනුම් |



(1) (2) (3)


**සම්බන්ධතාව අඩුවෙන්ම පෙන්වන රූප යුගලය ඇති කොටුව තෝරන්න.**

3.



(1) (2) (3)

4.



(1) (2) (3)

5. පිපාසයෙන් ............................ පත් නාවිකයෝ ............................................. වූහ

1). භීතියට - වේගයෙන් දුවන්නට
2). වෙහෙසට - ආධාර සොයන්නට
3). සතුටට - අත් පුඩි ගසන්නට

*** අදහසට ගැලපෙන යෙදුම් තෝරන්න**

6. ප්‍රයෝජනයක් නැති වැඩක් කිරීම.
1). කොටි වලිගය අල්ලා ගත්තා වගේ
2). කබලෙන් ලිපට වැටුණා වගේ
3). වක්කඩේ හකුරු හැංගුවා වගේ

7. දෙමව්පියන්ගේ නරක ගතිගුණ ළමයින්ට ඉබේම පුරුදු වීම
1).ගහේ කටු උල් කරන්න ඕනෑ නැහැ
2). හොරාගේ අම්මාගෙන් පේන ඇහුවා වගේ
3).හැදෙන ගහ දෙපැත්තෙන් දැනේ


**දී ඇති වචනවල සම්බන්ධතාවය තේරුම්ගෙන ඉදිරියේ ඇති හිස්තැනට අදාළ පිළිතුර යටින් ඉරක් අඳින්න.**

8. කවියාට කිවිඳිය මෙන් මාළුවාට...............................
(1) මාළු දෙන (2) මැසින්න (3) මාළුව්වි

9. යකැදුරෝ - යකැදුරන් නම් නැටුවෝ
(1) නැට්ටුවන් (2) නැට්ටුන් (3) නැට්ටූහු

**ශ්‍රී ලංකාවේ පරිපාලන ඒකක කිහිපයක් පිහිටි අයුරු පහත සටහනේ දැක්වේ.**



10. ඒ අනුව,  සංකේතයෙන් අදහස් වන්නේ වනුයේ,

1). බස්නාහිර පළාත 2). ශ්‍රී ජයවර්ධනපුර 3). කොළඹ දිස්ත්‍රික්කය


**පහත වගන්තිය අනුව නිවැරදි පිළිතුර තෝරන්න.**

වැලක බැලුන් එල්ලා තිබුණේ රතු, කොළ සහ නිල් ලෙසටය.

11. 16 වැනි ස්ථානයේ ඇති බැලූනයේ පාට කුමක්ද?
1). රතු 2). කොල 3). නිල්

12. මෙම වැලේ බැලුන් 23ක් එල්ලා තිබේ නම්, අවසාන බැලූනයේ පාට විය හැක්කේ ?
1). රතු 2). කොල 3). නිල්

13. සංඛ්‍යා යොදා ඇති රටා හඳුනා ගැන හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න




1). 9 2). 16 3). 18

**දී ඇති කවිය ඇසුරෙන් නිවැරදි පිළිතුර තෝරන්න**

**ගුරු දෙවි දැක නැගිටිමි**
**නැගිට දෙපා වඳිනෙමි**
**වැඳ පොත් පාඩම් දෙමි**
**දීලා සත උගනිමි**

15. ශිල්පයන්නට කවියේ යෙදී ඇත්තේ,
1). සත් 2). පොත් 3). පාඩම්

16.මෙහි “ගුරු දෙවි” යනු,
1). මවුපියන් 2). දෙවිවරුන් 3). ගුරුවරුන්

**අන්තර් සම්බන්ධතාවයක් නොමැති වචන ඇති පිළිතුර තෝරන්න**

17.

| කෙත<br>ලියද්ද<br>වක්කඩ | කම්කරුවා<br>වෛද්‍යවරයා<br>ගොවියා | මෑ<br>බෝංචි<br>ජෑම් |
|---|---|---|

18.

| ගීතය<br>කාන්තාව<br>සංගීතය | ජයග්‍රහනය<br>පුහුණුව<br>ක්‍රිඩකයා | සේවිකාව<br>කර්මාන්තය<br>ඇඟලුම් |
|---|---|---|


19.කොටස් දෙකම සමාන පේළිය වනුයේ,

1). තමරඅවසල - අතරවමසට
2). තවරඅසලම - මලසඅරවත
3). තමරඅලවස - අතරමලවස

20. නුවන් උපන්නේ 1981 වසරේදී ය. ඔහු උපන් වර්ෂය අයත් වන දශකය හා සියවස කුමක්ද?

1). 20වන සියවස 9 වන දශකය
2). 19 වන දශකය 21වන සියවස
3). 20වන සියවස 8 වන දශකය

*** දී ඇති පලතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න**




21). ඇපල් ගෙඩියක මිල වන්නේ,

1). 60 2). 40 3).50


22). අන්නාසි ගෙඩියක මිල වනුයේ,
1). 40 2). 80 3).120

23). දොඩම් ගෙඩි දෙකක මිල වනුයේ,
1). 20 2). 40 3).80

24). ඇපල් ගෙඩියේ වටිනාකමට දොඩම් ගෙඩි කීයක් ගත හැකිද?
1). 4 2). 2 3). 3


25. ළමා සමිතිය සති තුනකට වරක් සිකුරාදා දිනයේ රැස්වෙයි. ළමුන් මාර්තු 10 එම රැස්වීම පැවැත්වූයේ නම්, ඊළඟ රැස්වීම පවත්වන දිනය වන්නේ,
1). අප්‍රේල් 01 2). මාර්තු 31 3). අප්‍රේල් 7


26. අඳුරු කර ඇති කොටස මුළු රූපයෙන්,



1). 1/2 වඩා වැඩියි
2). 1/2 වඩා අඩුය
3). 1/2ට සමානය

27. රූපය දෙස හොඳින් බලා හිස්තැනට ආයතු සංකේතය තෝරන්න.




1). K 2).  3). 

28). පහත වැකි අතරින් අකුරුවල අඩුවක් නැති වැකිය තෝරන්න.

1). ගොවිය කුඹුරු කොටති. 2). අශ්වයේ ඉතා වේගයෙන් දුවති.
3). තාත්තා පොළට යයි.


29. මීටර් 1ක පරතරය ඇතිව මල් පැල සිටුවා ඇති දුර ප්‍රමාණය මීටර් 20කි. සිටුවන ලද මල් පැල ගණන කීයද?
1). 22 2). 21 3).24

30. සුරනි ගේ මවගේ මව මගේ පියාගේ මවය. සුරනි ගේ මව මගේ පියාගේ කවුද?
1). නැනාය 2).සහෝදරිය ය 3).නැන්දා ය

31. ඊයෙ මැයි 15 වැනිදා බදාදාය. ඊළඟ බ්‍රහස්පතින්දා දිනය කවදාද?

1). 23 වනදා 2). 22 වනදා 3).21 දා

***පහත දැක්වනුයේ සුරතල් සතුන් තිදෙනකු ඇතිකිරීමට කැමැත්ත දැක්වූ ආකාරය දැක්වෙන සටහනකි. ඒ අනුව,**




32. බල්ලාට කැමැත්ත දක්වන අය කොපමණ ද?
1). 12 2). 08 3).06

33. සුරතල් මසුන් ඇති කිරීමට කැමති ගණන?
1). 11 2). 09 3).13

**මෙහි ඉතිරි කොටස හෙට (03) පත්‍රයේ**

**රේඩියෝ ගුරුවරයා ආචාර්ය මණ්ඩලය** - ප්‍රියන්ත කේ ගීගනගේ මහතා - කොළඹ ආනන්ද විද්‍යාලය, ශ්‍යාමලී ප්‍රියංගිකා කුමානායක මිය - කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, සුභානි පල්ලෙවෙල මිය - කොළඹ සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, ගයනි දේවරාජ මිය - කොළඹ ලුම්බිණි විද්‍යාලය, මංජුල උස්හෙට්ටි මහතා - ප්‍රාථමික පුහුණු (විද්‍යාපීඨ) සහ ශාස්ත්‍රවේදී (පේරාදෙණිය විශ්ව විද්‍යාලය),

රේඩියෝ ගුරුවරයා සෑම බදාදා සහ බ්‍රහස්පතින්දා දිනකම ප.ව. 4.00 – 5.30 දක්වා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ, ස්වදේශීය සේවය සහ විදුල ළමා ගුවන්විදුලියෙන් (තරංග මාලා 91.7 FM / 91.9 FM) ප්‍රචාරය වන අතර වැඩසටහනට අදාළ ප්‍රශ්න පත්‍රය සෑම බදාදා සහ බ්‍රහස්පතින්දාවකම දිනමිණ සමග ඔබට ලබා ගත හැකිය.නිෂ්පාදනය - සුමනා අබේසිංහ සහ සුභානි වැලිවිට

NSB

# ජාතික ඉතිරිකිරීමේ බැංකුව

## මූල්‍ය ප්‍රකාශන

(SL)AAA

## 2020 ජුනි 30 දිනෙන් අවසන් වන මාස හයක කාල පරිච්ඡේදය සඳහා

### ආදායම් ප්‍රකාශය

| ජුනි 30 දිනෙන් අවසන් වන මාස හය සඳහා | බැංකුව 2020 රු. '000 | බැංකුව 2019 රු. '000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|
| **මුළු ආදායම** | **60,186,922** | **59,121,029** | **61,761,497** | **60,240,720** |
| පොලී ආදායම | 59,095,387 | 57,699,605 | 60,129,115 | 58,400,296 |
| පොලී වියදම | (46,733,504) | (43,941,762) | (47,162,085) | (44,452,375) |
| **ශුද්ධ පොලී ආදායම** | **12,361,883** | **13,757,843** | **12,967,030** | **13,947,921** |
| ගාස්තු සහ කොමිස් ආදායම | 534,220 | 545,328 | 540,038 | 549,225 |
| ගාස්තු සහ කොමිස් වියදම | (67,202) | (46,106) | (70,973) | (47,516) |
| **ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම** | **467,018** | **499,222** | **469,065** | **501,709** |
| වෙළඳාම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභය / (අලාභය) | 370,776 | 663,947 | 900,204 | 1,079,974 |
| සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම් / වගකීම් මත ශුද්ධ ලාභ / (අලාභ) | - | - | - | - |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය වත්කම්වල හඳුනාගැනීම අත්හැරීමෙන් ලත් ශුද්ධ ලාභය / (අලාභය) | 8,640 | 18,052 | 8,640 | 18,052 |
| වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 177,900 | 194,096 | 183,501 | 193,172 |
| **මුළු මෙහෙයුම් ආදායම** | **13,386,217** | **15,133,161** | **14,528,440** | **15,740,829** |
| හානිකරණ ගාස්තු | (2,253,238) | (524,539) | (2,301,149) | (524,604) |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | **11,132,979** | **14,608,621** | **12,227,291** | **15,216,224** |
| සේවක මණ්ඩල වියදම් | (5,045,266) | (5,139,414) | (5,151,282) | (5,155,445) |
| ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය වීම් | (561,550) | (472,854) | (569,798) | (473,399) |
| වෙනත් වියදම් | (2,099,405) | (2,124,621) | (2,116,491) | (2,115,061) |
| **එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු සහ ණය ආපසු ගෙවීමේ බදුවලට පෙර මෙහෙයුම් ලාභය / (අලාභය)** | **3,426,757** | **6,871,732** | **4,389,719** | **7,472,319** |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු | (1,085,925) | (1,525,074) | (1,220,533) | (1,604,171) |
| මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු | - | (203,343) | - | (213,889) |
| මූල්‍ය සේවා මත ණය ආපසු ගෙවීමේ බදු | - | (832,690) | - | (832,690) |
| **එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු සහ ණය ආපසු ගෙවීමේ බදුවලට පසු මෙහෙයුම් ලාභය / (අලාභය)** | **2,340,832** | **4,310,624** | **3,169,186** | **4,821,568** |
| ආශ්‍රිත සමාගම් වල සහ බද්ධ ව්‍යාපාර වල ලාභයෙන් හිමි කොටස | - | - | - | - |
| **බදුවලට පෙර ලාභය / (අලාභය)** | **2,340,832** | **4,310,624** | **3,169,186** | **4,821,568** |
| ආදායම් බදු වියදම් | (1,284,771) | (2,017,527) | (1,516,055) | (2,185,719) |
| **කාලච්ඡේදයට අදාළ ලාභය / (අලාභය)** | **1,056,061** | **2,293,097** | **1,653,131** | **2,635,849** |
| **ලාභය බෙදී යන ආකාරය** | | | | |
| පාලක සමාගමේ හිමිකරුවන්ට | 1,056,061 | 2,293,097 | 1,653,131 | 2,635,849 |
| පාලනයට යටත් නොවන හිමිකම් | - | - | - | - |
| **සාමාන්‍ය කොටසකට ඉපයීම** | | | | |
| සාමාන්‍ය කොටසකට මූලික ඉපයීම - (රු.) | 1.12 | 2.44 | 1.76 | 2.80 |
| සාමාන්‍ය කොටසකට තනුක ඉපයීම - (රු.) | 1.12 | 2.44 | 1.76 | 2.80 |

### විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| ජුනි 30 දිනෙන් අවසන් වන මාස හය සඳහා | බැංකුව 2020 රු.'000 | බැංකුව 2019 රු.'000 | සමූහය 2020 රු. '000 | සමූහය 2019 රු. '000 |
|---|---|---|---|---|
| **කාලච්ඡේදය සඳහා ලාභය** | 1,056,061 | 2,293,097 | 1,653,131 | 2,635,849 |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු වෙනත් විස්තීර්ණ ආදායම්** | - | - | - | - |
| විදේශ ගනුදෙනු පරිවර්ථනය මත වූ විනිමය වෙනස්කම් | - | - | - | - |
| ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ කටයුතු වලින් ලත් ශුද්ධ ලාභ (අලාභ) | - | - | - | - |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පවතින ණය උපකරණ මත වූ ශුද්ධ ලාභ / (අලාභ) | - | - | - | - |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පත් කළ ණය උපකරණ | 310,831 | 132,875 | 375,743 | 208,937 |
| ආදායම් ප්‍රකාශයට මාරු කරන ලද ණය උපකරණවල ආයෝජනයෙන් ලද ශුද්ධ ලාභ / (අලාභ) | (8,640) | (16,191) | (8,640) | (16,191) |
| **අඩු කළා :** ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු අයිතම වලට අදළ බදු වියදම | - | - | - | - |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව** | **302,192** | **116,684** | **367,104** | **192,746** |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු නොවන වෙනත් විස්තීර්ණ ආදායම්** | | | | |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට පවතින හිමිකම් උපකරණ වල ආයෝජනයන්හි සාධාරණ අගයේ වෙනස්වීම් | (953,831) | (1,020,488) | (968,067) | (1,020,488) |
| ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට පවතින මූල්‍ය වගකීම් මත බැංකුවේ ණය අවදානම ආරෝපණය කිරීමේ සාධාරණ වෙනස්වීම් | - | - | - | - |
| සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් නැවත ආගණනය | - | - | (1,143) | (72) |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස් වීම් | - | - | - | - |
| **අඩු කළා :** ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය නොකළ යුතු අයිතම වලට අදළ බදු වියදම් | - | - | - | - |
| **ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය කළ යුතු නොවන වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව** | **(953,831)** | **(1,020,488)** | **(969,210)** | **(1,020,560)** |
| **කාලච්ඡේදයට අදාළ වෙනත් විස්තීර්ණ ආදායම්, බදු ගෙවූ පසු** | (651,639) | (903,804) | (602,106) | (827,814) |
| **කාලච්ඡේදයට අදාළ මුළු විස්තීර්ණ ආදායම** | **404,422** | **1,389,293** | **1,051,025** | **1,808,035** |
| **ලාභය බෙදී යන ආකාරය** | | | | |
| පාලක සමාගමේ හිමිකරුවන්ට | **404,422** | **1,389,293** | **1,051,025** | **1,808,035** |
| පාලනයට යටත් නොවන හිමිකම් | - | - | - | - |

### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | බැංකුව 30.06.2020 දිනට රු. '000 | බැංකුව 31. 12.2019 දිනට (විගණනය කළ) රු. '000 | සමූහය 30.06.2020 දිනට රු. '000 | සමූහය 31.12.2019 දිනට (විගණනය කළ) රු. '000 |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| මුදල් සහ මුදල් සමානයන් | 5,340,813 | 5,376,715 | 5,373,166 | 5,564,824 |
| මහ බැංකුව සමඟ ඇති ශේෂ | - | - | 66 | 58 |
| බැංකුවල ඇති තැන්පතු | 13,674,433 | 12,364,469 | 16,913,083 | 15,745,184 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 25,177 | 11,622 | 25,177 | 11,622 |
| **ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වත්කම්** | | | | |
| සාධාරණ අගයට ගණනය කළ | 9,599,848 | 11,459,882 | 24,001,921 | 22,130,273 |
| සාධාරණ අගයට නම් කළ | - | - | - | - |
| **ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වත්කම්** | | | | |
| ණය සහ අත්තිකාරම් | 452,993,912 | 454,394,957 | 456,467,009 | 456,636,285 |
| ණය සහ අතිකුත් උපකරණ | 687,278,557 | 615,634,321 | 691,547,287 | 619,567,786 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට ගණනය කළ මූල්‍ය වත්කම් | 7,990,477 | 3,478,811 | 8,573,976 | 4,626,582 |
| පාලිත සමාගම්වල ආයෝජනය | 4,811,000 | 4,811,000 | - | - |
| ආශ්‍රිත සමාගම් සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජනය | - | - | - | - |
| දේපළ, පිරියත හා උපකරණ | 14,244,522 | 14,163,454 | 14,537,626 | 14,457,494 |
| භාවිතයට අයිතිය ඇති වත්කම් | 939,261 | 1,073,507 | 990,612 | 1,130,868 |
| දේපළ ආයෝජන | - | - | 333,315 | 333,315 |
| කීර්තිනාමය සහ අස්පෘෂ්‍ය වත්කම් | - | - | - | - |
| විලම්භීත බදු වත්කම් | - | - | 632 | 338 |
| වෙනත් වත්කම් | 39,263,731 | 35,197,923 | 39,912,090 | 35,370,115 |
| **මුළු වත්කම්** | **1,236,161,729** | **1,157,966,664** | **1,258,675,957** | **1,175,574,745** |
| **වගකීම්** | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 17,648,502 | 35,045,251 | 17,342,550 | 36,139,122 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | - | - | - |
| ලාභ අලාභ මගින් හඳුනාගත් මූල්‍ය වගකීම් | - | - | - | - |
| **ක්‍රමක්ෂය පිරිවැය මත මූල්‍ය වගකීම්** | | | | |
| තැන්පත්කරුවන්ට ගෙවිය යුතු | 1,112,784,970 | 1,016,574,286 | 1,112,403,624 | 1,015,635,421 |
| ණය සුරකුම්පත් හිමියන්ට ගෙවිය යුතු | - | - | - | - |
| වෙනත් ණය ගැනීම් සඳහා ගෙවිය යුතු | 18,811,940 | 21,203,242 | 35,530,692 | 32,808,023 |
| කල්බදු වගකීම් | 969,658 | 1,066,882 | 1,020,393 | 1,121,441 |
| නිකුත් කළ ණය සුරකුම්පත් | 27,794,431 | 26,691,711 | 28,058,417 | 26,955,697 |
| සේවාවසාන ප්‍රතිලාභ බැඳීම් | 6,508,707 | 6,508,707 | 6,540,432 | 6,536,687 |
| ප්‍රවර්ථන බදු වගකීම් | - | - | 528,103 | 565,704 |
| විලම්භීත බදු වගකීම් | 561,102 | 547,250 | 561,866 | 548,014 |
| වෙනත් වෙන්කිරීම් | - | - | - | - |
| වෙනත් වගකීම් | 7,332,986 | 5,951,464 | 8,840,697 | 7,430,415 |
| පාලිත සමාගම්වලට ගෙවිය යුතු | 3,750 | 547 | - | - |
| **මුළු වගකීම්** | **1,192,416,046** | **1,113,589,340** | **1,210,826,774** | **1,127,740,523** |
| **හිමිකම්** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය / පවරන ලද ප්‍රාග්ධනය | 9,400,000 | 9,400,000 | 9,400,000 | 9,400,000 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 3,615,675 | 3,562,872 | 3,628,960 | 3,571,214 |
| වෙනත් විස්තීර්ණ ආදායම් සංචිත | (333,633) | 318,006 | (317,462) | 283,501 |
| රඳවාගත් ඉපැයුම් | 4,457,140 | 4,464,442 | 7,693,110 | 7,233,982 |
| වෙනත් සංචිත | 26,606,501 | 26,632,004 | 27,444,576 | 27,345,524 |
| අයිතිකරුවන්ගේ මුළු හිමිකම | 43,745,683 | 44,377,324 | 47,849,183 | 47,834,222 |
| පාලනයට යටත් නොවන හිමිකම් | - | - | - | - |
| **මුළු හිමිකම්** | **43,745,683** | **44,377,324** | **47,849,183** | **47,834,222** |
| **මුළු හිමිකම් සහ වගකීම්** | **1,236,161,729** | **1,157,966,664** | **1,258,675,957** | **1,175,574,745** |
| **අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්** | **20,669,418** | **10,355,197** | **20,691,658** | **10,691,602** |
| **නාමික තොරතුරු** | | | | |
| සේවක සංඛ්‍යාව | 4,642 | 4,715 | | |
| ශාඛා සංඛ්‍යාව | 258 | 256 | | |

**සටහන : හානිකරණයෙන් හා ක්ෂය කිරීමෙන් පසු ශුද්ධ අගයන් දක්වා ඇත.**

**පැහැදිලි කිරීමේ සටහන් :**

1. 2019 වසර සඳහා වූ වාර්ෂික ගිණුම් ප්‍රකාශනයට පත් කළ තැන් සිට ගණනය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන්හි වෙනසක් සිදු වී නොමැත.
2. වඩාත් යෝග්‍ය ඉදිරිපත් කිරීමක් සඳහා තත්කාලීන වර්ෂයේ තොරතුරු සමඟ අවශ්‍ය ඕනෑම අවස්ථාවක සැසඳීමට හැකි ලෙස සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කර ඇත.
3. **කෝවිඩ් - 19 හානිකරණය මත වූ බලපෑම -** කෝවිඩ් - 19 පැතිරීම ව්‍යාපාරික හා ආර්ථික කටයුතුවලට බාධාවක් වී ඇති අතර, ගෝලීය හා දේශීය ආර්ථිකයට අවිනිශ්චිතතාවයක් ඇති කර තිබේ. ශ්‍රී ලංකාවේ කෝවිඩ් - 19 පැතිරීයාමේදී බැංකුව සිය ව්‍යාපාරික කටයුතු සිදු කරන විට රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව (ශ්‍රී ල.ම.බැ.) විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ හා මහපෙන්වීම් දැඩි ලෙස පිළිපැදී ඇත. ඒ අනුව, බැංකුව විසින් ශ්‍රී ල.ම.බැ. විසින් නිකුත් කරන ලද උපදෙස් අනුව පීඩාවට පත් ව්‍යාපාරිකයින්ට සහ පුද්ගලයන්ට සහන ලබාදී ඇත.

   ණය සහන හා ණය කල් දැමීමේ බලපෑම

   ණය සහන හෝ ගෙවීම් කල්දැමීම ප්‍රතික්ෂේප කළ අය හැර සෙසු සියළු ගනුදෙනුකරුවන්ට බැංකුව සිය ණය හෝ ගෙවීම් කල්දැමීම ලබාදී ඇත. ශ්‍රී ල.ම.බැ. විසින් නිකුත් කරන ලද උපදෙස් සැලකිල්ලට ගෙන මාස දෙකේ සිට මාස හය දක්වා තාවකාලික ණය සහන කාලසීමාව තුළ සිල්ලර ණය දීමේ කළඹෙන් 91% ක් පමණ ලබාදී ඇත. ඒ අනුව පවතින තොරතුරු මත පදනම්ව 2020.06.30 දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා මූල්‍ය ප්‍රකාශනවල පළමු දින පාඩුව හඳුනාගෙන ඇත. එහි ප්‍රතිඵලය වූයේ 2020.06.30 දිනෙන් අවසන් වූ මාස හය තුළ බැංකුවේ ශුද්ධ පොලී ආදායම (NII) සැලකිය යුතු ලෙස පහත වැටීම වන අතර ආදායම් ප්‍රකාශයට ගැලපෙන මුළු බලපෑම රු. මිලියන 3,349 ක් වේ. කෙසේ වෙතත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය අධීක්ෂණයන් හා අවශ්‍ය ගැලපීම් කිරීම් පිළිබඳව කටයුතු කරමින් පවතී.

හානිකරණ තක්සේරුව

සියළුම ආයතනික සේවාදායකයින් ඔවුන්ගේ ඓතිහාසික ගෙවීම් රටා, ඔවුන්ගේ ව්‍යාපාරික අංශයට හා භූගෝලීය ප්‍රදේශයට කෝවිඩ් 19 ආර්ථික බලපෑම, අපේක්ෂිත ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත් කිරීම, ආයතනයේ මූල්‍ය ශක්තිය, රජයේ සහ ශ්‍රී ල.ම.බැ. සහය සහ වෙනත් පරිපූර්ණ සාධක මත පදනම්ව තනි තනිව තක්සේරු කර ඇත. තක්සේරුව මත පදනම්ව සමහර ණයගැනුම්කරුවන් පළමු අදියර සිට දෙවන අදියර දක්වා ගෙන ගිය අතර සමහර ණය ගැනුම්කරුවන් අතීතයේ නියමිත තත්ත්වය නොතකා දෙවන අදියර සිට තුන්වන අදියර දක්වා අපේක්ෂිත මුදල් ප්‍රවාහ දුර්වලතා හේතුවෙන් ගෙන යන ලදී.

2020 ජුනි 30 වන විට බැංකුව විසින් පැහැර හැරීමේ සම්භාවිතාව (PD) ගණනය කර ඇති අතර අපේක්ෂිත හානිකරණය අලාභ ((ECL) ගණනය කිරීමේදී ආර්ථිකයට සිදුවන අහිතකර බලපෑම පිළිබිඹු වන පරිදි ආර්ථික සාධක ගැලපුම් (EFA) සකස් කර ඇත. ඒ අනුව නරකම අවස්ථාවන් සඳහා පවරා ඇති බර ප්‍රමාණය 10% කින් වැඩි කිරීමට බැංකුව තීරණය කළ අතර, මූලික සිද්ධි සහ හොඳම අවස්ථාව සඳහා වෙන් කර ඇති බර පිළිවෙලින් 5% කින් අඩු කර ඇත.

කේවල ණය ගැනුම්කරුවන් සඳහා කළඹ මට්ටමේ හානිය තක්සේරු කිරීම සිදු කරන ලදී. කෙසේ වෙතත්, සමහර අවස්ථාවලදී කළමනාකරණ තීන්දු භාවිතා කරනු ලැබුවේ දීර්ඝ කාලීන ණය අත්හිටුවීම හෝ කල්දැමීම පිළිබඳ පාරිභෝගික ඉල්ලීමෙහි සාධාරණත්වය තක්සේරු කිරීමටය. ණය ගැනුම්කරුවන්ට ඔවුන්ගේ ක්ෂේත්‍රය සහ කළමනාකරණ විනිශ්චය මත පදනම්ව අදියර අතර වෙන් කරන ලදී. තක්සේරුව මත පදනම්ව සමහර ණය ගැනුම්කරුවන් පළමු අදියර සිට දෙවන අදියර දක්වාත් සමහර ණය ගැතියන් දෙවන අදියර සිට තුන්වන අදියර දක්වා අපේක්ෂිත මුදල් ප්‍රවාහ දුර්වලතාවය හේතුවෙන් ගෙනයන ලදී.

### හිමිකම් වෙනස් වීම දක්වන ප්‍රකාශය - බැංකුව

| 2019-06-30 දිනෙන් අවසන් මාස හය සඳහා | ප්‍රකාශිත ප්‍රාග්ධනය / පවරන ලද ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | වෙනත් විස්තීරණ ආදායම් සංචිත | ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ සංචිතය | රඳවාගත් ඉපැයුම් | වෙනත් සංචිත | මුළු හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|
| **2019 ජනවාරි 01 වන දිනට ශේෂය** | **9,400,000** | **3,227,960** | **7,793,317** | **528,430** | - | **3,984,674** | **18,160,874** | **43,095,259** |
| SLFRS-16 යොදා ගැනීම මත වූ බලපෑම | - | - | - | - | - | (115,604) | - | (115,604) |
| **2019 ජනවාරි 01 දිනට නැවත අගයන ලද ශේෂය** | **9,400,000** | **3,227,960** | **7,793,317** | **528,430** | - | **3,869,070** | **18,160,874** | **42,979,655** |
| **කාලච්ඡේදය සඳහා මුළු විස්තීරණ ආදායම** | | | | | | | | |
| කාලච්ඡේදය සඳහා ශුද්ධ ලාභය | - | - | - | - | - | 2,293,097 | - | 2,293,097 |
| වෙනත් විස්තීරණ ආදයම් (බදු ගෙවූ පසු) | - | - | - | - | - | - | - | - |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ ණය උපකරණවල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් | - | - | - | 116,684 | - | - | - | 116,684 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ හිමිකම් උපකරණවල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් | - | - | - | (1,020,488) | - | - | - | (1,020,488) |
| **කාලච්ඡේදය සඳහා මුළු විස්තීරණ ආදායම** | - | - | - | **(903,804)** | - | **2,293,097** | - | **1,389,293** |
| **හිමිකමට සෘජුවම ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු** | | | | | | | | |
| හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරු කිරීම | - | - | - | - | - | - | (3,550) | (3,550) |
| ඒකාබද්ධ අරමුදලට දායකය - ලාභාංශ / විශේෂ බදු | - | - | - | - | - | - | - | - |
| ජාතික රක්ෂණ භාර අරමුදලට දායකය | - | - | - | - | - | (22,931) | - | (22,931) |
| කාලච්ඡේදය තුළ මාරු කිරීම් | - | 114,655 | - | - | - | (114,655) | - | - |
| **හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු** | - | **114,655** | - | - | - | **(137,586)** | **(3,550)** | **(26,481)** |
| **2019.06.30 දිනට ශේෂය** | **9,400,000** | **3,342,615** | **7,793,317** | **(375,374)** | - | **6,024,583** | **18,157,324** | **44,342,469** |

| 2020.06.30 දිනෙන් අවසන් මාස හය සඳහා | ප්‍රකාශිත ප්‍රාග්ධනය / පවරන ලද ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | වෙනත් විස්තීරණ ආදායම් සංචිත | ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ සංචිතය | රඳවාගත් ඉපැයුම් | වෙනත් සංචිත | මුළු හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|
| **2020 ජනවාරි 01 වන දිනට ශේෂය** | **9,400,000** | **3,562,872** | **7,793,317** | **318,006** | - | **4,464,442** | **18,838,685** | **44,377,324** |
| **කාලච්ඡේදය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | | | | | | | |
| කාලච්ඡේදය සඳහා ශුද්ධ ලාභය | - | - | - | - | - | 1,056,061 | - | 1,056,061 |
| වෙනත් විස්තීර්ණ ආදායම් (බදු ගෙවූ පසු) | - | - | - | - | - | - | - | - |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ ණය උපකරණවල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් | - | - | - | 302,192 | - | - | - | 302,192 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ හිමිකම් උපකරණවල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් | - | - | - | (953,831) | - | - | - | (953,831) |
| **කාලච්ඡේදය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | - | - | - | **(651,639)** | - | **1,056,061** | - | **404,422** |
| **හිමිකමට සෘජුවම ගලපන ලද හිමිකරුවන් සමඟ සිදුකළ ගනුදෙනු** | | | | | | | | |
| හිමිකම් නොපෑ තැන්පතු සංචිතයට මාරු කිරීම | - | - | - | - | - | - | (25,501) | (25,501) |
| ඒකාබද්ධ අරමුදලට දායකය - ලාභාංශ / විශේෂ බදු | - | - | - | - | - | (1,000,000) | - | (1,000,000) |
| ජාතික රක්ෂණ භාර අරමුදලට දායකය | - | - | - | - | - | (10,561) | - | (10,561) |
| කාලච්ඡේදය තුළ මාරු කිරීම් | - | 52,803 | - | - | - | (52,803) | - | - |
| **හිමිකම් දරන්නන් සමඟ සිදුකළ මුළු ගනුදෙනු** | - | 52,803 | - | - | - | (1,063,364) | (25,501) | (1,036,062) |
| **2020-06-30 දිනට ශේෂය** | 9,400,000 | 3,615,675 | 7,793,317 | (333,633) | - | 4,457,140 | 18,813,184 | 43,745,683 |

### හිමිකම් වෙනස් වීම දක්වන ප්‍රකාශය - සමූහය

| 2019-06-30 දිනෙන් අවසන් මාස හය සඳහා | ප්‍රකාශිත ප්‍රාග්ධනය / පවරන ලද ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිතය | වෙනත් විස්තීරණ ආදායම් සංචිත | ඉදිරි රැකුම් මුදල් ප්‍රවාහ සංචිතය | රඳවාගත් ඉපැයුම් | වෙනත් සංචිත | මුළු හිමිකම |
|---|---|---|---|---|---|---|---|---|
| **2019 ජනවාරි 01 වන දිනට ශේෂය** | **9,400,000** | **3,227,960** | **7,793,317** | **390,210** | - | **4,561,045** | **18,745,544** | **44,118,079** |
| SLFRS - 16 යොදා ගැනීම මත වූ බලපෑම | - | - | - | - | - | (115,604) | - | (115,604) |
| **2019 ජනවාරි 01 දිනට නැවත අගයන ලද ශේෂය** | **9,400,000** | **3,227,960** | **7,793,317** | **390,210** | - | **4,445,440** | **18,745,544** | **44,002,475** |
| **කාලච්ඡේදය සඳහා මුළු විස්තීරණ ආදායම** | | | | | | | | |
| කාලච්ඡේදය සඳහා ශුද්ධ ලාභය | - | - | - | - | - | 2,635,849 | - | 2,635,849 |
| වෙනත් විස්තීර්ණ ආදායම් (බදු ගෙවූ පසු) | - | - | - | - | - | (72) | - | (72) |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ ණය උපකරණවල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් | - | - | - | 192,746 | - | - | - | 192,746 |
| වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට නම් කළ හිමිකම් උපකරණවල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම් | - | - | - | (1,020,488) | - | - | - | (1,020,488) |
